# දෙසතිය

පුවත් සඟරාව

2025 අගෝස්තු

Patient Safety and
Quality Healthcare
for All A Century
of Dedication
1925 - 2025




# සුව සියවසක්

# Smart කානුව

ශ්‍රී ලංකාවේ ආචාර්ය නදීෂා චන්ද්‍රසේන සහ කණ්ඩායම විසින් නිර්මාණය කර, සංවර්ධනය කරන ලද ස්මාර්ට් ඩ්‍රේන් (Smart Drain) සඳහා බුද්ධිමය දේපළ, නවෝත්පාදනය සහ නිර්මාණශීලීත්වය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආයතනය වන ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) විසින් පවත්වන ලද 2025 WIPO සම්මාන උලෙළේ '2025 ලෝක බුද්ධිමය දේපළ සඳහා වූ ගෝලීය සම්මානය' හිමි වුණා.

මෙහිදී අවධානයට ගැනුණේ සෞඛ්‍ය, දේශගුණය, කෘෂි ආහාර, නිර්මාණාත්මක කර්මාන්ත සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රවල ලොව වෙනස්වන නවෝත්පාදන. 2025 ජූලි 11 දින ජිනීවාහිදී පැවති මේ සම්මාන උලෙළේදී WIPO සම්මාන ප්‍රදානය කරනු ලැබුවේ අධ්‍යක්ෂ ජනරාල් ඩැරන් ටැන්ග් විසින්. රටවල් 95ක අයදුම්කරුවන් 800කට අධික සංඛ්‍යාවක් අතරින් තෝරා ගන්නා ලද ජයග්‍රාහකයන් 10 දෙනා අතරට එක් වූ ආචාර්ය නදීෂා චන්ද්‍රසේන ඊට හිමි කුසලානය ලබා ගත්තේ පරිසර කාණ්ඩය යටතේ. මේ ජයග්‍රාහකයන් තෝරා ගැනු ලැබුවේ IP, නවෝත්පාදන, නිර්මාණාත්මක කර්මාන්ත, ආයෝජන සහ ව්‍යාපාර පිළිබඳ විශේෂඥතාවක් ඇති ස්වාධීන ජාත්‍යන්තර ජූරි සභාවක් විසින්. Smart Drain යනු කානු අපද්‍රව්‍යවලින් අවහිර වන විට නාගරික ගංවතුර වැළැක්වීම සඳහා නිර්මාණය කර ඇති ජල අපවහන පද්ධතියක්. එය කානු ජලයෙන් ඝන ද්‍රව්‍ය වෙන් කිරීමෙන් සහ බාධාවකින් තොර ව ක්‍රියාත්මක වීමට ඉඩ දීමෙන් කානු පිටාර ගැලීම වළක්වනවා.

**සමේලා රාජපක්ෂ**







# දෙසතිය
පුවත් සඟරාව

**වෙළුම 47, කලාපය 08,**
**2025 අගෝස්තු**

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කරණ මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීම - ප්‍රකාශන කාර්යාංශය
දු. අ. 011 - 2512759

උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**
47 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

මෙවර කවරයේ කතාව සම්බන්ධීකරණය කළේ
**දීප්ති විජේතුංග**
මාධ්‍ය ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## කවරයේ කතාව




20 **සුව සියවසක්**




03 **ගෙයක් සැබෑවක් වීම**



13 **Starlink ආගමනය**



15 **ගාසා සාගතය**



29 **ලෝකයේ මතකයට ගිය අපේ උරුම**



40 **උණුසුමේ උණුසුම**

දෙසතිය
පුවත් සඟරාව

# හෙටට පන්තියක්

ගෝලීය ප්‍රවණතාවලට ගැළපෙන පරිදි දේශීය පුරවැසියකු බිහි කිරීමට රටේ අධ්‍යාපනය සකස් වීම අත්‍යවශ්‍ය කරුණක්. මෙරටට නිදහස ලැබී දශක හතක් ඉක්මවා ගොස් තිබුණ ද එම අවශ්‍යතාව සැපිරී ඇත් ද යන පැනය හමුවේ නිරුත්තර වන සමාජ වටපිටාවක් නිර්මාණය වී ඇත්තේ කලක සිට.

වරින් වර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා ගෙන එමින් ඒ සඳහා උත්සාහ ගත් අවස්ථා බොහොමයි. එහෙත් යම් තරමකට ඒවා ක්‍රියාත්මක වෙමින්, නැවතත් යට යමින් සිදු ව ඇත්තේ පත් වන ආණ්ඩුවල මැතිවරණ පොරොන්දු පත්‍රිකාවල ලියැවී ඇති හුදු ලියවිලි බවට පත් වීම.

මේ තත්ත්වය වෙනස් වී රටේ අධ්‍යාපනය නව දිශානතියකට යොමු කරවීමේ වගකීම වත්මන් ආණ්ඩුව භාරගෙන ඇති බව පැවසෙනවා. ජනතාව ඒ පිළිබඳ සිය විශ්වාසය තබා ඇත්තේ 'යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය' පිළිබඳ සංවාදය නැවත කරළියට පැමිණ ඇති බැවින්.

යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවිය යුත්තේ විෂය මාලා සංවර්ධනයෙන් පමණක් නොව සමස්ත අධ්‍යාපන පද්ධතිය ම වෙනසකට භාජනය කිරීමෙන් බව එහි සමාලෝචන සහ ප්‍රතිසංවිධාන ක්‍රියාවලියේදී වත්මන් රජය හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා 01-06 ශ්‍රේණි සඳහා පමණක් නව ප්‍රතිසංස්කරණ සිදු කර 2029 වසරේදී 09 වැනි ශ්‍රේණිය සඳහා ඒවා ක්‍රියාත්මක කිරීමටයි තීරණය කර තිබෙන්නේ. ඒ, දිගුකාලීන හා අඛණ්ඩ ක්‍රියාවලියකින් මේ සඳහා ප්‍රවේශය ලබා ගත යුතු නිසා. එහිදී පෙළ පොත් වෙනුවට මොඩියුල ක්‍රමයට ස්වයං අධ්‍යයනයට ද දරුවන් යොමු කෙරෙනවා. එවිට විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ දරුවන් ඉගෙනීමට යොමු වන අතරේ ඔවුන් ඇගයීමට ද ලක් වීම මෙහි සුවිශේෂත්වයක්. මේ සඳහා කාලය අවශ්‍ය නිසයි එළඹෙන වසරේ සිට පන්ති කාමර කාලච්ඡේදයක් විනාඩි 40 සිට විනාඩි 50 දක්වා දීර්ඝ කෙරෙනු ඇත්තේ.

මෙවැනි පසුබිමක විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයට එහා ගිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සිදු වන නිසා ඒ ඔස්සේ ගුරු-සිසු සබඳතා ශක්තිමත් වන අතර ම සහකම්පනයෙන් යුතු ශික්ෂිත දරුවකු බිහි කිරීමට හැකි පරිසරයක් නිර්මාණය වනු ඇති. එයයි අධ්‍යාපනයෙන් අපේක්ෂා කළ යුතු විපුල ඵලය. එසේ ම 10-11 ශ්‍රේණිවලට ඉතිහාසය හා සෞන්දර්යය විෂය සහ වෘත්තීය අධ්‍යාපනය අනිවාර්ය කිරීම මෙන් ම මුල් ළමාවිය සංවර්ධනය සමස්ත අධ්‍යාපනයට සම්බන්ධ කිරීමත් සාධනීය කාරණා.

යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම කාලය ගත වන අඛණ්ඩ ක්‍රියාවලියක්. මේ පිළිබඳ නිලධාරීන්, දෙමාපිය, ගුරු, සිසු ආදී සෑම පාර්ශ්වයක් ම දැනුවත් විය යුතුයි. එබැවින් විෂයමාලා සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, ඇගයීම, මහජනතාව දැනුවත් කිරීම හා ප්‍රවර්ධනය යන ප්‍රධාන කුලුනු 5 යටතේ ක්‍රියාත්මක කෙරෙන මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අදහස් හා යෝජනා ලබා ගැනීම මේ දිනවල සිදු කෙරෙනවා. ඊට දායකවීමෙන් මහජනතාවට රටේ තීරණාත්මක සාධකයක් වන අධ්‍යාපනයට තම මැදිහත්වීම ලබා දිය හැකියි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යනු ජාතික අවශ්‍යතාවක්. අධ්‍යාපනය ලැබීම සෑම පුද්ගලයකුගේ ම අයිතියක්. ඒ සඳහා පසුබිම සකස් කිරීමයි බලධාරීන්ගේ වගකීම වන්නේ.

- සංස්කාරක -

දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..........
Address ..........
ID Number .......... Tel / Mobile ..........
Signature .......... Date..........

දෙසතිය සඟරා දයකත්වය

වාර්ෂික දයකත්වය රු. 1500.00
අර්ධ වාර්ෂික දයකත්වය රු. 750.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදළ බැංකු බැරපත හා සඟරා දයකත්ව කූපන්පත 071-9303111 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759

# ගෙයක් සැබෑවක් වීම



**ඩී. එන්. පී ඩයස්**

බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් පූනාගල, කබරගල කන්ද වතුයායේ නාය යාමෙන් නිවාස අහිමිවූ ජනතාවට නිවාස ලබාදීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් නොබෝදා (ජුනි 28) ආරම්භ වුණා. ඒ, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සහ වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ නිවාස අහිමි වූ පවුල් 51ක් වෙනුවෙන්. මෙහි ඉදිකිරීම් සිදු වන්නේ යුද හමුදාවේ ද දායකත්වයෙන්.

එම ප්‍රදේශයේ පැරණි තේ කර්මාන්ත ශාලාවේ පදිංචි කරවන ලද අවතැන් වූ පිරිස එහි රඳවා සිටියේ වසර 2½ක පමණ කාලයක්. මේ නිසා ඔවුන්ගේ නිවාස සිහිනය සැබෑ කර ගැනීමට වත්මන් රජය ඇරඹූ මේ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් විශේෂයෙන් නිවාස අහිමිවූවන් සිය අදහස් පළ කරන්නේ කෘතඥතා පූර්වක ව.

බදුල්ල දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15හි ම නාය යාමේ අවදානම පවතින බවයි බදුල්ල දිස්ත්‍රික් ප්‍රධාන භූ විද්‍යාඥ හර්ෂනී පෙරේරා පවසන්නේ. ඒ අනුව බදුල්ල, හල්දුම්මුල්ල, මහියංගනය, රිදීමාලියද්ද, හාලිඇල, බණ්ඩාරවෙල, ඇල්ල, හපුතලේ, කන්දෙකැටිය, සොරනාතොට, මීගහකිවුල, පස්සර, ලුණුගල, වැලිමඩ, ඌව පරණගම මේ අවදානම පවතිනවා. විශේෂයෙන් ඊසාන දිග මෝසම් පවතින සැප්තැම්බර් සිට මාර්තු-අප්‍රේල් දක්වා කාලයේ බදුල්ල දිස්ත්‍රික්කයේ අධික වැසි පවතින අතර ඒ හේතුවෙන් පසුගිය වසර 04ක පමණ සිට බෑවුම් සහිත ප්‍රදේශවල විශාල නාය යාම් සිදු වී තිබෙනවා. මේ නිසා එම ප්‍රදේශවල ජනතාවට නිරන්තර අවධානයෙන් සිටින ලෙස පූර්ව අනතුරු ඇඟවීම් සිදු කර ඇති බවත් භූ විද්‍යාඥ හර්ෂනී පෙරේරා අවධාරණය කරන කරුණක්.

හල්දුම්මුල්ල ප්‍රදේශීය ලේකම් කේ. ඒ. ජේ. ප්‍රියංගිකා සඳහන් කරන්නේ නාය යාම්වලින් නිවාස අහිමිවූ ජනතාවට නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ ඉදි කෙරෙන මේ නිවසක ඇස්තමේන්තුගත මුදල රුපියල් ලක්ෂ 28ක් වන බව. යටිතල පහසුකම් සඳහා රුපියල් ලක්ෂ 04ක් වශයෙන් නිවසක මුළු වියදම වන්නේ රුපියල් ලක්ෂ 32ක්. ඉඩමේ වටිනාකම හා ප්‍රදේශයේ වටිනාකම අනුව මෙහි වටිනාකම රුපියල් ලක්ෂ 100කට අධික වනවා.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය සමන්ත විද්‍යාරත්න පවසන ආකාරයට පසුගිය කාලයේ සෑම ආණ්ඩුවක් ම මැතිවරණ කාලයේදී නිවාස අහිමි වූ මේ ජනතාවට පොරොන්දු ලබා දී තිබෙනවා. එහෙත් ඒ සියල්ල සිහිනයක් පමණක් වූ බවටයි කබරගල වතුයායේ ජනහඬ නැඟෙන්නේ. ඔවුන්ට මෙතෙක් නිවසට ලිපිනයක් තිබී නැහැ. ලිපි ලැබුණේ වතු අධිකාරී නමට. එම ජනතාවට ලිපිනයක් ලබා දීමටත් මේ ව්‍යාපෘතිය යටතේ සැලසුම් කර තිබෙනවා.

මේ අයුරින් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමෙන් නිවාස අහිමි වූ ජනතාවගේ නිවාස සිහිනය සැබෑ වී ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් වන දිනය වැඩි ඈතක නොවනු ඇති බවට අපේක්ෂා තබා ගත හැකියි. ඒ, වසර 2½ක පමණ කාලයක් තමන්ගේ ම නිවසක් ඉදිකර ගැනීම වෙනුවෙන් මැවූ සිහිනය යථාර්ථයක් වීමේ මූලික පියවර රජය තබා ඇති බැවින්.





# වනස්පති

රංගිකා අබේසේකර

රක්ෂිත වනාන්තරයක් යනු වනාන්තර ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා නම් කරන ලද ප්‍රදේශයක්. බොහෝ විට එය ජෛව විවිධත්වය සහ ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම සඳහා යම් යම් ක්‍රියාකාරකම් සීමා කෙරෙන ආරක්ෂිත ප්‍රදේශයක්. මෙරට කාලගුණික, දේශගුණික තත්ත්ව සහ ස්වාභාවික ආපදා වැළැක්වීම සඳහා හඳුනාගත් ප්‍රදේශ වන මේවා සංවේදී කලාප ලෙස සැලකෙනවා.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය කෙරෙන රජයේ වනාන්තර 'රක්ෂිත වනාන්තර' ලෙස ප්‍රකාශයට පත් කර ඒවා තිරසර කළමනාකරණයට ලක් කර අනාගත පරපුර වෙනුවෙන් සුරක්ෂිත කිරීමේ 'වනස්පති' ජාතික වැඩසටහන නොබෝද (ජූලි 15) ඇරඹුණේ ගම්පහ බජ්ජන්ගොඩ රක්ෂිත වනාන්තර එළිමහන් රංග පීඨයේදී. මේ කාර්යයේදී රක්ෂිත වනාන්තර ලෙස ප්‍රකාශයට පත් කළේ මෙරට වනාන්තර 16ක්. මොණරාගල දිස්ත්‍රික්කයේ වනාන්තර 10ක්, අම්පාර දිස්ත්‍රික්කයේ වනාන්තර 04ක් සහ  මහනුවර දිස්ත්‍රික්කයේ වනාන්තර 02ක් වශයෙන් වූ මේ රක්ෂිත 16 අතරින් සැලකිය යුතු සංඛ්‍යාවක් වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර වන අතර සවානා වනාන්තර, තෙත් සදාහරිත වනාන්තර සහ කඩොලාන වනාන්තරයක් ද ඊට අයත්.

'වනස්පති' ජාතික වැඩසටහනට සමගාමී ව 2025 වසරේ ජගත් කඩොලාන සුරැකීමේ දිනය නිමිත්තෙන් මෙරට කඩොලාන වනාන්තර 08ක් ද රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කෙරුණා. ඒ, පුත්තලම දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් හලාවත අඩවි වන කාර්යාලයට අයත් මාදම්පෙ පනිරෙන්ඩාව මරම්බැට්ටිය මූකලාන, මාදම්පෙ පනිරෙන්ඩාව වවුල්කැලේ, හලාවත මැරවල C, මැරවල B, මැරවල A, හලාවත කාකකපල්ලිය මැරවල, ආරච්චිකට්ටුව කුසල සහ ආරච්චිකට්ටුව කරුකපනේ B යන කඩොලාන වනාන්තර.

පරිසර අමාත්‍යාංශ ලේකම් කේ. ආර් උඩුවාවල සඳහන් කරන්නේ වනාන්තර රක්ෂිත බවට පත් කර ආරක්ෂා කර ගැනීම 'වනස්පති' ජාතික වැඩසටහනේ මූලික අරමුණ වන බව. ජාතික මෙන් ම ජාත්‍යන්තර වශයෙන් මෙය ඉතා වැදගත්. දේශගුණ විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේදී කථිකාවට ලක්වන ප්‍රධාන මාතෘකා 16න් 'වන සංරක්ෂණය' ප්‍රමුඛ වූවක්. ශ්‍රී ලංකාවේ වන ගහනය 2030 වසර වන විට 29% සිට 32%ක් දක්වා වර්ධනය කර ගැනීමටනම් වනාන්තර ආරක්ෂා කරගැනීමේ ක්‍රමවේදයක් සැකසිය යුතු බව ලේකම්වරයා අවධාරණය කරනවා.

ශ්‍රී ලංකාවේ 'වන ක්ෂේත්‍ර' ප්‍රතිපත්තියේ ප්‍රධාන ක්ෂේත්‍ර 3ක් තිබෙනවා. වනාන්තර තිරසර ලෙස කළමනාකරණය එක් ක්ෂේත්‍රයක්. එම ප්‍රතිපත්තිය යටතේ වනාන්තර වර්ගීකරණය කරනවා. රක්ෂිත වනාන්තර, සංරක්ෂිත වනාන්තර, ගම්බද වනාන්තර, වෙනත් වනාන්තර සහ රජයේ කැළෑ ලෙසයි ඒවා නම් කෙරෙන්නේ. මෙරට රක්ෂිත හා සංරක්ෂිත ලෙස වනාන්තර 910ක් ප්‍රකාශයට පත් කර තිබීම විශේෂත්වයක්. ඒවායෙහි භූමි ප්‍රමාණය හෙක්ටයාර් ලක්ෂ 13ක් පමණ වනවා. 2030 වසර වන විට 32%ක් දක්වා වනාන්තර වර්ධනය කරමින් යන ඉලක්කයේ තව තවත් වනාන්තර සංරක්ෂණය කළ යුතු බවයි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සංරක්ෂක ජනරාල් එස්. සී පාලමකුඹුර සඳහන් කරන්නේ.

2025 වසරේ ජූනි 05 ජගත් පරිසර දිනය සැමරීම නිමිති කරගෙන වනාන්තර 5ක් රක්ෂිත ලෙස ගැසට් කර ප්‍රකාශයට පත්කර ආරක්ෂා කිරීමේ වැඩපිළිවෙළට මුලපිරුවා. එහි දිගුවක් ලෙස 'වනස්පති' වැඩසටහන ආරම්භ කරන බවත් වාර්ෂික සැලැස්මකට වඩා මෙය දිගුකාලීන සැලැස්මක් බවත් පරිසර අමාත්‍ය වෛද්‍ය ධම්මික පටබැඳි සඳහන් කරනවා.

රක්ෂිත ලෙස වනාන්තර නම් කිරීමේදී සාමාන්‍ය ජනතාවගේ ඉඩම් හෝ කර්මාන්ත සඳහා වෙන් කර ඇති ඉඩම් අත්කර ගැනීමට හෝ විශේෂයෙන් ජෛව විවිධත්වය විනාශ කරමින් කර්මාන්ත සංවර්ධනයට රජයේ කිසිසේත් ම මැදිහත්වීමක් මෙහිදී සිදු වන්නේ නැහැ. වනාන්තරවල භූමිය සහ මායිම් සම්බන්ධයෙන් අදහස් දක්වන වන සංරක්ෂක ජනරාල් එස්.සී පාලමකුඹුර; "දීර්ඝකාලීන ව ජනතාව විසින් අනවසරයෙන් විවිධ වගා සිදු කරනු ලැබූ ඉඩම්වලින්

**රක්ෂිත වනාන්තර බවට පත් කළ සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙක්ටයාර 5,711.75**

විශාල ප්‍රමාණයක් 2023 වසරේ සිට දෙපාර්තමේන්තුවේ පාලනයට ගෙන, විශාල භූමියක වන වගා සිදු කර තිබෙනවා. ඒ, නඩත්තු කිරීම් ද සමග. වනාන්තර ලෙස කළමනාකරණය කිරීමට නොහැකි භූමි හඳුනාගෙන ඒ භූමි කොටස් ඉඩම් කොමසාරිස් වෙත නිදහස් කිරීමටත් පියවර ගන්නවා. මේ ක්‍රියාවලිය ඔස්සේ නැවත නැවත කැළෑ එළි කිරීම් සිදු නොවනු ඇති”.

ශ්‍රී ලංකාව ජෛව විවිධත්ව සනත්වයෙන් ඉහළින් ම සිටින රටක්. මෙරට සත්ත්ව සහ ශාක විවිධත්වය 4000කට වඩා ඉහළ අගයක් ගන්නවා. වනාන්තර විනාශ වීම යනු ජෛව විවිධත්වය විනාශ වීමක්. 2012 වසරේ The Tropical rainforest වාර්තාවට අනුව ශ්‍රී ලංකාවට හෙක්ටයාර 14,428ක වන වැස්මක් අහිමි වී තිබෙනවා. එය 2011 වසරේ හෙක්ටයාර 3,760ක් වූ වන විනාශයට සාපේක්ෂ ව විශාල වර්ධනයක්. 1942 වසරට පෙර හග්ගල, යාල සහ රිටිගල යනුවෙන් ලංකාවේ දැඩි ස්වාභාවික රක්ෂිත 3ක් නම් කර තිබෙනවා. ඊට පසු මෙරට දැඩි ස්වාභාවික රක්ෂිත නම් කර නැහැ. එහෙත් ජල පෝෂක ඉහළ කඳු මුදුන් දැඩි ස්වාභාවික රක්ෂිත කිරීමේ අවශ්‍යතාව පෙරට වඩා වර්තමානයේ මතු ව තිබෙනවා.

පරිසරය ආර්ථිකය සමග බද්ධ වූවක්. ලෝකය කතා කරමින් සිටින්නේ හරිත ආර්ථිකයක් පිළිබඳ (Green Economic) ව. හරිත ආර්ථිකයක ප්‍රධානතම ලක්ෂණය වන්නේ කාබන් තිර කර තිබෙනවාද? ජෛව විවිධත්වය සහිත රක්ෂිත කොපමණ සංඛ්‍යාවක් ස්ථාපිත කර තිබෙනවාද? යන්න. ඒ පිළිබඳ අප අවධානය යොමු කළ යුතු වනවා.

අදහස් දක්වන එස්. සී පාලමකුඹුර; “වනස්පති” වැඩසටහන යටතේ වනාන්තර 16 ම ප්‍රකාශයට පත් කෙරෙන්නේ රක්ෂිත වනාන්තර ලෙස. නෛතිකමය වශයෙන් රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරු ව මහජනතාවට සැලසෙන ප්‍රතිලාභ මෙන් ම වනාන්තර ආරක්ෂා කර ගැනීම මෙහි ප්‍රධාන අරමුණු 2ක්. මේ වනාන්තරවල ජෛව විවිධත්වය, ඒවාට ම අනන්‍ය වූ ජාන සම්පත් තිබෙන අතර ම දුර්ලභ වඳවී යන ශාක මෙන් ම සත්ත්වයන් වාසය කරනවා. ඊට අමතර ව පස සහ ජලය සුරක්ෂිත කිරීම අත්‍යවශ්‍ය කාරණාවක්. මහජනතාවට මෙයින් ප්‍රතිලාභ ලබා දෙන්නේ කෙසේද යන්න පිළිබඳ කළමනාකරණ සැලසුම් සකස් කරනවා.”

එහිදී නිර්මාණය වන්නේ වනාන්තරවලට ඇතුළු වීම වැනි ජනතාවට ප්‍රතිලාභ හිමිවන අවස්ථා සඳහා නිත්‍යානුකූල පසුබිමක්. කළමනාකරණ සැලසුම්වල අඩංගු වන පරිදි ගාස්තු ගෙවීමකින් ජනතාවට ප්‍රතිලාභ ලබා ගැනීමට අවකාශ තිබෙනවා. ඒ, විශේෂයෙන් වනාන්තරවලට ඇතුළු වීම, දර ලබා ගැනීම, වාණිජ ද්‍රව්‍ය ලබා ගැනීම වැනි කාරණාවලදී ග්‍රාමීය ප්‍රජාවත් සමග ගිවිසුම්ගතවීමෙන්. වනාන්තර ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් නීතිමය බැඳීමක් රජයට තිබෙනවා. අනෙක් පසින් ප්‍රජාවට වරප්‍රසාද භුක්ති විඳීමට හැකියාව තිබෙනවා. මේ වනාන්තර 16 ගැසට් කිරීමෙන් පසුව වනාන්තරවල මායිම් සම්බන්ධ ගැටලු විසඳීමට බලාපොරොත්තු වන බවයි එස්. සී පාලමකුඹුර සඳහන් කරන්නේ.

පරිසරවේදීන්ට සහ විද්‍යාඥයන්ට අනුව ශාක සහ සත්ත්ව කොට්ඨාසවලින් සිදුකෙරෙන කාර්ය නිසි ලෙස තව ම හඳුනාගෙන නැහැ. මේ පිළිබඳ පර්යේෂණ සිදු කළ යුතු වනවා. සංරක්ෂණ ක්‍රියාවලියේදී සතුන්ගේ ඇති වැදගත්කම සහ ජානවල ඇති වැදගත්කම නිශ්චිත ලෙස නිර්ණය කර නැහැ. එලෙස නිර්ණය කරමින් පරිසරය සංරක්ෂණය කරමින් එය සංචාරක කර්මාන්තය සඳහා යොදා ගනිමින් ආර්ථිකය ගොඩනැගීමට අවශ්‍යයි. සංවර්ධනයේදී පාරිසරික ගැටලු හඳුනාගෙන පරිසර මිතුරු සංවර්ධනයක් කරා යාම වඩා වැදගත්. ‘වනස්පති’ ජාතික වැඩසටහන යටතේ වන මේ නව ක්‍රියාදාමය ආර්ථිකයට මෙන් ම පාරිසරික ගැටලුවලට ද විසඳුමක් වනු ඇති.

මෑත කාලයේ සිදුවන වන විනාශයෙන් පාරිසරික සමතුලිතතාව බිඳ වැටීම නිසා මෙරට ජනතාව ප්‍රශ්න ගණනාවකට මුහුණදෙමින් සිටිනවා. විශේෂයෙන් අලි මිනිස් ගැටුම්, වන සතුන් අස්වනුවලට හානි සිදු කිරීම සහ නායයෑම්, ගංවතුර ඇතුළු ස්වාභාවික විපත් ඒ අතරට අයත්. වනාන්තර රක්ෂිත කර ගැනීමේ වැඩපිළිවෙළ යටතේ ඒ ගැටලුවලට ද විසඳුම් ලැබෙනු ඇති. ගෝලීය උණුසුම (Global Warming) ඉහළ යමින් තිබෙනවා. මේ තත්ත්වය පාලනය කිරීමටත් වනාන්තර රක්ෂිත කිරීමේ වැඩපිළිවෙළ උපකාරී වනු ඇති.


(රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවැති මාධ්‍ය සාකච්ඡාවක් ඇසුරින්)

| | ස්ථානය | භූමි ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|---|
| | මහනුවර දිස්ත්‍රික්කය | |
| 01 | රිලාගල | 515.2145 |
| 02 | රජගල | 398.03 |
| | මොණරාගල දිස්ත්‍රික්කය | |
| 03 | පොරමැඩිල්ල | 126.7 |
| 04 | කන්දේයාය | 450.147 |
| 05 | වැලිආර රජයේ වනය | 1534.4 |
| 06 | කුඩාගොඩකන්ද | 23.08 |
| 07 | වන්තිබ්බාගොඩ | 205.1 |
| 08 | ආගරේ | 224.5 |
| 09 | වෙහෙරගල | 28.82 |
| 10 | මිල්ලකැලෙ | 29.4 |
| 11 | බණ්ඩාරවාඩිය | 50.7 |
| 12 | අඹාත්තාහෙල | 716.08 |
| | අම්පාර දිස්ත්‍රික්කය | |
| 13 | කරංගාව | 381 |
| 14 | පානම උතුර | 832.46 |
| 15 | බදුලුගොඩ | 82.6 |
| 16 | පාලංකුඩා කඩොලාන වනාන්තරය | 113.52 |
| සම්පූර්ණ භූමි ප්‍රමාණය | | 5,711.75 |

මූලාශ්‍රය: වන සංරක්ෂණ දෙපාර්තමේනතුව - පරිසර අමාත්‍යාංශය 2025

# පොස්පේට් පුනරුදය

මාලා මල්කාන්ති පරණගමගේ



'එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ත ලෙස භාවිත කර ගනිමින් පෝෂ්‍යදායී පොස්පරස්වලින් මාතෘභූමිය සාරවත් පසකින් සාරවත් කිරීම' යන දැක්ම ඔස්සේ 'පරිසර හිතකාමී සහ නව ක්‍රමවේද ඔස්සේ පොස්පරස්වලින් ස්වයංපෝෂිත වෙමින් ජාතික පොස්පේට් අවශ්‍යතාව සැපිරීම' මෙහෙවර කර ගත් වර්තමානයේ පූර්ණ රාජ්‍ය සමාගමක් ලෙස ක්‍රියාත්මක වන සීමාසහිත ලංකා පොස්පේට් සමාගම (Lanka Phosphate Limited) සිංගල් සුපර් පොස්පේට් නිෂ්පාදනයට සැලසුම් කර තිබෙනවා. ඒ, 2025 අගෝස්තු මාසයේ සිට. දැනට පොස්පේට් නිධිය මෙරට පොහොර නිෂ්පාදකයන්ට ලබා දෙන්නේ අමුද්‍රව්‍යයක් ලෙස. එහෙත් අගය එකතු කරමින් සිදු වන මේ නිෂ්පාදන ක්‍රියාවලියෙන් වාර්ෂික ව සුපර් පොස්පේට් ආනයනය සඳහා රජය වැය කරන ඩොලර් ඉතුරු කර ගත හැකි වීම ඉතා වාසිදයක තත්ත්වයක්.

පළමු වරට එප්පාවල පොස්පේට් නිධිය පිළිබඳ තොරතුරු සොයාගන්නා ලද්දේ 1971 වසරේදී භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්. 1978 වසර වන විට රාජ්‍ය මිනිරන් සංස්ථාව සහ International Fertilizer Development Center සමග නිෂ්පාදන පිළිබඳ පරීක්ෂණ ආරම්භ කර තිබෙනවා. 1982 වසර වන තෙක් රාජ්‍ය පතල් කැණීම් සහ ඛනිජ සංවර්ධන සංස්ථාව ලෙස වැඩ පවත්වාගෙන යන ලද මෙය 1982 වසරේ ඇති කරගත් එකඟතාවක් අනුව කාර්ය ආරම්භ කර තිබෙන්නේ එප්පාවල



පොස්පේට් ලිමිටඩ් ලෙස. එම ක්‍රියාවලිය 1984 වන විට අවසන් වී තිබෙනවා.

1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1992 ජූලි මස 10 දින පූර්ණ රාජ්‍ය සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලංකා පොස්පේට්ස් සමාගම 1992 වසරේදී රජය විසින් කැණීම් සඳහා ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවන ලද අතර 1993 වසරේදී Freeport McMoran සමාගම එහිදී තෝරා ගැනෙනවා. මේ අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 'සාර භූමි' නමින් ලංකා පොස්පේට් ආයතනය සහ ජාත්‍යන්තර ආයතන සමග ඒකාබද්ධ ප්‍රවේශයක් ආරම්භ කරන ලද බවත් 2000 වසරේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ FR Case No 884/99 මගින් ලබා දුන් නියෝගය අනුව එම ක්‍රියාවලිය නතර වූ බවත් ආයතනගත තොරතුරුවල සඳහන්.

භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය සිදු කරන ලද නවතම සමීක්ෂණ අනුව මේ පොස්පේට් නිධිය ආසන්න වශයෙන් වර්ග කිලෝමීටර් 04ක භූමි ප්‍රදේශයක පැතිරී තිබෙනවා. මෙට්‍රික් ටොන් මිලියන 30ක් පමණ වන මේ සංචිතයෙන් කැණීම් සිදු කර තිබෙන්නේ 3%-5%ත් අතර ප්‍රමාණයක්.

සේවකයන් 299ක් පමණ සිටින මෙහි වර්ෂයකදී එප්පාවල රොක් පොස්පේට් මෙට්‍රික් ටොන් 50,000කට ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය කරනවා. ලංකා පොස්පේට් සමාගමේ වත්මන් සභාපති එන්. පී. එස්. ආනන්ද ප්‍රේමකුමාර සඳහන් කරන්නේ රාජ්‍ය භාගය ලෙස රුපියල් මිලියන 150කට වැඩි බදු, රුපියල් මිලියන 300ක පමණ සේවක වැටුප් ගෙවූ පසු 2024 වර්ෂයේදී රුපියල් මිලියන 350කට වැඩි ශුද්ධ ලාභයක් ලබා ගැනීමට සමාගම සමත් වී ඇති බව.

සහකාර ක්ෂේත්‍ර නිලධාරි නවරත්න පවසන ආකාරයට ලංකා පොස්පේට් සමාගම කැණීම් කරන රොක් පොස්පේට්, උතුරු නිධිය සහ දකුණු විධිය ලෙස දෙයාකාර වනවා. මෙහි නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ අදහස් දක්වන ඔහු; "උතුරු නිධියේ වපසරිය හෙක්ටයාර 5.5ක්. මෙහි පාෂාණවල **Phosphorus pentoxide** ($P_2O_5$) විවිධ අගයන්



සභාපති
**එන්. පී. එස්. ආනන්ද ප්‍රේමකුමාර**

ගන්නවා. ඒ, 8%-18 දක්වා මෙන් ම 30%-32% අතර ප්‍රමාණ වශයෙන්. හෙක්ටයාර 09කින් පමණ සමන්විත දකුණු නිධියේ පාෂාණවල **Phosphorus pentoxide** ($P_2O_5$) 28%-40% දක්වා ප්‍රමාණ තිබෙනවා. උතුරු සහ දකුණු නිධියේ පොස්පේට් ප්‍රතිශතය අනුව 28% සහිත එප්පාවෙල රොක් පොස්පේට් (ERP) සහ 38% සහිත අධි ශ්‍රේණියේ එප්පාවෙල රොක් පොස්පේට් (HERP) කාණ්ඩ දෙක යටතේ ප්‍රධාන පොහොර වර්ග දෙකක් නිෂ්පාදනය කරනවා. ඒ, 28% සහ 38% ලෙස සකස් කර ගන්නා පාෂාණ මිලිමීටර් 30ට පරිවර්තනය කර ඇඹරුම් අංශයේ මයික්‍රෝන 150කට අඹරා වෙන වෙන ම කිලෝග්‍රෑම් 50 බෑග්වලට ඇසිරීමෙන්. ආයතනය හඳුනාගත් ගැනුම්කරුවන් විසින් මේ පොහොර වර්ග දෙක මිශ්‍ර පොහොර බවට පත් කරනවා."

ලංකා පොස්පේට් සමාගම වර්තමානයේදී මුහුණදෙන ගැටලු රාශියක් හඳුනාගෙන තිබෙනවා. රොක් පොස්පේට්වල ජලයේ ද්‍රාව්‍යතාව අඩු නිසා කෙටිකාලීන බෝගවලට භාවිත කළ නොහැකි වීම, සමීක්ෂණ වාර්තා පිළිබඳ පවතින ව්‍යාකූලතා, නිධිය සතු භූමිය සිතියම්ගත කර නොතිබීම සහ බාහිර පුද්ගලයන් විසින් එය අක්‍රමණය කිරීම මෙහිදී කැපී පෙනෙනවා. නිෂ්පාදන ක්‍රියාවලියේදී ශ්‍රම සූක්ෂ්මතාව අඩු නිසා අධික නිෂ්පාදන වියදමක් දැරීමට සිදු වීම ප්‍රධාන ගැටලුවක්. කැණීම් බලපත්‍ර, ප්‍රවාහන බලපත්‍ර සහ ඉඩම්වල අයිතිය පිළිබඳ ගැටලු ද පවතිනවා. සමාගමක් ලෙස ක්‍රියා කිරීමේදී ඉක්මන් තීරණ ගැනීමට රාජ්‍ය ආයතනවලින් ඇති වන බාධා සහ ප්‍රමාදවීම් මූලික ගැටලුවක් ලෙස ඔවුන් හඳුනාගෙන තිබෙනවා. යන්ත්‍ර සහ නවීන තාක්ෂණික මෙවලම්වල කාර්යක්ෂමතාව අඩු අතර නිෂ්පාදන ක්‍රියාවලියට නව තාක්ෂණය භාවිත කර නොගැනීමත් ගැටලුවක්.

ලංකා පොස්පේට්ස් සමාගම ආයතනික ඉලක්ක සපුරා ගැනීමට ඉදිරි සැලසුම් සකස් කර තිබෙනවා. එහිදී සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සහ සේවකයන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, නව නිෂ්පාදන අවශ්‍යතාවට සරිලන ලෙස කර්මාන්ත පරිශ්‍රය සංවර්ධනය සහ පුළුල් කිරීම සමාගමේ ප්‍රමුඛ අවශ්‍යතාවක්. නිෂ්පාදනය විවිධාංගිකරණයෙන් නව නිෂ්පාදන පෙළක් හඳුන්වාදීමත් ඉදිරි සැලසුමක්. ඒ යටතේ SSP නිෂ්පාදනය, බහු වාර්ෂික භෝග සඳහා පොහොර මිශ්‍රණ සකස් කිරීම, සත්ත්ව ආහාර සඳහා භාවිත කළ හැකි ඩයිකැල්සියම් පොස්පේට් නිෂ්පාදනය, කාබනික කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සිදු වනු ඇති. එකඟතාව අනුව අගය එකතු කරන ලද පොහොර අපනයනයත් මෙහි ඉදිරි සැලසුමක්.

එප්පාවල පොස්පේට් නිධිය සම්බන්ධයෙන් පර්යේෂණ ද සිදු කෙරෙනවා. විශේෂයෙන් විශ්වවිද්‍යාල මට්ටමෙන් ඒ සඳහා ලැබෙන සහය අගය කළ යුත්තක්. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ජේ. ඩී. ටී. මධුශංඛ පවසන්නේ කර්මාන්තය ආශ්‍රිත ව තිබෙන නව විභවතා, ආර්ථික වටිනාකම් සහ භාවිත හඳුනා ගැනීම, සැපයුම් දම හා මෙහෙයුම් කළමනාකරණය, නව නිෂ්පාදන කරා යාමට තිබෙන හැකියාව මෙන් ම වටිනාකම් එකතු කිරීමේ ක්‍රියාවලිය ඔස්සේ නව නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම පිළිබඳවත් පර්යේෂණ සිදු කරමින් සිටින බව. අදහස් දක්වන ඔහු; "ලංකා පොස්පේට්ස් සමාගම සමග එක් ව නිෂ්පාදන ක්‍රියාවලියට ලබා දිය හැකි ප්‍රතිදාන, හඳුනාගත හැකි නව වෙළෙඳපොළ අවස්ථා, මේ ඛණිජය භාවිත කළ හැකි විකල්ප ප්‍රයෝජන, කෘෂිකාර්මික

ක්ෂේත්‍රයේ විවිධ අදියරවලට බණිජය භාවිත කළ හැකි තත්ත්ව මොනවාද?, මේ බණිජයට නිෂ්පාදන විවිධාංගීකරණය හැකියාවක් තිබේද?, වටිනාකම් දමය තාක්ෂණයෙන් ශක්තිමත් කළ හැකිද?, තාක්ෂණ පීඨයේ සහයෝගය ඇති ව නව්‍ය තාක්ෂණය මේ ක්‍රියාවලියට එක් කරන්නේ කෙසේද යන්න පර්යේෂණවල විද්‍යාර්ථීන් නියැළෙනවා. එයින් අවස්ථා බොහෝ නිර්මාණය වනු ඇතැයි මා විශ්වාස කරනවා.”

සභාපති එන්. පී. එස්. ආනන්ද ප්‍රේමකුමාර පවසන්නේ රාජ්‍ය ව්‍යවසායක් ලෙස මේ ආයතනය ගැන තිබුණු නරක මතවාදය ඉවත් කර කාර්යක්ෂම රාජ්‍ය ව්‍යවසායක් බවට පත්කිරීම තමන් මුහුණ දුන් ප්‍රමුඛතම අභියෝගය බව. ඒ පිළිබඳ අදහස් දක්වන සභාපතිවරයා; “මේ ජාතික සම්පත කළමනාකරණය ජාතික වගකීමක්. පැවති දේශපාලන බලවේග හමුවේ එය ඉටු වී නැහැ. දැනුම, තාක්ෂණය, මූල්‍ය ශක්තිය සැපිරී නැති නිසා ආයතනය තිබෙන්නේ පසුගාමී මට්ටමක. ආයතනයේ ඉලක්ක කරා යන කාර්ය මණ්ඩලයක් සිටියේ නැහැ. ඒ නිසා එම අවශ්‍යතා සපුරා ගත යුතු වුණා. තීන්දු ගත හැකි අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කිරීම මෙන් ම ආයතනයේ සහයෝගිතාව ඇති කරමින් ආකල්ප වෙනසක් ද ඇති කළා.

2024 වසරේ සාමාන්‍ය නිෂ්පාදන ඉලක්කය වුණේ මෙට්‍රික් ටොන් 50,000කට අඩු ප්‍රමාණයක්. එය දෙගුණයකින් වැඩි කිරීමට සැලසුම් කර තිබෙනවා.˜


නිෂ්පාදන විවිධාංගීකරණයක් ඇති කිරීම ලංකා පොස්පේට්ස් සමාගමේ ප්‍රමුඛ ඉලක්කයක්. වර්ෂයකට ශ්‍රී ලංකාවට පොස්පරස් පොහොර ආනයනය සඳහා වැය වෙනවා ඩොලර් මිලියන 100ක පමණ මුදලක්. මේ මුදල ඉතුරු කළ හැකියි පොස්පේට් සඳහා අගය එකතු කර සිංගල් සුපර් පොස්පේට් නිෂ්පාදනය කළහොත්. සභාපති එන්. පී. එස්. ආනන්ද ප්‍රේමකුමාර; “සිංගල් සුපර් පොස්පේට් නිෂ්පාදනය සඳහා තාක්ෂණය, දැනුම, මූල්‍ය ශක්තිය අවශ්‍යයි. ඊට ව්‍යවසායකයකු අවශ්‍ය නිසා ආයෝජකයන් සොයා ගැනීමට අදාළ අභිලාෂ පත්‍ර නිකුත් කර තිබෙනවා. එය ප්‍රමාද වන නිසා ලන්කෙම් ආයතනය සමඟ එක් ව මෙට්‍රික් ටොන් 50,000ක අමුද්‍රව්‍ය ලබා දී සිංගල් පොස්පේට් නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙනවා. 2026 වසරේ ජනවාරි-පෙබරවාරි වන විට ගොවියන්ගේ එම පොහොර ඉල්ලුම සපුරාලීමට හැකියි. රජයේ අවසරය ඇති ව අපනයනය සඳහා යොමු වීමටත් අපෙක්ෂා කරනවා. තේ, පොල්, රබර් ඇතුළු බහු වාර්ෂික බෝග සඳහා අවශ්‍ය පොහොර නිෂ්පාදනය කර අගෝස්තු මාසය වන විට වෙළෙඳපාළට නිකුත් කිරීමත් අපේක්ෂාවක්. කුකුළු ආහාර නිෂ්පාදනයට අවශ්‍ය කරන සත්ත්ව ආහාර සැපයුමක් වන ඩයිකැල්සියම් පොස්පේට් සංයෝගය නිෂ්පාදනය සඳහා පර්යේෂණයක් ආරම්භ කළා වයඹ විශ්වවිද්‍යාලයේ කණ්ඩායමක්. එය සාර්ථක වුණා. අගෝස්තු වන විට එයත් නිෂ්පාදනය කර වෙළෙපොළට නිකුත් කරනවා. ඒ අනුව ආනයනය කරන ඩයිකැල්සියම් පොස්පේට් මෙට්‍රික් ටොන් 16000 වෙනුවට නිෂ්පාදනය කර ඩොලර් ඉපයීමට අපේක්ෂා කරනවා.”

මේ අනුව ලංකා පොස්පේට්ස් සමාගමේ නව කළමනාකාරිත්වයේ නව ප්‍රවේශය ශ්‍රී ලංකාවේ පොස්පේට් පුනරුදය නුදුරේ ම ඇති වන බවට මෙලෙස සාක්ෂි සපයන බවයි පෙනී යන්නේ.





28% සහිත එප්පාවෙල රොක් පොස්පේට් (ERP)






38% සහිත අධි ශ්‍රේණියේ එප්පාවෙල රොක් පොස්පේට් (HERP)

දීප්ත කුමාර බටගොඩ

# ජනගහනයේ පැතිකඩක්

ශ්‍රී ලංකාවේ 15 වැනි ජන හා නිවාස සංගණනය පැවැත්වුණේ 2024 වර්ෂයේදී. එහි තොරතුරු රැස් කිරීම 2025 පෙබරවාරි මාසයේදී අවසන් වුණා. රැස් කරන ලද තොරතුරුවල මූලික වාර්තාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිකුත් කර තිබෙනවා. මෙයට පෙර ජන හා නිවාස සංගණනයේ ලැයිස්තුගත කිරීමේ අදියරට අදාළ මූලික වාර්තාව ද ඉදිරිපත් කර තිබුණා. මේ, එම වාර්තාවල අන්තර්ගතය පිළිබඳ කෙටි හැඳින්වීමක්.



බොහෝ රටවල් ජන සංගණන පැවැත්වීමේදී ක්‍රියා කරන්නේ එක්සත් ජාතීන්ගේ 2020 සංගණන වටය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මාර්ගෝපදේශ අනුව. මේ මාර්ගෝපදේශවල සංගණන විධි ක්‍රම මෙන් ම සංකල්ප හා අර්ථ දැක්වීම් සඳහා ද කිසියම් මග පෙන්වීමක් සිදු කර තිබෙනවා. මේ නිසා පොදු තත්ත්වයක් යටතේ සෑම රටකට ම සංගණනයේ තොරතුරු රැස් කිරීමට හැකියාව ලැබෙනවා. ශ්‍රී ලංකාව ද ජන හා නිවාස සංගණනය පවත්වා තිබෙන්නේ මේ මාර්ගෝපදේශ අනුගමනය කරමින් සිතියම් සකස් කිරීම, ගොඩනැගිලි ලැයිස්තුගත කිරීම, තොරතුරු රැස් කිරීම හා තොරතුරු ප්‍රකාශයට පත් කිරීම වශයෙන් අදියර හතරක් යටතේ.

ජන හා නිවාස සංගණනයේ ගොඩනැගිලි ලැයිස්තුගත කිරීමේ අදියරේදී සිදු කරන්නේ රටේ තිබෙන සියලු ම ගොඩනැගිලිවල ඇති සංගණන ඒකක ලැයිස්තුගත කිරීම. මෙහිදී නිවාස ඒකක, සමූහ වාසස්ථාන, නේවාසික ආයතන හා වාසය සඳහා නොවන ස්ථාන වශයෙන් සංගණන ඒකක වර්ග හතරක් දක්වා තිබෙනවා. මේ සියලු සංගණන ඒකකවල රතු ලේබලයක් අලවා, ඒවායේ මූලික විස්තර සහිත ලැයිස්තුවක් සකස් කර ගැනීමයි මුලින් ම සිදු කෙරුණේ. මේ නිසා ඉදිරියේදී පුද්ගල තොරතුරු රැස් කිරීම ද්වී ගණනය වීමකින් තොර ව හා පුද්ගලයන් මගහැරීමකින් තොර ව තොරතුරු රැස් කිරීමේ අවස්ථාව ලැබෙනවා. මේ සියලු ම සංගණන ඒකක ගණන් ගැනීමක් ද මෙහිදී සිදු වෙනවා. ඒ අනුව මෙවර සංගණනයේදී ද පෙර සංගණනවලදී මෙන් රටේ සියලු ම සංගණන ඒකකවලින් වැඩි ම සංඛ්‍යාවක් ඇත්තේ නිවාස ඒකක බව පැහැදිලි වන කරුණක්. එය මුළු සංගණන ඒකකවලින් සියයට 80ක් පමණ වෙනවා. 2012 සංගණනයේදී වාර්තා වූ මුළු නිවාස ඒකක ගණන 5,773,678ක්. 2024 වසරේදී එය 6,762,644 දක්වා ඉහළ ගොස් තිබුණත් ප්‍රතිශතාත්මක වශයෙන් එහි වාර්තා වන්නේ පහළ යාමක්. එහෙත් වාසය සඳහා නොවන ස්ථානවල සැලකිය යුතු ඉහළ යාමක් පෙන්වන අතර එය සංඛ්‍යාත්මක වශයෙන් මෙන් ම ප්‍රතිශතාත්මක වශයෙන් අනෙකුත් ඒකක අතර ද කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරනවා.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට නිල වශයෙන් ජන සංගණනයක් පවත්වා ඇත්තේ 1871 මාර්තු 27 දින. වාර්තා වූ ජනගහනය 2,400,380ක්. 2024 වර්ෂයේදී පවත්වන මේ ජන සංගණනයේදී වාර්තා වූ ජනගහනය 21,763,170ක්. වර්ෂ 153කට පමණ පසුව ජනගහනය 9 ගුණයකින් පමණ වැඩි වී තිබෙන බව මේ අනුව පෙනී යනවා. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය හා සමාජ ආර්ථික සුභ සාධනයේ දියුණුවත් ඒ අනුව ඉහළ ගිය උපතේදී ආයු අපේක්ෂාවත් නිසා මෙවැනි ඉහළ යාමක් වාර්තා කරන්නට ඇති බවයි ප්‍රජා විද්‍යාව හා සම්බන්ධ විද්වතුන් පවසන්නේ.

ශ්‍රී ලංකාවේ ජනගහනය තවමත් වර්ධනය වෙමින් පැවතුණ ද එහි වර්ධන වේගයේ කිසියම් ආකාරයක හීන වීමක් පෙන්නුම් කරන බවයි 2024 ජන හා නිවාස සංගණනයේ මූලික වාර්තාව අනුව පෙනී යන්නේ. 2012 ජන හා නිවාස සංගණනයේ වාර්තා වූ මුළු ජනගහනයට වඩා 2024 වර්ෂයේදී ජනගහනයේ ඉහළ යාම සිදු වී ඇත්තේ 1,403,731කින්. එය 2012 හා 2024 අන්තර් සංගණන කාල පරිච්ඡේදයේ සාමාන්‍ය වාර්ෂික වර්ධනය සියයට 0.5ක වර්ධනයක් බව මේ වාර්තාව පෙන්වා දෙනවා. 2001 සහ 2012 අන්තර් සංගණන කාල පරිච්ඡේදයේ මෙය වාර්තා වූයේ සියයට 0.7ක් ලෙසින්. උපතේදී ආයු අපේක්ෂාව ඉහළ යාම හා හීන වන ජනගහන වර්ධන අනුපාතිකයක් පැවතීම ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයේ ඉහළ යාම තවත් තීව්‍ර කළ හැකියි. සෞඛ්‍ය අමාත්‍යාංශය පසුගිය දිනක වාර්තා කර තිබුණේ ශ්‍රී ලංකාවේ උපතේදී ආයු අපේක්ෂාව වයස අවුරුදු 77.9 දක්වා ඉහළ ගොස් තිබෙන බවක්. කාන්තාවන්ගේ මෙය වයස අවුරුදු 83 දක්වා ඉහළ ගොස් ඇති බව ද ඔවුන් පෙන්වා දී තිබෙනවා. කාන්තාවන්ගේ ශ්‍රම බලකාය සඳහා දායකත්වය ආසන්න වශයෙන් සියයට 33ක් පමණ වන බවයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසන්නේ. මේ තත්ත්වය අනාගතයේ ශ්‍රී ලංකාවේ සංවර්ධන උපායමාර්ග තීරණය කිරීම සඳහා පදනම් කර ගත යුතු සුවිශේෂ වැදගත්කමක් සහිත සාධකයක්.

දිස්ත්‍රික්ක අනුව ජනගහනයේ වර්ධනය විමසා බැලීමේදී ජනගහනයේ ඉහළ ම සාමාන්‍ය වාර්ෂික වර්ධනය මුලතිව් දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය සියයට 2.23ක් ලෙසිනුයි පෙන්නුම් කරන්නේ. සියයට 0.01ක අඩු ම වර්ධන වේගය වවුනියා දිස්ත්‍රික්කයෙන් වාර්තා වෙනවා.

මේ මූලික වාර්තාව අනුව ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් සියයට 28.1ක් පදිංචි ව සිටින්නේ බස්නාහිර පළාතේ. අඩු ම ජනගහනයක් වාර්තා වන්නේ උතුරු පළාතෙන්. එය සියයට 5.3ක්. වැඩි ම ජනගහනය ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය 2,433,685ක්. ඉන්පසුව වැඩි ම ජනගහනයක් වාර්තා කරන්නේ පිළිවෙළින් කොළඹ (2,374,461), කුරුණෑගල (1,760,829), මහනුවර (1,461,269), කළුතර (1,305,552), රත්නපුර (1,145,138), ගාල්ල (1,096,585) යන දිස්ත්‍රික්ක. අඩු ම ජනගහනයක් වාර්තා වන දිස්ත්‍රික්කය මුලතිව් දිස්ත්‍රික්කය වන අතර එහි ජනගහනය 122,542ක් ලෙසින් වාර්තා වනවා. ඉන්පසුව පිළිවෙළින් අඩු ජනගහනයක් වාර්තා කරන්නේ මන්නාරම (123,674), කිලිනොච්චි (136,434), වවුනියා (172,257) යන දිස්ත්‍රික්ක. පෙර සංගණනවලදී ද මේ දිස්ත්‍රික්ක අඩු ජනගහනයක් වාර්තා කිරීම විශේෂ ලක්ෂණයක්.

ශ්‍රී ලංකාවේ ජනගහනය සහ ජනගහනයේ ප්‍රජාවිද්‍යාත්මක, අධ්‍යාපනික හා ආර්ථිකමය ස්වරූප පිළිබඳ විශාල තොරතුරු ප්‍රමාණයක් 2024 ජන හා නිවාස සංගණනයෙන් රැස් කර තිබෙනවා. එමෙන් ම නිවාස ඒකක හා ඒවායේ ජීවත්වන ගෘහ කාණ්ඩවල පහසුකම් පිළිබඳ තොරතුරු රාශියක් මේ සංගණනයේදී ලබා ගැනුණා. ඉදිරියේදී එම තොරතුරු ශ්‍රී ලංකාවේ කුඩා ම පරිපාලන ඒකකය වන ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ප්‍රකාශයට පත් කෙරෙනු ඇති. එය ඉදිරි වසර 10ක කාලයේ රටේ සැලසුම් හා ඒවායේ අභිමථාර්ථ සාධනය සඳහා භාවිත කරනු ඇති.

සංගණන වර්ෂ අනුව ගණන් ගත් ජනගහනය, අන්තර් සංගණන වර්ධනය හා සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතිකය, 1871 - 2024

| ගණන් ගත් දිනය | ගණන්ගත් ජනගහනය | අන්තර් සංගණන වර්ධනය | | සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතිකය (සියයට) |
|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | ප්‍රතිශතය | |
| 1871 මාර්තු 27 | 2,400,380 | - | - | - |
| 1881 පෙබරවාරි 17 | 2,759,738 | 359,358 | 15.0 | 1.4 |
| 1891 පෙබරවාරි 26 | 3,007,789 | 248,051 | 9.0 | 0.9 |
| 1901 මාර්තු 01 | 3,565,954 | 558,165 | 18.6 | 1.7 |
| 1911 මාර්තු 10 | 4,106,350 | 540,396 | 15.2 | 1.4 |
| 1921 මාර්තු 18 | 4,498,605 | 392,255 | 9.6 | 0.9 |
| 1931 පෙබරවාරි 26 | 5,306,871 | 808,266 | 18.0 | 1.7 |
| 1946 මාර්තු 19 | 6,657,339 | 1,350,468 | 25.4 | 1.5 |
| 1953 මාර්තු 20 | 8,097,895 | 1,440,556 | 21.6 | 2.8 |
| 1963 ජූලි 08 | 10,582,064 | 2,484,169 | 30.7 | 2.6 |
| 1971 ඔක්තෝබර් 09 | 12,689,897 | 2,107,833 | 19.9 | 2.2 |
| 1981 මාර්තු 17 | 14,846,750 | 2,156,853 | 17.0 | 1.7 |
| 2001 ජූලි 17[3] | 18,797,257 | 3,950,507 | 26.6 | 1.2 |
| 2012 මාර්තු 20 | 20,359,439 | 1,562,182 | 8.3 | 0.7 |
| **2024 සැප්තැම්බර් 19** | **21,763,170** | **1,403,731** | **6.9** | **0.5** |

මූලාශ්‍රය : මූලික වාර්තාව, දිස්ත්‍රික් අනුව ශ්‍රී ලංකාවේ ජනගහනය, ජන හා නිවාස සංගණනය 2024, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඒකක වර්ගය හා සංගණන වර්ෂ අනුව සංගණන ඒකක ව්‍යාප්තිය 1981, 2012 සහ 2024

<table>
<tr><th rowspan="2">ඒකක වර්ගය</th><th colspan="2">1981</th><th colspan="2">2012</th><th colspan="2">2024</th></tr>
<tr><th>සංඛ්‍යාව</th><th>%</th><th>සංඛ්‍යාව</th><th>%</th><th>සංඛ්‍යාව</th><th>%</th></tr>
<tr><td>මුළු සංගණන ඒකක*</td><td>3,423,486</td><td>100.0</td><td>6,769,131</td><td>100.0</td><td>8,377,895</td><td>100.0</td></tr>
<tr><td>නිවාස ඒකක</td><td>2,943,610</td><td>86.0</td><td>5,773,678</td><td>85.3</td><td>6,762,644</td><td>80.7</td></tr>
<tr><td>සමූහ වාසස්ථාන**</td><td rowspan="2">80,140</td><td rowspan="2">2.3</td><td rowspan="2">69,805</td><td rowspan="2">1.0</td><td>46,376</td><td>0.6</td></tr>
<tr><td>නේවාසික ආයතන</td><td>57,186</td><td>0.7</td></tr>
<tr><td>වාසය සඳහා නොවන ස්ථාන</td><td>399,736</td><td>11.7</td><td>925,648</td><td>13.7</td><td>1,511,689</td><td>18.0</td></tr>
</table>

* 2012 ට පෙර ගොඩනැගිලි ඒකක ලෙස දක්වා ඇත.

** 2024 දී නිවාස ඒකකයක් ලෙස සැලකීමට සපුරාලිය යුතු අවශ්‍යතා ත්‍රිත්වය සපුරාලන සහ එකිනෙකට නෑකමක් නැති පුද්ගලයින් උපරිම වශයෙන් හතරදෙනෙකු දක්වා එකට පදිංචිව සිටින ස්ථාන 'නිවාස ඒකක' වර්ගය යටතටත්, එකිනෙකාට නෑදෑකමක් නොමැති පුද්ගලයන් පස් දෙනෙකු හෝ වැඩි ගණනක් එකට ජීවත් වන ස්ථාන, 'සමූහ වාසස්ථාන' ලෙසත් වර්ග කර ඇත. 2012 සහ ඊට පෙර, එකිනෙකාට නෑදෑකමක් නොමැති පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පදිංචි ස්ථාන 'සමූහ වාසස්ථාන' ලෙස වර්ග කර ඇත.

**මූලාශ්‍රය : මූලික වාර්තාව ලැයිස්තුගත කිරීමේ අදියර, ජන හා නිවාස සංගණනය 2024, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**



# සල්ලි ගරන උගුල

චරිතා ලක්මිණී සමරවික්‍රම

**නව සාමාජිකයන් පිරිමීඩ යෝජනා ක්‍රමයට නිරන්තරයෙන් ආකර්ෂණය වන නිසා සෑම අදියරකදී ම සහභාගිවන්නන්ගේ සංඛ්‍යාව එක් එක් අවස්ථාවේ ශීඝ්‍ර ලෙස පුළුල් වෙනවා. එහෙත් මෙහිදී ප්‍රතිලාභ බෙදීයාමේදී වඩාත් අසරණ වන්නේ පිරමිඩයේ පහළ ම ස්ථරයේ ආයෝජකයන්.**

බොහෝ අය නොමඟ යවන ව්‍යාපාරයක් බවට වර්තමානයේ පිරමීඩ යෝජනා ක්‍රමය පත් ව තිබෙනවා. 1988 අංක 30 දරන බැංකු පනතේ 83-ඇ වගන්තියට අනුව පිරමීඩාකාර යෝජනා ක්‍රමයක් යනු යම් ආයතනයක් සාමාජිකයන්ට මුදලින් හෝ මූල්‍යමය අගයකින් හෝ ගෙවීමක් කිරීමට දායක වන්නාවූත් එමගින් සහභාගිවන අය උපයනු ලබන ප්‍රතිලාභ, යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය වැඩිවීම මත හෝ යෝජනා ක්‍රමයේ සාමාජිකයන් විසින් ගෙවනු ලබන මුදල් ප්‍රමාණය වැඩිවීම මත හෝ තීරණය වන ක්‍රමයක්. සරල ව ම එක් අයකු යම් වෙළෙඳාමකට තවත් අයකු හඳුන්වාදීම පිරමීඩාකාර යෝජනා ක්‍රමයක්. මෙය නීතියට පරිබාහිර ව යන ක්‍රියාවලියක්. රටේ සංවර්ධනයට සෘජු ව දායක වන තරුණ ප්‍රජාවට සිහින ලෝක පෙන්වමින් ඔවුන් සතු අවසන් රුපියල දක්වා ම සූරාකෑමට පිරමීඩ ජාවාරම්කරුවන් සමත් ව ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව අනාවරණය කරනවා.

කෙටි කාලයකින්, කෙටි මාර්ගවලින් දියුණු වීමේ උත්සාහයක යෙදෙන පුද්ගලයන්ට 'ඉක්මන කොටයි' යන්න මනාවට තේරුම් කළ අවස්ථාවක් ලෙස පිරමීඩ ජාවාරම හැඳින්විය හැකියි. මෙහි ප්‍රධාන වගකීමක් උසුලන ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා අජානි ලියනපටබැඳි පවසන ආකාරයට මහජනතාව දැනුවත් කිරීමෙන් මේ ජාවාරමට ගොදුරු වන්නන් අවම කරගැනීමට හැකියාව තිබෙනවා. ශ්‍රී ලංකා මහ බැංකුවේ Mr.BeeWise ෆේස්බුක් පිටුව එලෙස මහජනතාව දැනුවත් කරන මාධ්‍යයක්.

2020 වසරේ ඇති වූ කොවිඩ් 19 වසංගතයත් සමග මේ නීති විරෝධී ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් ව්‍යාප්ත වුණා. මේ සඳහා zoom තාක්ෂණයේ ද විශාල දායකත්වයක් ලැබී තිබෙනවා. පිරමීඩ යෝජනා ක්‍රමය ජාල අලෙවිකරණයෙන් වෙනස්. විශේෂයෙන් ගුණාත්මකභාවය පිළිබඳ සෑහීමකට පත් විය නොහැකි වීම, නව බඳවාගැනීම් වැඩි කරමින් කොමිස් ලබා ගැනීම අරමුණු කරගැනීම, වෙළෙඳ පොළේ පහසුවෙන් දැකිය හැකි භාණ්ඩ නොවීම, භාණ්ඩ පිළිබඳ පැමිණිලි කිරීමට පහසුකම් සපයා නොමැති වීම, මෙහි සාමාජිකයෙක් වෙනත් පුද්ගලයකුට යම් භාණ්ඩයක් විකිණීමට පෙර ඒ භාණ්ඩය සාමාජිකයා විසින් මිලදී ගත යුතු වීම පිරමීඩ යෝජනා ක්‍රමයක ලක්ෂණ.

1988 අංක 30 දරන බැංකු පනතේ 83-ඇ වගන්තියට අනුව පිරමීඩ යෝජනා ක්‍රමයක් ආරම්භ කිරිම, ප්‍රවර්ධනය, ප්‍රචාරය, පවත්වාගෙන යාම, මුදල් සැපයීම හෝ කළමනාකරණය අපරාධමය වරදක්. මේ යටතේ වරදකරුවකු වන අයකුට වසර 3ක සිර දඬුවමක්, රුපියල් දස ලක්ෂයක් දක්වා දඩයක් හෝ මේ දඬුවම් දෙක ම ලබා දෙනවා. දැනුවත් ව වෙනත් අයකුට පාඩුවක් හෝ හිංසනයක් හෝ කළහොත් වසර 3-5ත් අතර බරපතළ වැඩ සහිත සිර දඬුවමක් සහ රුපියල් ලක්ෂ විස්සක් හෝ සහභාගිකරුවන්ගෙන් ලද මුදල මෙන් දෙගුණයක් හෝ ගෙවීමට සිදුවනු ඇති.

පිරමීඩ ජාවාරම් ක්‍රමය ඇමරිකා එක්සත් ජනපදයේ 20 වැනි සියවසේ මුල් භාගයේ ආරම්භ වූයේ ආයෝජකයන්ට සුපිරි ලාභ ලබාදෙන ආයෝජන ක්‍රමයක් ලෙස. ජනතාවගේ මුදල් කෙරෙහි පවතින කෑදරකම මත පිරමීඩ යෝජනා ක්‍රමවල ඉල්ලුම තීරණය වනවා. මේ ක්‍රමයෙන් කෙටි කාලයකින්, අඩු ශ්‍රමයකින් ධනවතකු වීමට ජනතාව පොළඹවනවා. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන මහ

බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ යානක රණවීර; "නව සාමාජිකයන් පිරිමීඩ යෝජනා ක්‍රමයට නිරන්තරයෙන් ආකර්ෂණය වන නිසා සෑම අදියරකදී ම සහභාගිවන්නන්ගේ සංඛ්‍යාව එක් එක් අවස්ථාවේ ශීඝ්‍ර ලෙස පුළුල් වෙනවා. එහෙත් මෙහිදී ප්‍රතිලාභ බෙදීයාමේදී වඩාත් අසරණ වන්නේ පිරමිඩයේ පහළ ම ස්ථරයේ ආයෝජකයන්."

පිරිමීඩ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය මෙරට වඩාත් උපක්‍රමශීලී ව සිදුවන්නක්. විශේෂයෙන් මහජනතාව ඒකරාශී වන ක්‍රීඩා උත්සව, ආගමික උත්සව, සංගීත සංදර්ශන, ප්‍රජා සේවා මෙන් ම විවිධ වැඩමුළු සඳහා සම්පත් දායකත්වය ලබාදීම එහි එක් ක්‍රමයක්. ධනාත්මක චින්තන වැකි ඔස්සේ කරන පැහැදිලි කිරිම්, නෑදෑයන් හා මිතුරන් වැනි සමීපතමයන් මේ සඳහා සම්බන්ධ කරගැනීම වැනි කාරණා මෙහිදී හඳුනාගැනීමට පුළුවන්. සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය, සුඛෝපභෝගී වාහන සහ නිවාස ආදිය පිළිබඳ ව ජනතාව තුළ සිහින මැවීම තවත් ප්‍රවර්ධන ක්‍රමයක්.

උගත්, නූගත් සියල්ලන් තම ව්‍යාපාරයට හසුකර ගැනීමට පිරිමීඩ යෝජනා ක්‍රම සමත් වනවා. මහජනයා නමැති මසුන් බෑමට පිරමීඩ යෝජනාකරුවන් යොදා ගන්නා විවිධාකාර උපක්‍රම හේතුවෙන් කෙතරම් දැනුවත්වීම් කළ ද යම් පිරිසක් මේ කූට ව්‍යාපාරය සමග බැඳී සිටිනවා. භාණ්ඩ අලෙවිය පමණක් නොව සේවා සැපයීම, පැළ අලෙවි කිරිම, ට්‍රේඩිං (Trading) කිරීම ආදී විවිධ නම් භාවිත කරමින් පිරමීඩ යෝජනාකරුවන් ක්‍රියා කරන්නේ තම නීති විරෝධි ව්‍යාපාරය රටේ නොයෙක් ප්‍රදේශවල ව්‍යාප්ත කිරීමට.

කෙතරම් දැනුවත් කිරීම් සිදු කළ ද මහජනතාව යළි යළිත් පිරමීඩාකාර ව්‍යාපාර පසුපස හඹා යන පසුබිමක පිරමීඩ යෝජනාකරුවන් තම ව්‍යාපාර වඩාත් නිර්මාණශීලී ව මෙන් ම උපක්‍රමශීලී ව නීතියේ රැහැනට හසුනොවන අයුරින් ක්‍රියාත්මක කරනවා. ඉතිරි කිරිම්වලින්, වත්කම් විකිණීමෙන්, මුදල් ණයට ලබාගැනීමෙන් හා මුදල් අතමාරු කරගැනීමෙන් පිරිමීඩ ව්‍යාපාර සඳහා මුදල් යෙදවීමට ආයෝජකයන් උත්සුක වන්නේ ඒවා දෙගුණ කර ගැනීමේ අරමුණින්. එහෙත් ආයෝජනය කළ මුදලවත් නැවත නොලැබීම නිසා රැකියා අත හැරීම, පවුල් සබඳතා බිඳ වැටිම, ප්‍රචණ්ඩත්වයට හා වෙනත් අපරාධවලට යොමුවීම, දික්කසාද වීම, සියදිවි නසාගැනීම මෙන් ම බංකොලොත්භාවයට පත් වීම වැනි අහිතකර තත්ත්වවලට ආයෝජකයන් ගොදුරු වන අවස්ථා දැකගැනීමට පුළුවන්. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සඳහන් ආකාරයට විවිධ නම්වලින් සහ විවිධ ආයතනවලින් පෙනී සිටින්නේ එකම පිරමීඩ ජාවාරම්කරුවන් කණ්ඩායමක් විය හැකියි. මේ පිළිබඳ අදහස් දක්වන නියෝජ්‍ය අධ්‍යක්ෂ යානක රණවීර; "ජාල අලෙවිකරණ යෝජනා ක්‍රම ලෙස පෙනී සිටින පිරිමීඩ යෝජනා ක්‍රමවල බලපෑම කොතෙක් ද යන්න 1990 වර්ෂයේ ඇල්බේනියානු අත්දැකීම්වලින් පැහැදිලි කර ගැනීමට පුළුවන්. එහිදී සිදු වූ මරණ සංඛ්‍යාව 2000ට වැඩියි. එරට ආර්ථිකය කඩා වැටුණු බව ඇල්බේනියානු වාර්තාවලට අනුව පැහැදිලි වනවා."




ජාල අලෙවිකරණ යෝජනා ක්‍රම ලෙස පෙනී සිටින පිරිමීඩ යෝජනා ක්‍රමවල බලපෑම කොතෙක් ද යන්න 1990 වර්ෂයේ ඇල්බේනියානු අත්දැකීම්වලින් පැහැදිලි කර ගැනීමට පුළුවන්. එහිදී සිදු වූ මරණ සංඛ්‍යාව 2000ට වැඩියි. එරට ආර්ථිකය කඩා වැටුණු බව ඇල්බේනියානු වාර්තාවලට අනුව පැහැදිලි වනවා.

තම ප්‍රදේශයේ ව්‍යාප්ත වන මෙවැනි යෝජනා ක්‍රම පිළිබඳ විමසිලිමත් වීම, විමර්ශන සහ වැටලීම්, යථා පරිදි අධිකරණයට කරුණු වාර්තා කිරීම හා වැඩිදුර විමර්ශනය සඳහා අවසර ලබා ගැනීම, ග්‍රාමීය මට්ටමින් මහජනතාව දැනුවත් කිරීම හා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් සඳහා යොමු කිරීම වැනි කාරණා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල වගකීමක්. පිරමීඩ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන ආයතන 22ක් පිළිබළිද තොරතුරු මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇති බවත් ඒ පිළිබඳ විමර්ශන සිදු කෙරෙමින් පවතින බවත් නියෝජ්‍ය අධ්‍යක්ෂ යානක රණවීර සඳහන් කරන කාරණාවක්.

ජනතාව ලෙස අප දැනුවත් වීමට, අන් අය දැනුවත් කිරීමට, ජාවාරම්වලට තනි ව සහ එක් ව එරෙහි වීමට, නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශ දැනුවත් කිරීමට ක්‍රියා කළ යුතු වනවා. අපගේ සමීපතමයන් ගොදුරු කරගත් මේ පිරිමීඩ ජාවාරම වැළැක්වීම ජනතාව ලෙස අපගේ ද නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල ද ශ්‍රී ලංකා මහ බැංකුවේ ද වගකීමක් සහ වගවීමක් විය යුතුයි.

('ශ්‍රී ලංකා මහබැංකුවේ පැවති 'තහනම් පිරමීඩ යෝජනා ක්‍රම' පිළිබඳ වැඩමුළුවක් ඇසුරෙන්)



# Starlink ආගමනය

එම්. එම්. මදුසංක කුමාර

ලොව වේගවත්, විශ්වසනීය අන්තර්ජාල පහසුකම් ලබා දීම සඳහා SpaceX සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන Starlink චන්ද්‍රිකා අන්තර්ජාලය නොබෝදා ශ්‍රී ලංකාවට හඳුන්වා දීම, මෙරට තාක්ෂණික හා ආර්ථික සංවර්ධනයට විශාල සහයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරෙනවා.

Starlink යනු SpaceX සමාගම පෘථිවියට පහළ කක්ෂයක (Low Earth Orbit - LEO) ස්ථානගත කර ඇති කුඩා චන්ද්‍රිකා දහස් ගණනකින් සමන්විත ජාලයක්. සාම්ප්‍රදායික භූගත අන්තර්ජාල පද්ධතිවලට ළඟා වීමට අපහසු, දුෂ්කර ප්‍රදේශවලට පවා අධිවේගී, අඩු ප්‍රමාදයක් සහිත (low-latency) අන්තර්ජාලය ලබා දීම මේ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනවා.

මේ චන්ද්‍රිකා පෘථිවියට ඉතා ආසන්න ව, කිලෝමීටර 550ක පමණ උසකින් පිහිටා ඇති නිසා, දත්ත සම්ප්‍රේෂණයේදී ඇතිවන ප්‍රමාදය (latency) සාම්ප්‍රදායික භූ ස්ථාවර චන්ද්‍රිකා අන්තර්ජාලයට (කිලෝමීටර 36,000ක පමණ උසකින්) වඩා බෙහෙවින් අඩුයි. Starlink මගින් සාමාන්‍යයෙන් තත්පරයට මෙගාබිට් 100-200 (100-200 Mbps) දක්වා බාගත කිරීමේ වේගයක් (download speeds) සහ තත්පරයට මෙගාබිට් 20-40 (20-40 Mbps) දක්වා උඩුගත කිරීමේ වේගයක් (upload speeds) ලබාදෙන බව සඳහන්. ඇතැම් අවස්ථාවලදී මේ වේග 300 Mbps ඉක්මවිය හැකියි. අඩු ප්‍රමාදය (සාමාන්‍යයෙන් 20-40ms) වීඩියෝ ඇමතුම්, ඔන්ලයින් ගේම්ස් සහ අනෙකුත් තත්කාලීන යෙදුම් සඳහා වඩාත් සුදුසු අත්දැකීමක් ලබා දෙනවා.

Starlink සේවාව ශ්‍රී ලංකාවට හඳුන්වා දීමත් සමඟ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) ඊට අවශ්‍ය නීතිමය සහ නියාමන රාමුව සකසා තිබෙනවා. එහි අධ්‍යක්ෂ ජනරාල් බන්දුල හේරත් පවසන්නේ 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 17ඊ වගන්තියට සහ 2024.07.31 දිනැති අංක 2395/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත විදුලි සංදේශ සැපයුම්කරු බලපත්‍ර රීතිවලට අනුකූල ව Starlink සේවාවට බලපත්‍ර ලබා දී ඇති බව. ඒ අනුව Starlink සමාගම ශ්‍රී ලංකාවේ මෙහෙයුම් කරගෙන යාම සඳහා අවශ්‍ය වන බලපත්‍ර දෙකක් ලබාගෙන තිබෙනවා. ඒ, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17ඊ වගන්තිය අනුව විදුලි සංදේශ සැපයුම්කරු බලපත්‍රයක් සහ 22 වගන්තිය යටතේ රේඩියෝ සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍රයක් වශයෙන්.

අධ්‍යක්ෂ ජනරාල්වරයා අවධාරණය කරන්නේ මෙවැනි බලපත්‍ර නිකුත් කිරීමේදී TRCSL මූලික ව ම සලකා බලන්නේ ග්‍රාහකයන්ට ලබාදෙන ගුණාත්මක සේවය, තාක්ෂණික, මූල්‍ය, විකුණුම් සහ අලෙවිකරණය, පාරිභෝගික ආරක්ෂාව, සංවිධානය හා කළමනාකරණය යන කාරණා බව. Starlink සේවාව සඳහා අවශ්‍ය වන භෞතික උපකරණ (ඩිෂ් ඇන්ටනා වැනි) ආනයනය හා බෙදාහැරීම සම්බන්ධයෙන් ද 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 21 වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කර තිබෙනවා.

Starlink සේවාව ක්‍රියාත්මක වීමෙන් ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ යටිතල පහසුකම්වලට සිදු වනු ඇත්තේ විශාල ධනාත්මක බලපෑමක්. අදහස් දක්වන අධ්‍යක්ෂ ජනරාල් බන්දුල හේරත්; "Starlink යටතේ ආවරණය නොමැති ප්‍රදේශවලට අන්තර්ජාල ප්‍රවේශය ලබාදීමෙන් දැනට පවතින විදුලි සංදේශ සමාගම් අතර තරගකාරිත්වය වැඩි වෙනවා. මෙය යටිතල පහසුකම් හවුලේ භාවිතය වැඩිදියුණු කිරීමටත් මඟ පාදන්නක්. මෙතෙක් චන්ද්‍රිකා තාක්ෂණයට භාවිත නොවූ සංඛ්‍යාත භාවිතයෙන් රජයට අමතර ආදායමක් ලැබෙන අතර ම එය විශේෂයෙන් දුෂ්කර සහ දුරස්ථ ප්‍රදේශවලට පුළුල් සමාජීය සේවාවක් ලබා දීමට ඉවහල් වෙනවා.




**Starlink යනු SpaceX සමාගම පෞද්ගලිකව පහළ කක්ෂයක (Low Earth Orbit - LEO) ස්ථානගත කර ඇති කුඩා චන්ද්‍රිකා දහස් ගණනකින් සමන්විත ජාලයක්. සාම්ප්‍රදායික භූගත අන්තර්ජාල පද්ධතිවලට ළඟා වීමට අපහසු, දුෂ්කර ප්‍රදේශවලට පවා අධිවේගී, අඩු ප්‍රමාදයක් සහිත (low-latency) අන්තර්ජාලය ලබා දීම මේ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනවා.**

දැනට පවතින සේවා සැපයුම්කරුවන්ට ඔවුන්ගේ ජාල ව්‍යාප්තිය සහ වැඩිදියුණු කිරීම සඳහා Starlink සේවාවේ පහසුකම් යොදාගැනීමට අවස්ථාව සැලසීමත් මෙහි විශේෂත්වයක්. Starlink සේවාවට අදාළ උපකරණ වියදම් සහ මාසික ගාස්තු යම් තරමකට වැඩි විය හැකි වුවත් තරගකාරිත්වය වැඩි වීම නිසා ප්‍රචලිත ISPs ඔවුන්ගේ සේවා වර්ධනය කිරීමට, ගුණාත්මකභාවය වැඩි කිරීමට සහ මිල අඩු කිරීමට පෙළඹෙනු ඇති."

Starlink සේවාවට ග්‍රාමීය සහ දුෂ්කර ප්‍රදේශවල අන්තර්ජාල ප්‍රවේශය (Internet Accessibility) වැඩිදියුණු කිරීමට ලබාදෙන්නේ විශාල දායකත්වයක්. Starlink භාවිත කරන Low Earth Oriit (LEO) චන්ද්‍රිකා මගින් විශාල කේබල්/ටවර් අවශ්‍යතාවකින් තොර ව, ඕනෑ ම ස්ථානයකට ඍජු අන්තර්ජාල සම්බන්ධතාවක් ලබා දිය හැකි බව අධ්‍යක්ෂ ජනරාල්වරයා පෙන්වා දෙනවා. මෙය උස් කන්දක, වනාන්තරයක හෝ දූපතක වුවත් ක්‍රියාත්මක කළ හැකියි. Starlink සඳහා අවශ්‍ය වන්නේ Dish antenna, Router සහ Power supply පමණක් වන බැවින් අඩු යටිතල පහසුකම් සහිත ග්‍රාමීය ප්‍රදේශවලට ද පහසුවෙන් සම්බන්ධ වන්නට පුළුවන්. Starlink සේවාව හඳුන්වාදීමෙන් රටේ ඩිජිටල්කරණ ක්‍රියාවලියට සැලකිය යුතු දායකත්වයක් ලැබීම ඉතා වැදගත් කරුණක්. අන්තර්ජාල ප්‍රවේශ විෂමතාව අඩු කිරීමෙන් ඩිජිටල් සමබරතාවක් ඇති වන බවත් අධ්‍යක්ෂ ජනරාල් බන්දුල හේරත් සඳහන් කරන කරුණක්.

LEO චන්ද්‍රිකා ලබාදෙන ස්ථාවර සම්බන්ධතාව e-Government සේවා ව්‍යාප්ත කිරීමට (Smart agriculture, e-Health, e-Learning, IoT පදනම් වූ සේවා) මූලික වීම සුවිශේෂ කරුණක්. දුරස්ථ අධ්‍යාපන වැඩසටහන්, විශ්වවිද්‍යාල සබැඳි, පන්ති සහ අන්තර්ජාල පාඨමාලා සඳහා ලැබෙන ප්‍රවේශය වැඩිවීමෙන් අධ්‍යාපනය සහ දුරස්ථ අධ්‍යාපනය පුළුල් වනු ඇති. Starlink සේවාව හේතුවෙන් ශ්‍රී ලංකාවේ රැකියා අවස්ථා සහ නව ව්‍යාපාරික අවස්ථා බිහිවීමට ද පසුබිම සැකසෙනවා. මෙහිදී භෞතික උපකරණ බෙදාහැරීමට හා ස්ථාපනයට තාක්ෂණික නියෝජිතයන් සඳහා රැකියා අවස්ථා නිර්මාණය වන අතර ම අවසර ලත් ප්‍රාදේශීය අලෙවි නියෝජිත ව්‍යාපාර බිහිවිය හැකියි. වේගවත් හා ස්ථාවර අන්තර්ජාලය මත පදනම් ව දුරස්ථ කාර්යය (remote work), මාර්ගගත නිදහස් රැකියා (online freelancing), ව්‍යාපාර ක්‍රියාවලි බාහිරීකරණය (Business Process Outsourcing) ව්‍යාපාර ව්‍යාප්ත වන අතර සුහුරු ගොවිතැන (Smart farming), (Telemedicine, e-Learning) වැනි ක්ෂේත්‍රවල නව සේවා නිර්මාණය වනු ඇති. කර්මාන්තශාලා සහ කුඩා ව්‍යාපාරවල ඩිජිටල් පරිවර්තනය (e-commerce, online marketing, digital accounting) සඳහා ද Starlink මගින් අවස්ථා විවර වනු ඇති.

Starlink සේවාව ශ්‍රී ලංකාවට හඳුන්වාදීමේදී TRCSL මුහුණදුන් ප්‍රධාන අභියෝග ද තිබෙනවා. අධ්‍යක්ෂ ජනරාල් බන්දුල හේරත් පවසන ආකාරයට නීතිමය අභියෝග (පවතින නියාමන රාමුව යටතේ LEO satellite services සඳහා නිශ්චිත නීතිරීති නොතිබීම), තාක්ෂණික අභියෝග (LEO satellite සේවාවලට අදාළ තාක්ෂණික පිරිවිතර සහ අනුකූලතා සකස් කිරීමේ අවශ්‍යතාව, Frequency coordination වැනි ගැටලු), ආර්ථික අභියෝග (සේවාව සඳහා වියදම්, උපකරණ මිල සහ ආනයනය සම්බන්ධ ගැටලු) සහ ආරක්ෂක හා පෞද්ගලිකත්ව අභියෝග (ජාතික ආරක්ෂාවට හා දත්ත පෞද්ගලිකත්වයට බලපෑම් විය හැකි බැවින් නිරීක්ෂණ නියමයන් පිළිබඳ සැලැස්වීම්) ඒවා අතර ප්‍රධාන වෙනවා. TRCSL විසින් Starlink සේවාව බලපත්‍ර කොන්දේසි, මිල සීමා, පාරිභෝගික සහාය සහ සේවා ප්‍රවේශය මත අධීක්ෂණය සහ නියාමනය කරනු ලබනවා ඇති. Starlink මෙහෙයුම් අධීක්ෂණය කරන්නේ නියාමන බලපත්‍ර කොන්දේසි, තාක්ෂණික තත්ත්ව විශ්ලේෂණය, වාර්තා නිරීක්ෂණය සහ පාරිභෝගික පැමිණිලි පද්ධතිය මත. පාරිභෝගික ආරක්ෂාව, ජාතික ආරක්ෂාව සහ තත්ත්ව සහතික කිරීම මෙහිදී වැදගත්. Dash Board මගින් තාක්ෂණික, සේවා තත්ත්ව, ආරක්ෂක සහ ආර්ථික දත්ත නිතර අධීක්ෂණය කිරීමට ද හැකියාව ලැබෙනවා. අනාගතයේදී ශ්‍රී ලංකාවට තවත් එවැනි චන්ද්‍රිකා අන්තර්ජාල සේවා හඳුන්වාදීම සම්බන්ධයෙන් TRCSLහි ප්‍රතිපත්තිය වන්නේ නව චන්ද්‍රිකා අන්තර්ජාලයක අවශ්‍යතාවක් මතුවුවහොත් ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික යෝග්‍යතාව මත එවැනි සේවාවක් හඳුන්වා දීම.

මේ අනුව Starlink ශ්‍රී ලංකාවට පැමිණීම, මෙරට ඩිජිටල්කරණයේ සහ සංවර්ධනයේ නව පරිච්ඡේදයක් සනිටුහන් කරන අතර එය සමස්ත රටට ම වඩා හොඳ අන්තර්ජාල පහසුකම් ලබා දෙනවා පමණක් නොව ගෝලීය ඩිජිටල් ආර්ථිකයේ ශ්‍රී ලංකාවේ ස්ථානය තවදුරටත් ශක්තිමත් කිරීමට ද දායක වනු ඇති.



# ගාසා සාගතය

**නිහාල් පීරිස්**

වසර දෙකකට කිට්ටු කාලයක් තිස්සේ බිහිසුණු යුද ගැටුමකට මැදි වී සිටින ගාසා තීරයේ ජනතාව කාලයක සිට ම යුද බියට අමතර ව ආහාර හිඟයකින් ද පීඩා විඳිමින් සිටිනවා. එහෙත් මාස කිහිපයක සිට මේ ප්‍රශ්නය පෙරටත් වඩා උග්‍ර වී ඇති අතර කුසගින්න සහ මන්දපෝෂණය නිසා සිදුවන මරණ සංඛ්‍යාව ඉහළ යමින් තිබෙනවා. පැය 24ක කෙටි කාලයකදී 14 දෙනකු මන්දපෝෂණයෙන් මිය යාමේ සිද්ධියක් ගැන ද නොබෝද ගාසාහි සෞඛ්‍ය අංශ සඳහන් කර තිබුණා. ඇති වී තිබෙන සාගත තත්ත්වය කෙතරම් බරපතළ ද යන්න මෙවැනි කාරණා සාක්ෂි.

මාධ්‍ය වාර්තාවල දැක්වෙන ආකාරයට මන්දපෝෂණය හේතුවෙන් මරණයට පත්වන වැඩි දෙනා කුඩා දරුවන්. මෙය අතිශයින් ඛේදජනක තත්ත්වයක්. ගාසාහි හමාස් සංවිධානය සහ ඊශ්‍රායලය අතර යුද ගැටුම ආරම්භ වූයේ 2023 වසරේ ඔක්තෝබර් මාසයේ. හමාස් සංවිධානයට අනුබද්ධ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛනවලට අනුව එදා සිට මේ දක්වා (ජූලි 31) මන්දපෝෂණයට ගොදුරු වී මියගොස් ඇති ගණන 150 ඉක්මවා තිබෙනවා.

මේ මරණවලින් වැඩි සංඛ්‍යාවක් සිදු ව ඇත්තේ 2025 වසරේ මාර්තු මාසයෙන් පසුව. ජූලි මාසයේ තත්ත්වය වඩාත් නරක අතට හැරී තිබූ අතර ලෝක සෞඛ්‍ය සංවිධානය පවසන ආකාරයට එම මාසයෙ 63 දෙනකු මන්දපෝෂණය හේතුවෙන් මරණයට පත් ව තිබෙනවා. මාසයේ මුල් සති දෙකේ පමණක් වයස අවුරුදු 5ට අඩු කුඩා දරුවන් 5,000කට ආසන්න සංඛ්‍යාවක් මන්දපෝෂණ තත්ත්වය නිසා රෝහල්ගත කර තිබූ බව ද ලෝක සෞඛ්‍ය සංවිධානය සඳහන් කරනවා.

ගාසා තීරයේ පලස්තීන ජනතාව මේ ආකාරයේ 'කුසගිනි ප්‍රශ්නයකට' ගොදුරු වී ඇත්තේ එහි මානුෂීය ආධාර බෙදා හැරීමේ ක්‍රියාවලියේ ඇති ව තිබෙන ගැටලු නිසා. ගාසා තීරය මේ වන විට මුළුමනින් ම වාගේ මානුෂීය ආධාර මත යැපෙන තැනක්. එසේ තිබියදී පසුගිය මාර්තු මාසයේ ඊශ්‍රායලය ගාසා තීරයට මේ ආධාර ඇතුළුවීම සම්පූර්ණයෙන් අවහිර කිරීමට ක්‍රියා කළා. ඒ, ඔවුන් සමග යුද වැදී සිටින ගාසාහි හමාස් සංවිධානය මත පීඩනයක් එල්ල කිරීම සඳහා. ඊශ්‍රායල ප්‍රාණ ඇපකරුවන් පිරිසක් තවමත් හමාස් සංවිධානය භාරයේ සිටින අතර ඔවුන් නිදහස් කිරීම සඳහා එම සංවිධානය පොළඹවා ගැනීම ද මේ පියවරෙහි එක් අරමුණක්.

යුද්ධය නිසා ගාසාහි වැසියන් ඒ වනවිටත් සිටියේ ආහාර හිඟයකට මුහුණදෙමින්. ඊශ්‍රායල හමුදා සහ හමාස් සටන්කරුවන් අතර සිදු වූ අවි ගැටුම් නිසා ආධාර බෙදා හැරීමේ කටයුතුවලට විශාල වශයෙන් බාධා එල්ල වී තිබුණා. එසේ තිබියදී මාර්තු මාසයේ ඊශ්‍රායලය ගාසා තීරයට ආධාර ඇතුළුවීම සම්පූර්ණයෙන් අවහිර කිරීම එම ආහාර අර්බුදය වඩාත් උග්‍ර කිරීමටයි හේතු වුණේ. ඊශ්‍රායලය ගාසා වැසියන්ගේ කුසගින්න ද ආයුධයක් කරගෙන ඇති බවට නිරන්තරයෙන් චෝදනා නැගෙන බව ද මෙහිදී අමතක කළ නොහැක්කක්.

ඊශ්‍රායලය මාර්තු මාසයේ ගත් දැඩි පියවර මේ වන විට ලිහිල් කර තිබෙනවා. මාස දෙකහමාරකට පසු ඔවුන් එම තහංචිය ලිහිල් කළේ පසුගිය මැයි මාසයේ. එහෙත් තවමත් ගාසා තීරයට මානුෂීය ආධාර ළඟා වන්නේ ඉතා ම සුළු වශයෙන්. මේ වනවිට ගාසා වැසියන් මුහුණ දී සිටින ආහාර හිඟය ජය ගැනීමටනම් ආධාර රැගත් ට්‍රක් රථ දිනකට 1,500ක්වත් ඉදිරි මාසයේ ගාසා තීරයට ඇතුළු විය යුතු යයි එහි අල්- අහ්ලි රෝහලේ අධ්‍යක්ෂ ෆදෙල් නායිම් ටික දිනකට පෙර ප්‍රකාශ කර තිබුණා. එහෙත් ජූලි 30 වන විට වනවිට ගාසා තීරය වෙත ඇතුළුවෙමින් තිබුණේ දිනකට ට්‍රක් රථ 200කටත් අඩු සංඛ්‍යාවක්. ගාසාහි සාගතයක් ඇති වීම පුදුමයක් නොවන බව මේ අනුව පැහැදිලි ව පෙනී යනවා.

බොහෝ ට්‍රක් රථ ගාසාහි දේශ සීමාව ආසන්නයේ සිර වී ඇති බව වාර්තා වුණා. එම ට්‍රක් රථ ඊශ්‍රායල හමුදා විසින් දැඩි පරීක්ෂාවට ලක් කරනු ලැබීම ඊට එක් හේතුවක්. මේ ආකාරයෙන් පරීක්ෂා කිරීමට එක් හේතුවක් වන්නේ හමාස්

සංවිධානයට අවශ්‍ය අවි ආයුධ ඇතුළු ඊශ්‍රායලයේ ආරක්ෂාවට තර්ජනයක් විය හැකි දේ මේ ට්‍රක් රථවල නොමැති බව තහවුරු කර ගැනීම. මේ පරීක්ෂා කිරීම් නිසා ආධාර බෙදාහැරීමේ ක්‍රියාදාමයේ දැඩි ප්‍රමාද සිදුවන බැව් වාර්තා වෙනවා. ඇතැම් පරිපාලනමය දුර්වලතා ද මේ ප්‍රමාදයට හේතු වන බව සඳහන්.

ආධාර රැගත් ට්‍රක් රථවලට ගාසා තීරයට ඇතුළු වීම සඳහා ඇත්තේ ප්‍රවේශ ස්ථාන කිහිපයක් පමණයි. එය ද ප්‍රමාදයට තවත් හේතුවක්.

මෙවැනි විවිධ බාධාවලින් පසුව ගාසා තීරයට ඇතුළු වන ආධාර ට්‍රක් රථ ඊළඟට තවත් ගැටලුවකට මුහුණ දෙනවා. එනම් විවිධ පාර්ශ්ව විසින් මේවායේ ඇති ආහාර සහ වෙනත් දේ පැහැර ගනු ලැබීම. මෙවැනි එක් පාර්ශ්වයක් වන්නේ මේ වනවිට දැඩි සාගින්නේ පසුවන ගාසා වැසියන්. ඔවුන් ආධාර ට්‍රක් රථ අතරමගදී නතර කර ඒවායේ ඇති භාණ්ඩ පැහැර ගන්නවා.

ආහාර ඇතුළු ආධාර පැහැර ගන්නා ආයුධ රැගත් කොල්ලකාරී කණ්ඩායම් ගැන ද වාර්තා වෙනවා. ඔවුන් මේ ට්‍රක් රථවල ඇති භාණ්ඩ පැහැරගෙන ගොස් ඒවා ගබඩා කර තබාගෙන පසුව විකුණන බවක් ද සඳහන්. මෙවැනි කණ්ඩායම් ආධාර පැහැර ගැනීම සඳහා පැමිණෙන්නේ පිහි, කඩු කිණිසි, පොරොව, පිස්තෝල වැනි ආයුධ රැගෙන බව ද මාධ්‍ය වාර්තාවල

ආධාර බෙදාහැරීම පහසු කරලීම සඳහා ගාසා තීරයේ ඇතැම් ප්‍රදේශවල හමුදා ක්‍රියාකාරකම් තාවකාලික ව නතර කිරීමට ද ඊශ්‍රායලය පසුගිය දිනවල පියවර ගත්තා. මේ වන විට ගාසා තීරයේ පවතින ආහාර හිඟයේ දරුණු බව පිළිබඳ සැලකීමේදී එම තත්ත්වය ජය ගැනීමට මේ පියවර ප්‍රමාණවත් වේවි ද යන සැකයක් බොහෝ පාර්ශ්වවලට පවතින ආකාරයක් දක්නට පුළුවන්.





දැක්වෙනවා. මෙවැනි හේතු නිසා ආහාර ඇතුළු භාණ්ඩ බෙදා හැරීම සඳහා ගාසා තීරයේ පිහිටුවා ඇති මධ්‍යස්ථාන වෙත ළඟා වන ආධාර ප්‍රමාණය අඩුයි.

පැහැර ගැනීම් වැළැක්වීම සඳහා ඊශ්‍රායල හමුදාව පැහැර ගන්නන් වෙත වෙඩි තබන බව ද නිතර අසන්නට ලැබෙන්නක්. ඊට අමතර ව ආධාර බෙදා හරින ස්ථාන අසල ද වෙඩි තැබීම් සිදුවන බවට චෝදනා එල්ල වෙනවා. මේ වෙඩි තැබීම් නිසා බොහෝදෙනා මිය යමින් සිටින බව ද වාර්තා වන්නක්. එහෙත් තමන් මේ ආකාරයෙන් සිවිල් වැසියන් වෙත වෙඩි තබන බවට එල්ල වන චෝදනා ඊශ්‍රායල හමුදාව පිළිනොගන්නා ආකාරයක් ද දක්නට පුළුවන්.

ගාසාහි ජනතාවගේ සාගිනි ප්‍රශ්නය උග්‍ර වීමත් සමග එම තත්ත්වයට එරෙහි ව ජාත්‍යන්තරයෙන් එල්ල වූ විරෝධය ද උග්‍ර වන්නට වුණා. මේ නිසා ඊශ්‍රායල පාලකයන් වෙත එල්ල වීමට පටන් ගත්තේ දැඩි පීඩනයක්. එවැනි තත්ත්වයක යම් යම් පියවර ගැනීමට ඔවුන් ක්‍රියා කරන ආකාරය දක ගන්නට පුළුවන්.

ගාසා තීරයට ගුවනින් ආධාර හෙළීමේ වැඩපිළිවෙළක් ද පටන් ගත්තා. ජෝර්දානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි රටවල් ද මෙහිදී ගුවන් යානාවලින් ආධාර හෙළූ බව වාර්තා වෙනවා. එහෙත් මෙය එතරම් සාර්ථක වැඩපිළිවෙළක් ලෙස සැලකෙන්නේ නැහැ. ඇතැම් ආධාර මලු වැටී තිබුණේ මේ වනවිට පලස්තීන වැසියන්ට තහනම් කර ඇති ප්‍රදේශවලට. ආධාර මලු මුහුදට වැටුණු අවස්ථා ගැනත් වාර්තා වෙනවා.

ආධාර බෙදාහැරීම පහසු කරලීම සඳහා ගාසා තීරයේ ඇතැම් ප්‍රදේශවල හමුදා ක්‍රියාකාරකම් තාවකාලික ව නතර කිරීමට ද ඊශ්‍රායලය පසුගිය දිනවල පියවර ගත්තා. මේ වන විට ගාසා තීරයේ පවතින ආහාර හිඟයේ දරුණු බව පිළිබඳ සැලකීමේදී එම තත්ත්වය ජය ගැනීමට මේ පියවර ප්‍රමාණවත් වේවි ද යන සැකයක් බොහෝ පාර්ශ්වවලට පවතින ආකාරයක් දක්නට පුළුවන්.

# ලෝක සැරිසර

**චන්දන මාරසිංහ**



## තලිබාන් නායකත්වයට වරෙන්තු

ජාත්‍යන්තර අපරාධ අධිකරණය තලිබාන් සංවිධානයේ ඉහළ ම නායකයන් දෙදෙනකු අත්අඩංගුවට ගැනීමට වරෙන්තු නිකුත් කළා. ඒ, කාන්තාවන්ට සහ ගැහැනු ළමයින්ට හිංසා පීඩා කිරීමේ චෝදනාවට. 2021 වසරේදී ඇෆ්ගනිස්ථානයේ බලය අල්ලා ගත් පසු තලිබාන් උත්තරීතර නායක Haibatullah Akhundzada සහ එහි අගවිනිසුරු Abdul Hakim Haqqani කාන්තාවන් හා ගැහැනු ළමයින් සම්බන්ධයෙන් මනුෂ්‍යවයට එරෙහි අපරාධ කළ බවට සනාථ වී තිබෙනවා. ඔවුන් අවුරුදු 12ට වැඩි ගැහැනු ළමයින්ට අධ්‍යාපනයට ප්‍රවේශ වීම සහ බොහෝ රැකියා කාන්තාවන්ට තහනම් කිරීම ඇතුළු සීමා ක්‍රියාත්මක කළා. ජාත්‍යන්තර අපරාධ අධිකරණය පෙන්වා දුන්නේ ලිංග භේදය පදනම් කර ගනිමින් තලිබාන්වරු කාන්තාවන්ගේ මූලික අයිතීන් සහ නිදහස අහිමිකර ඇති බව. එක්සත් ජාතීන්ගේ සංවිධානය ද තලිබාන්වරුන්ගේ එම ක්‍රියා කලාපය විවේචනය කර තිබෙනවා.

## දෙවැනි කෙටිම දිනය

පෘථිවි ඉතිහාසයේ දෙවැනි කෙටිම දිනය ජූලි 22 සටහන් කළා. පෘථිවිය වේගයෙන් භ්‍රමණය වීමයි ඊට හේතුව. දිනක් ගත වීම සඳහා පැය 24ක කාලයක් ගත වුවත් ජූලි 22 දින පැය 24කට මිලි තප්පර 1.34ක් අඩුවෙන් දිනය ගත වී තිබෙනවා. පෘථිවියේ භ්‍රමණ වේගය ස්ථාවර නැහැ. 2023 වසරේ සිදුකර ඇති අධ්‍යයනයකට අනුව හෙළි වූයේ පෘථිවියේ දිනයක් ආසන්න වශයෙන් පැය 19ක් ලෙසත් මීට පෙර පැවති බව. ඊට හේතු වී ඇත්තේ වඩදිය සහ බාදිය අතර ඇතිවන තත්ත්වයක්. 1973 පරමාණුක ඔරලෝසුව සොයාගැනීමත් සමඟ මෙතෙක් වාර්තා වූ කෙටි ම දිනය පැය 24කට මිලි තප්පර 1.5ක් ලෙස අඩුවෙන් සටහන් වී තිබෙනවා. www.timeanddata.com වෙබ් අඩවියට අනුව 2020 වසරේ සිට පෘථිවිය වේග වාර්තා වෙනස් කර ඇති අතර 2024 ජූලි 05 දින පෘථිවි භ්‍රමණය සාමාන්‍යයට වඩා මිලි තප්පර 1.66ක් සම්පූර්ණ වී තිබෙනවා. 2025 ජූලි 10 දින මෙතෙක් කෙටි ම දිනය ලෙස වාර්තා වී ඇති අතර එය මිලි තප්පර 1.36කින් දිනය සම්පූර්ණ කර තිබෙනවා. අයිස් දියවීම සහ මුහුදු මට්ටම ඉහළ යාම පෘතුවියේ භ්‍රමණයට බලපෑම් කර ඇති බව 2024 වසරේ සිදු කළ අධ්‍යයනයකින් හෙළි වී තිබෙනවා.

## ගොළුබෙල්ලන් තරග බිමට




එංගලන්තයේ Norfolk, Conghamහිදී ලෝක ගොළුබෙල්ලන් ධාවන ශූරතා තරගයක් (world Snail Racing Championsship) පවත්වා තිබෙනවා. ජූලි 19 දින පස්වරු 2.00ට ඇරඹි එය හාස්‍ය සහ සම්ප්‍රදාය මිශ්‍ර කරමින් සංවිධාන කර ඇති බවයි ජාත්‍යන්තර මාධ්‍ය පවසන්නේ. 1960 ගණන්වල සිට වාර්ෂික ව පැවැත්වෙන මේ තරගයට සෑම වසරක ම ගොළුබෙල්ලන් 200කට වැඩි සංඛ්‍යාවක් සහභාගි කරවනවා. මේ වසරේදී ජයග්‍රහණය ලැබුවේ මිනිත්තු 2 තත්පර 11ක ධාවන කාලයක් වාර්තා කළ Bilbo Sluggins ගොළුබෙල්ලා. වාර්ෂික ව එංගලන්තයේ මේ ගම්මානයට තරගකරුවන් රැගත් පිරිස සහ ප්‍රේක්ෂකයන් විශාල වශයෙන් පැමිණෙන බව සඳහන්.



## පළමු දේශගුණික සංක්‍රමණික ගිවිසුම


පැසිපික් කලාපයේ Tuvalu දූපත් සමූහය සහ ඕස්ට්‍රේලියාව අතර ලෝකයේ පළමු වරට ගිවිසුමක් ඇති කරගෙන තිබෙනවා. එය දේශගුණික සංක්‍රමණික ගිවිසුමක්. ඒ අනුව මේ පැසිපික් දූපත් ජනතාවට ඕස්ට්‍රේලියාවේ වීසා හිමිවනවා. මේ දූපත් සමූහය දේශගුණික විපර්යාස හේතුවෙන් තර්ජනයට ලක් වී අවසන්. එහි ජනගහනයෙන් 80%ක් පමණ ඕස්ට්‍රේලියාවේ ජීවත්වීම සඳහා දේශගුණික වීසාවලට ඉල්ලුම් කර තිබෙනවා. Tuvaluහි වඩාත් ජනාකීර්ණ දූපත හැඳින්වෙන්නේ Funafuti ලෙස. මේ දූපතේ බොහෝ ප්‍රදේශ රළ පහරින් අතුරුදහන් ව ඇති අතර එහි ජනගහනයෙන් 8750ක් පමණ ඕස්ට්‍රේලියාවේ වීසා ඉල්ලුම් කර තිබෙනවා. 2022 වසරේ කළ නිල සංගණනයට අනුව Tuvaluහි නිල ජනගහනය 10643ක්. ඒ අනුව ජනගහනයෙන් 82%ක් වීසා ඉල්ලුම් කර තිබෙනවා. එහෙත් වසරකට හිමි වන්නේ වීසා 280ක් පමණයි. කෙසේ වෙතත් ඉදිරි වසර 80 ඇතුළත Tuvalu දූපත් සමූහය මුහුදට යට වනු ඇති බවටයි අනාවැකි පළ වන්නේ.

## යළි උපදින සුදු කොක්කු

වඳවීමේ තර්ජනයට ලක්වූ ඩෙන්මාර්කයේ සුදු කොක්කු පැටවුන් යළි වර්ධනය වී තිබෙනවා. 2025 ජූලි මාසය වන විට ඩෙන්මාර්කයේ ගම්මානවල උපත ලබා තිබෙන්නේ සුදු කොක්කු පැටවුන් 33 දෙනෙක්. 2024 වසරේ එලෙස උපත ලබා ඇත්තේ සුදු කොක්කු පැටවුන් 15 දෙනෙක් පමණයි. 1980 ගණන්වලින් පසු වාර්තා වූ වැඩි ම සුදු කොක්කු පැටවුන් ගණන මෙය වන අතර කෘෂිකර්මාන්තයේ ව්‍යාප්තිය සහ තෙත්බිම් අහිමි වීමෙන් මේ සතුන් වඳ වීමේ තර්ජනයට ලක්වුණා.

සංරක්ෂණ උපායමාර්ග හා උණුසුම් කාලගුණය නිසා යළිත් මේ පැටවුන් උපදින බවයි වාර්තා වන්නේ.

## මෝදිගේ ඓතිහාසික සංචාරය



වසර 57කට පසුව බ්‍රසීලයේ රාජ්‍ය සංචාරයක නිරත වූ පළමු වැනි ඉන්දීය අගමැතිවරයා බවට නරේන්ද්‍ර මෝදි පත් වුණා. දෙරට අතර ශක්තිමත් රාජ්‍ය සම්බන්ධතා ගොඩනඟා ගැනීමට මේ සංචාරය ඉවහල් වී තිබෙනවා. 2025 ජූලි මස 06-07 දෙදින බ්‍රසීලයේ පැවති බ්‍රික්ස් සමුළුවට ද සහභාගි වූ අගමැති නරේන්ද්‍ර මෝදි මෙලෙස සංචාරයට එක් වුණේ බ්‍රසීල ජනාධිපති ලූලා ද සිල්වාගේ ආරාධනයකට. ඛණිජ සම්පත්, ආරක්ෂාව, දේශගුණික ඔරොත්තු දීම, ඩිජිටල් සහයෝගිතාව සහ ගෝලීය කටයුතු සම්බන්ධයෙන් දෙරට නායකයන් අතර අදහස් හුවමාරු වුණා. ඉන්දීය විදේශ ප්‍රතිපත්තිය මෙන් ම එරට ගෝලීය භූමිකාව පිළිබඳ ව ද එහිදී අදහස් හුවමාරු වී තිබෙනවා.

## වීසා නොමැති ගමනාන්ත

Henley විදේශ ගමන් බලපත්‍ර දර්ශකයේ (Henley Passport Index) අලුත් ම වාර්තාව නිකුත් වුණා. මේ දර්ශකයේ පළමු වැනි ස්ථානය හිමි ව තිබෙන්නේ සිංගප්පූරුවට. ඔවුන් රටවල් 193කට වීසා රහිත ගමන් පහසුකම් සපයා තිබීමයි ඊට හේතුව. ජපානය සහ දකුණු කොරියාව දෙවැනි ස්ථානයේ පසුවනවා. ඒ, රටවල් 190කට වීසා රහිත ගමන් පහසුකම් සලසමින්. ඩෙන්මාර්කය, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය සහ අයර්ලන්තය තුන් වැනි ස්ථානයේ පසු වන්නේ රටවල් 189කට වීසා රහිත ගමන් පහසුකම් සැලසීම හේතුවෙන්. 2024 වසරේ 85 වැනි ස්ථානයේ සිටි ඉන්දියාව 2025 වසරේ 77 වැනි ස්ථානයට පත් ව තිබෙනවා. ඔවුන් විසා රහිත ගමන් පහසුකම් ලබාදෙන රටවල් සංඛ්‍යාව 59ක්. මේ දර්ශකයේ පහළ ම සිටින්නේ ඇෆ්ගනිස්ථානය. එහි පුරවැසියන්ට වීසා බලපත්‍ර නොමැති ව ගමනාන්ත 25කට ප්‍රවේශ විය හැකියි. ශ්‍රී ලංකාව රටවල් 42කට වීසා රහිත ගමන් පහසුකම් සපයා මේ දර්ශකයේ 91 වැනි ස්ථානයට පත් ව තිබෙනවා.

## අනතුරින් මිදුණු ලෝක උරුම



අප්‍රිකාවේ ස්ථාන තුනක් ලෝක උරුම අනතුරේ ලැයිස්තුවෙන් ඉවත් කිරීමට යුනෙස්කෝ සංවිධානය තීරණය කළා. ඒ, ජූලි 09 දින පැරිසියේ පැවති ලෝක උරුම කමිටුවේ 47 වැනි සැසි වාරයේදී. මැඩගස්කරයේ Atsinanana වැසි වනාන්තරය, ඊජිප්තුවේ Abumena වන්දනා ස්ථානය සහ ලිබියාවේ Ghadames පැරණි නගරය ඒ අතරට අයත්. යුනෙස්කෝ සහාය ඇති ව මේ ස්ථානවලට ඇති තර්ජන ඉවත් කිරීමට එම රටවල් පියවර ගෙන තිබෙනවා. ඒවායේ සංස්කෘතික හා පාරිසරික වටිනාකම් ආරක්ෂා කිරීමට පියවර ගෙන ඇති බවයි වාර්තා වන්නේ. අප්‍රිකාවේ ලෝක උරුම ආරක්ෂා කිරීමට විශාල වශයෙන් ක්‍රියා කරන බව යුනෙස්කෝව සඳහන් කළා. Atsinanana වැසි වනාන්තරය 2007 වසරේදීත් ඊජිප්තුවේ Abumena වන්දනා ස්ථානය 1979 වසරේදීත් ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කර තිබෙනවා. ලිබියාවේ Ghadames පැරණි නගරය ලෝක උරුම අවදානම් ලැයිස්තුවට ඇතුළත් කර තිබෙන්නේ 2016 වසරේදී.



## සාම කතාබහ

තායිලන්තය හා කාම්බෝජය අතර දේශසීමාවේ Prasat Ta Moan Thom පන්සල අසල ගැටුම් හට ගත්තා. අග්නිදිග ආසියාවේ මේ අසල්වැසියන් අතර දීර්ඝ කාලයක සිට මතභේද පවතිනවා. එහි ප්‍රතිඵලයක් ලෙසයි යළි ගැටුම් ඇති වුණේ. තායිලන්තය චෝදනා කරන්නේ කාම්බෝජය දේශසීමාවට නිරීක්ෂණ ඩ්‍රෝන යානා යොමු කළ බවත් එරට හමුදා බර අවි සහ දිගු දුර රොකට් සමඟ පහර දුන් බවත්. කාම්බෝජය පවසන්නේ තායිලන්තය මුලින් ම පහර දුන් බව. ශෙල් ප්‍රහාර එල්ල කළ බවත් ඔවුන් සඳහන් කරනවා. මේ ගැටුම් නතර කරන ලෙස ලෝක ප්‍රජාව දෙපාර්ශ්වයෙන් ම ඉල්ලීමක් කර ඇති අතර ගැටුම් නවත්වන්නට, මැලේසියාව මැදිහත්වීමෙන් සාම සාකච්ඡා ආරම්භ කිරීමට රටවල් දෙක ම එකඟ වී තිබෙනවා.



## යුනෙස්කෝවෙන් යළි ඉවතට යන ඇමරිකාව

ට්‍රම්ප් පරිපාලන යටතේ ඇමරිකාව යළිත් යුනෙස්කෝවෙන් ඉවත්වීමට තීරණය කළා. ඇමරිකාව චෝදනා කරන්නේ යුනෙස්කෝ සංවිධානය මතභේදාත්මක සංස්කෘතික සහ සාමාජයේ අරමුණ වෙනුවෙන් ක්‍රියා කරන බව. මේ තීරණය

කනගාටුදායක බවත් අපේක්ෂා කළ දෙයක් බවත් යුනෙස්කෝ සංවිධානය සඳහන් කළා. යුනෙස්කෝ සංවිධානයේ සාමාජික රටවල් ගණන 194ක්. ඇමරිකාව ගත් තීරණය 2026 වසරේ දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක කිරීමටයි නියමිත. ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව පවසන්නේ යුනෙස්කෝවේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ගෝලීය න්‍යාය පත්‍රය ඇමරිකාවේ විදේශ ප්‍රතිපත්තියට පටහැනි බව. 2011 වසරේදී යුනෙස්කෝවට පලස්තීනය ඇතුළත් කිරීම ගැටලුසහගත බව ඇමරිකාව ප්‍රකාශ කළා. යුනෙස්කෝ අයවැයෙන් 8%ක් පමණ ලැබෙන්නේ ඇමරිකාවෙන්. මේ තීරණය සමග අරමුදල් විවිධාංගීකරණයට ක්‍රියා කරන බව යුනෙස්කෝව සඳහන් කළා. 2017 වසරේදී ජනාධිපති ට්‍රම්ප් පළමු ධුර කාලයේ ද ඇමරිකාව යුනෙස්කෝවෙන් ඉවත් කර ගත් අතර ජෝබයිඩ්න් පරිපාලනය යටතේ එම තීරණය වෙනස් කළා. 2011 වසරේදී ඔබාමා පරිපාලනය ද ඇමරිකාව යුනෙස්කෝවට වෙන්කර තිබූ ඩොලර් මිලියන 60ක අරමුදල් අත්හිටුවා තිබෙනවා.




## ප්‍රංශය පිළිගන්නා පලස්තීන රාජ්‍යය

රාජ්‍යයක් ලෙස පලස්තීනය පිළිගන්නා බව ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රෝන් ප්‍රකාශ කළා. සැප්තැම්බර් මාසයේදී නිල වශයෙන් එය සිදු වෙනවා. නිව්යෝර්ක්හි පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයේදී විධිමත් නිවේදනය නිකුත් කරන බවයි ප්‍රංශ ජනාධිපතිවරයා පවසන්නේ. ගාසා තීරයේ යුද්ධය අවසන් කර සිවිල් වැසියන් බේරා ගැනීම මෙහි මූලික අවශ්‍යතාවක්. ප්‍රංශයේ තීරණය පිළිගන්නා බව පලස්තීන බලධාරීන් ප්‍රකාශ කර තිබෙනවා. කෙසේ වෙතත් ඊශ්‍රායලය සඳහන් කරන්නේ එම තීරණය හෙළා දකින බව. පලස්තීන ජනාධිපතිවරයාට තීරණය තහවුරු කරන ලිපියක් යොමු කළ බව ප්‍රංශ ජනාධිපතිවරයා සඳහන් කළා.



## චීන දෙමාපියන්ට අරමුදල්

චීනය උපත් අනුපාතය ඉහළ නැංවීම සඳහා දෙමාපියන්ට අරමුදල් ලබාදීමට තීරණය කළා. ඒ අනුව වයස අවුරුදු 03ට අඩු සෑම දරුවකුට ම වසරකට යුවාන් 3600ක් පිරිනැමෙනු ඇති. චීනයේ උපත් අනුපාතය අඩුවීමයි ඊට හේතුව. ලෝකයේ දෙවැනි විශාලතම ආර්ථිකය සහිත චීනය ජන විකාශන අර්බුදයකට මුහුණදෙන බැවින් මෙසේ දරුවන් ලැබීමට ජනතාව දිරිමත් කෙරෙනවා. ප්‍රකාශයට පත් කළ මේ යෝජනා ක්‍රමය අනුව දෙමාපියන්ට ලැබෙනු ඇත්තේ එක් දරුවකුට යුවාන් 10800ක් දක්වා මුළු මුදලක්. මේ ප්‍රතිපත්තිය 2025 වසරේ සිට පසුකාලීන ව ක්‍රියාත්මක වනු ඇති. 2022 සහ 2024 අතර කාලයේ උපත ලැබූ දරුවන් සිටින පවුල්වලට ද අර්ධ සහනාධාර සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාව තිබෙනවා. චීනයේ වයස අවුරුදු 17 දක්වා දරුවකු ඇතිදැඩි කිරීමට සාමාන්‍යයෙන් ඩොලර් 75700ක් පමණ වැය වන බව අධ්‍යයනයකින් හෙළි වී තිබෙනවා. ජනවාරි මාසයේ නිල සංඛ්‍යාවලින් පෙනී ගියේ 2024 වසරේ චීනයේ ජනගහනය අඛණ්ඩ ව තුන් වැනි වරටත් පහත වැටී ඇති බව. එම වසරේදී චීනයේ දරුවන් මිලියන 9.54ක් උපත ලබා තිබෙන අතර බිලියන 1.4ක ජනගහනය වේගයෙන් වයස්ගත වෙමින් පවතින හේතුවෙන් ගැටලු මතු ව ඇති බවයි චීන බලධාරීන් පෙන්වා දෙන්නේ.



## සෙලවුණු 'පැසිපික් ගිනි වළල්ල'

රුසියාවේ නැගෙනහිර වෙරළට ඔබ්බෙන් Kamchatka අර්ධද්වීපය ආශ්‍රිත ව රිච්ටර් පරිමාණ 8.8ක භූ කම්පනයක් (ජූලි 30) සිදුවුණා. දැනට වාර්තා වී තිබෙන ආකාරයට 1960 වසරෙන් පසුව වාර්තා වූ 6 වැනි විශාලතම භූ කම්පනයයි එය. ඉන් බලපෑම් එල්ල වුණේ පැසිපික් කලාපය ආශ්‍රිත ව ලක්ෂ 20කට වැඩි පිරිසකට. විශාල පිරිසකට ආරක්ෂිත ස්ථානවලට යොමු වන ලෙස ජපානය උපදෙස් ලබා දුන්නා. චීනය, පිලිපීනය, ඉන්දුනීසියාව, නවසීලන්තය, පේරු, චිලී, මෙක්සිකෝ, කොස්ටරිකා සහ නිකරගුවා වැනි රටවලවලට සුනාමි අනතුරු ඇඟවීම් නිකුත් කෙරුණා. පැසිපික් සාගරය වටා විහිදෙන මේ කලාපය 'පැසිපික් ගිනි වළල්ල' ලෙස හඳුන්වන්නේ භූමිකම්පා හා ගිනි කඳු හේතුවෙන්. ලෝකයේ භූමිකම්පාවලින් 80%ක් පමණ සිදු වන්නේ මේ කලාපයේ.

# සුව සියවසක්

බිනූ දිලාරා ගමගේ




**‘දක්ෂ, මානුෂික, ආචාරශීලී සහ සුරක්ෂිත සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන් විසින් රෝගීන්ට ප්‍රතිකාර කරන සහ රැක බලා ගන්නා සෞඛ්‍ය පද්ධතියක්’ යන දැක්ම පෙරදැරි ව ‘දීප ව්‍යාප්ත සෞඛ්‍යාරක්ෂණ අධ්‍යාපනයේ සහ වෘත්තියේ ප්‍රමිති සකස් කිරීම, පවත්වාගෙන යාම සහ ඉහළ නැංවීම මගින් මහජනතාවගේ සෞඛ්‍ය හා සුරක්ෂිත බව ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම’ මෙහෙවර කර ගත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව නොබෝදා (ජූලි 05) සියවසක ගමන්මග (1925-2025) ආවර්ජනය කළා. මෙවර දෙසතිය කවරයේ කතාවේ කතාබහ සිදු වන්නේ ඒ පිළිබඳ විමසුමක යෙදෙමින්.**

## ආරම්භය හා නීතිමය පසුබිම

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (Sri Lanka Medical Council) යනු සෞඛ්‍ය සේවා සපයන්නන් ආරක්ෂා කිරීම සඳහා ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයක්. එහි ලියාපදිංචි සෞඛ්‍ය වෘත්තිකයන් විසින් අධ්‍යයන හා වෘත්තීය ප්‍රමිති, විනය සහ ආචාරධර්ම පිළිවෙත් පවත්වාගෙන යාම සහතික කළ යුතුයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් සහ අනෙකුත් සෞඛ්‍ය සේවකයන් නිසි ලෙස පුහුණුව ලබා ඇති බවත් සුදුසුකම් ලත් බවත් සදාචාරත්මක ව හැසිරෙන බවත් සහතික කිරීම දෙයාකාරයකින් සිදු වෙනවා. එක් ආකාරයක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සියලු ම වෛද්‍යවරුන් සහ සෞඛ්‍ය වෘත්තිකයන්ට නියමිත සුදුසුකම් සහ පුහුණුවක් ඇති බවත් අවශ්‍ය විභාග සමත් වී ඇති බවත් සහතික කිරීමෙන් සිදු වන අතර අනෙක එලෙසින් ලියාපදිංචි සෞඛ්‍ය වෘත්තිකයන් රෝගීන්ට ආරක්ෂිත ව ගෞරවනීය ව ප්‍රතිකාර කරන බවත් දැඩි ව ආචාරධර්ම නීති අනුගමනය කරන බවත් සහතික කිරීමෙන් සිදු වෙනවා.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ආරම්භ වන්නේ 1925 වසරේ ජූනි 25 දින බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේ පවත්වන ලද එහි පළමු සැසිවාරයත් සමඟ. එය පළමුවෙන් හඳුන්වා තිබෙන්නේ ‘ලංකා වෛද්‍ය සභාව’ (Ceylon Medical Council) විදිහට. ශ්‍රී ලංකාව 1948 වසරේදී නිදහස ලබා, පසු ව 1972 වසරේදී ජනරජයක් බවට පත් වීමෙන් අනතුරු ව එය ‘ශ්‍රී ලංකා වෛද්‍ය සභාව’ (Sri Lankan Medical Council - SLMC) යනුවෙන් නම් කළා. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට ඒ සඳහා වන ව්‍යාවස්ථාපිත බලය හිමි වන්නේ 1927 අංක 26 දරන වෛද්‍ය ආඥා පනතින් සහ එහි පසුකාලීන සංශෝධන සහ ආඥා පනත යටතේ ගැසට් කරන ලද රෙගුලාසිවලින්.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ආරම්භක සභාපතිත්වය වෛද්‍ය එන්.ඩී. වෝකර් (Dr. N.D. Walker 1925-1926) දරන ලද අතර පසුව එයට නායකත්වය සැපයීම ලුතිනන් කර්නල් සී.ඩී. මයිල්ස් (Lt. Col C.D. Myles 1927-1929), වෛද්‍ය ජේ.ඕ.බී. වැන් ලැන්ගන්බර්ග් (Dr. J.O.B. Van Langenburg 1929-1930), වෛද්‍ය ආර්.සී.බී.ඊ. බරියර්ක්ලිෆ් (Dr. R.C.B.E. Briercliffe 1930-1937), වෛද්‍ය සී.ටී. ගුණසේකර (Dr. S.T. Gunasekara 1937-1941), වෛද්‍ය එස්.එෆ්. චෙල්ලප්පා (Dr.S.F. Chellappa 1941-1949), වෛද්‍ය ඩබ්ලිව්.ජී. වික්‍රමසිංහ (Dr. W.G. Wickramasinghe 1949-1953), වෛද්‍ය නිකලස් ආටිගල (Dr. N. Attygalle 1964-1969), මහාචාර්ය කාලෝ ෆොන්සේකා (Prof. Carlo C. Fonseka 2012-1017) යනාදී වශයෙන් සිදු ව තිබෙනවා. එහි 21 වැනි සභාපතිත්වයයි වත්මන් සභාපති විද්‍යාජ්‍යෝති මහාචාර්ය වජිර එච්. ඩබ්ලිව්. දිසානායක දරන්නේ.

ශ්‍රී ලංකාවේ වෛද්‍ය නියාමයේ ආරම්භය සිදු වන්නේ වෛද්‍ය අධ්‍යාපනයේ ආරම්භ වීමත් සමඟ. ඒ අනුව 1870 ජුනි මස 01 දින සිසුන් 25 දෙනකු ඇතුළත් කර ගනිමින් ශ්‍රී ලංකාවේ පැරණිතම වෛද්‍ය විද්‍යාලය වන කොළඹ වෛද්‍ය විද්‍යාලය ආරම්භ වෙනවා. එහිදී ඔවුන්ට වෛද්‍ය විද්‍යාව සහ ශල්‍යකර්ම පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා දෙනවා. එතෙක් කොළඹ වෛද්‍ය විද්‍යාලය ලෙසින් හැඳින් වූ මේ වෛද්‍ය අධ්‍යාපන ආයතනය, 'ලංකා වෛද්‍ය විද්‍යාලය' ලෙසින් වෙනස්වෙමින් විධිමත් වෛද්‍ය අධ්‍යාපනයක් සඳහා මූලික අඩිතාලම සැපයීමටත් 1880 වසරේ සිට ක්‍රියා කළා. එහි පළමු පියවරක් ලෙස එතෙක් වෛද්‍ය විද්‍යාව හා ශල්‍යකර්ම පිළිබඳ ඩිප්ලෝමාව හදාරන ලද සිසුන් ලියාපදිංචි කර ඔවුන්ට වෛද්‍ය විද්‍යාව සහ ශල්‍යකර්ම පිළිබඳ බලපත්‍රය (Licentiate in Medicine and Surgery - L.M.S.) ප්‍රදානය කෙරුණා. පසුව 1905 වසරේදී වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ ආඥා පනත (The Medical Registration Ordinance) සම්මත කර ගන්නා ලද අතර L.M.S. බලපත්‍රලාභී පුද්ගලයන් වෛද්‍ය වෘත්තිකයන් ලෙස පිළිගෙන ලංකා වෛද්‍ය විද්‍යාල කවුන්සිලය (Ceylon Medical College Council - CMCC) විසින් වෛද්‍ය විද්‍යාව හා ශල්‍යකර්ම ප්‍රායෝගික ව සිදු කිරීම සඳහා ලියාදිංචි කර ගනු ලබනවා. ඒ අනුව 1905 වෛද්‍ය වෘත්තිකයන් ලියාදිංචි කිරීමේ ආඥා පනත යටතේ ලියාපදිංචි වෘත්තිකයකුගේ නම ලියාපදිංචි නාම ලේඛනයෙන් මකා දැමීමට හෝ ඉවත් කිරීමට හෝ විධිවිධාන හිමි වෙනවා.

මෙහි ක්‍රමික විකාශනයත් සමඟ රජයේ ඇපොතෙකරි (Apothecaries) සහ වතු වෛද්‍ය සහායකයන්ට (Estate Dispensers) වෛද්‍ය විද්‍යාව සහ ශල්‍යකර්ම ප්‍රායෝගික ව සිදු කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට යටත් ව ලියාපදිංචිය ලබා දීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම 1908 අංක 36 දරන (සංශෝධන) වෛද්‍ය ආඥා පනතෙන් සිදු කෙරුණා. එමෙන් ම 1915 වසරේදී දන්ත වෛද්‍යවරු ලියාපදිංචි කිරීමේ ආඥා පනත හඳුන්වා දීමත් 1920 අංක 02 දරන වින්නඹු මාතාවන් ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ 1924 වසරේ සිට වින්නඹු මාතාවන් ලෙස ලියාපදිංචි කිරීමේ සුදුසුකම කාන්තාවන්ට පමණක් සීමා කරමින් ආරම්භ කෙරෙනවා. විනය හේතු මත වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ නාම ලේඛනයෙන් ලියාපදිංචිය මකා දැමීමට පවා විධිවිධාන සලස්වා තිබෙන 1927 අංක 26 දරන වෛද්‍ය ආඥා පනතින් ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම සිදු කරන ලද අතර එය ඖෂධවේදීන් හා ඖෂධ රසායනඥයන්ට පමණක් සීමා වුණා. වර්තමානයේ විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා ක්‍රියාත්මක වන 1990 විනය නියෝග ක්‍රියාපටිපාටිය 1993 මාර්තු මස 10 දින රජයේ අංක 757/7හි ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කිරීම සිදු වූ තවත් වැදගත් ඓතිහාසික සිදුවීමක්. 1942 විශ්වවිද්‍යාල ආඥා පනතෙන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පිහිටුවීමෙන් පසුව, එම විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන MBBS සහ BDS උපාධි කොළඹ වෛද්‍ය විද්‍යාල කවුන්සිලය (CMCC) සඳහා ලියාපදිංචි කර ගන්නා මූලික සුදුසුකම බවට පිළිගැනෙනවා. ඒ අනුව 1955 අංක 23 දරන වෛද්‍ය (සංශෝධන) පනතෙන් සීමාවාසික කාලයක් සේවය කිරීමෙන් පූර්ව ලියාපදිංචි පළපුරුද්ද ලබා ගැනීම සඳහා වෛද්‍ය උපාධිධාරින් තාවකාලික ව ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සලසා තිබෙනවා. මෙහි ලියාපදිංචිය සඳහා සුදුසුකමක් ලෙස 'යහපත් චරිතයක්' වෛද්‍යවරයකුට තිබීම පවා අවශ්‍ය බවට ඇතුළත්.

1946 අංක 25 දරන වෛද්‍ය (සංශෝධන) පනතෙන් උපාධියක් ප්‍රදානය කිරීමේදී සහ වෙනත් හේතු මත ලියාපදිංචි සඳහා පසුව සංශෝධන සිදු වූ විට වෛද්‍ය වෘත්තිකයන් තාවකාලික ව ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සලසා තිබෙනවා. එසේ ම 1961 අංක 37 දරන වෛද්‍ය (සංශෝධන) පනතෙන් රටට සේවය කිරීම සඳහා රජය විසින් ආරාධනා කරන ලද වෛද්‍ය වෘත්තිකයන්, දන්ත වෛද්‍යවරුන් සහ හෙදියන් තාවකාලික ව ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලසීම ලද අතර පසු ව මෙය 1997 අංක 31 දරන වෛද්‍ය (සංශෝධන) පනතෙන් සංශෝධනය කරමින් ලියාපදිංචිය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්, සෞඛ්‍ය









පැරණි වෛද්‍ය සභා ගොඩනැගිල්ල



වත්මන් වෛද්‍ය සභා ගොඩනැගිල්ල



1907 පළමු වරට සෞඛ්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම

අධ්‍යක්ෂ ජනරාල් හෝ වෛද්‍ය පීඨයක පීඨාධිපතිවරයකු විසින් සිදු කරනු ලබන නිර්දේශය අවශ්‍ය බව සැලකෙනවා. එහිදී මේ ලියාපදිංචිය මාස 12ක කාලයක් සඳහා පමණක් සීමා වන අතර කවුන්සිලය විසින් විනිශ්චය කරනු ලබන්නේ අයදුම්කරුගේ කුසලතා සහ දැනුම.

1965 අංක 16 දරන වෛද්‍ය (සංශෝධන) පනතෙන් ශ්‍රී ලංකාවෙන් පිටත වෛද්‍ය විද්‍යාලයකින් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියකුට කවුන්සිලය විසින් පවත්වන ලද විශේෂ විභාගය සහ සීමාවාසික පුහුණුවකින් පසුව කවුන්සිලයේ ලියාපදිංචිය ලබා ගැනීමට අවකාශය සලසා දී තිබෙනවා. ඒ සඳහා පවත්වන විශේෂ විභාගය මුල්කාලීන ව 'Act 16' ලෙසින් හැඳින්වුවත් වර්තමානයේ එය හඳුන්වන්නේ වෛද්‍ය විද්‍යාවෙහි ප්‍රායෝගික ව නියැළීම සඳහා ලියාපදිංචි වීමේ විභාගය (Examination of Registration to Practice Medicine - ERPM) සහ දන්ත ශල්‍යකර්ම සිදු කිරීම සඳහා ලියාපදිංචි වීමේ විභාගය (Examination for Registration to Practice Dental Surgery - ERPDS) ලෙසින්. 1987 අංක 30 දරන වෛද්‍ය (සංශෝධන) පනතෙන් ද අතුරු වෛද්‍ය සහායකයන් ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සලසා තිබෙනවා. මේ කාණ්ඩයට ඇතුළත් වන වෘත්තිකයන් ලෙස විකිරණවේදීන් (Radiographers), වෛද්‍ය රසායන තාක්ෂණවේදීන් (Medical Laboratory Technologists), භෞතික චිකිත්සකයන් (Physiotherapists), වෘත්තීය චිකිත්සකයන් (Occupational Therapists), විද්‍යුත් හෘද පටිගත කරන්නන් (Electrocardiograph Recordist), ශ්‍රව්‍ය විද්‍යාඥයන් (Audiologists), සායනික කායික විද්‍යාඥයන් (Clinical Physiologists), කථන චිකිත්සකයන් (Speech Therapists), කයිරොපොඩිස්ට්වරුන් (Chiropodists), ආහාරවේදීන් (Dietitians), අක්ෂි සහායකයන් (Ophthalmic Auxiliaries) සහ සායනික මනෝවිශ්ලේෂඥයන් (Clinic Psychologists) හඳුනා ගැනීමට පුළුවන්.

1996 අංක 15 දරන වෛද්‍ය (සංශෝධන) පනතෙන් ශ්‍රී ලංකාවෙන් පිටත වෛද්‍ය විද්‍යාලයකින් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා ඇති සහ කවුන්සිලය පිළිගත් ශ්‍රී ලංකා පුරවැසියන් ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන පවතිනවා. 1987 අංක 30 දරන වෛද්‍ය (සංශෝධන) පනතෙන් වසර පහක කාල පරතරයක් දක්වා ලියාපදිංචිය අලුත් කිරීමේ කාල සීමාව දිගු කිරීමටත් 1987 අංක 30 දරන වෛද්‍ය (සංශෝධන) පනතෙන් රාජ්‍ය සේවයේ වෛද්‍ය නිලධාරීන් ලෙස සේවය කරන පුද්ගලයන්ට එම රැකියා කාලයේ ලියාපදිංචිය ලබා දීමටත් විධිවිධාන සැලසීම දක්නට පුළුවන්. 2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන) පනතෙන් වෛද්‍ය සහ දන්ත වෛද්‍ය විශේෂඥයන් ලියාපදිංචි කිරීම සඳහාත් 1998 අංක 40 දරන වෛද්‍ය (සංශෝධන) පනත විකිරණවේදීන්, වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදීන්, භෞතික චිකිත්සකයන් සහ වෘත්තීය චිකිත්සකයන් වෛද්‍ය විද්‍යාවට අතිරේක වෘත්තීන් ලෙස ලියාපදිංචි කිරීමට ක්‍රියා කරන අතර ඔවුන් අතුරු වෛද්‍ය සහායක කණ්ඩායමෙන් ඉවත් කෙරුණා.

## කාර්යභාරය

නියාමන භාවිත සහ ක්‍රමවේද සංවර්ධනය කිරීමෙන් සෞඛ්‍ය සේවා වෘත්තිකයන් විසින් ආරක්ෂිත හා ඵලදායී සෞඛ්‍ය සේවා සැපයීමට දායක වීම; ගෝලීය වශයෙන් පිළිගත් විශිෂ්ට ප්‍රතිඵල ඉලක්ක කරගත් සෞඛ්‍ය සේවා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමෝපාය හා මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම; ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වෛද්‍ය අධ්‍යයන පාඨමාලා විනිවිදභාවයකින් යුතු ව ප්‍රතීතනය කිරීමෙන් සහතික කිරීම; සෞඛ්‍ය සේවා හා සම්බන්ධ වෛද්‍ය වෘත්තිකයන්ගේ විනය පවත්වාගෙන යාම; ස්වාභාවික යුක්තිය පිළිබඳ මූලධර්ම පවත්වා ගනිමින් සියලු විනය පරීක්ෂණවලදී සාධාරණ නඩු විභාග අවස්ථා ලබා දීම; සෞඛ්‍ය සේවා වෘත්තිකයන් ලියාපදිංචි කිරීම, සහතික කිරීම සහ සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ගේ

නිපුණතා තක්සේරු කිරීම, වලංගු කිරීම සහ තහවුරු කිරීම; තොරතුරු රැස් කිරීම, කළමනාකරණය සහ බෙදා හැරීම; සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ විමසීම්වලට ප්‍රතිචාර දැක්වීම; සෞඛ්‍ය පහසුකම් භාවිත කරන පුරවැසියන්ගේ අයිතිවාසිකම් සහ සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කිරීම; කඩදාසි රහිත, පරිසර හිතකාමී ලෙස කාර්යක්ෂමතාවෙන් යුතු පරිපාලනයක් පවත්වාගෙන යාම ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෙතින් සිදුවන කාර්යභාරයට අයත්.

සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ගේ ප්‍රවීණත්වය පවත්වාගෙන යාම සඳහා ද වෛද්‍ය සභාව විසින් ක්‍රියාමාර්ග ගණනාවක් ගනු ලබනවා. ඒ අනුව ජාත්‍යන්තර ප්‍රමිති සහ ශ්‍රී ලාංකික ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා යන දෙක ම පනදම් කර ගනිමින් වෛද්‍ය සභාව වග බලා ගන්නේ සෑම අංශයක ම සෞඛ්‍ය සේවකයන් සඳහා වන ප්‍රමිති නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමටත්. සෞඛ්‍ය සේවකයන් පුහුණු කරන ආයතනවල පවත්වාගෙන යන ප්‍රමිති, සභාවේ ලියාපදිංචි වීමට පෙර සපුරා ගත යුතු සුදුසුකම් හා ප්‍රමිති වන අතර නවීන විද්‍යාවට හා තාක්ෂණයට අනුගත ව ක්‍රියා කරන බවට නිරන්තර සමාලෝචනයක් මේ ප්‍රමිති අනුව සිදු කෙරෙනවා. එසේ ම වෘත්තිකයකු ලෙස ක්‍රියා කිරීමට පෙර වෛද්‍ය සිසුවකුට තම වෘත්තීය සුදුසුකම් සපුරාලිය හැකි බවට සහතික වන ආකාරයේ අධ්‍යාපනයක් හා පුහුණුවක් ලැබෙන බවට තහවුරු කිරීමට අදාළ පුහුණු ආයතන සමඟ කටයුතු කෙරෙනවා. වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමටනම් එලෙසින් ලබන වෛද්‍ය අධ්‍යාපනය හා පුහුණුව නොකඩවා අඛණ්ඩ ව සිදු කර ඇති බවට සහතික කරන්නටත් ලබා ගන්නා පුහුණුව ප්‍රයෝජනවත් හා උසස් තත්ත්වයේ බවට සහතික කරන්නටත් මේ වනවිට පියවර ගනිමින් සිටිනවා. මෙයට පුද්ගල සැසි, මාර්ගගත පාඨමාලා, සේවා ස්ථානවල පුහුණුව වැනි විවිධ ආකාරයේ ඉගෙනුම් ඇතුළත්.

සෞඛ්‍ය වෘත්තිකයන් ක්‍රියා කරන ආකාරය පිළිබඳ දැඩි අවධානයක් යොමු කිරීමටත් වෛද්‍ය සභාව ක්‍රියා කරනවා. වෛද්‍ය එච්.ඩී.බී.හේරත් සඳහන් කරන්නේ එහිදී ලියාපදිංචි වෘත්තිකයන්ට එරෙහි ව පැමිණෙන පැමිණිලි, සභාව ඉතා පරීක්ෂාවෙන් අධ්‍යයනය කර අදාළ වෘත්තිකයන් නිවැරදි මඟට ඒමට අවශ්‍ය නීතිමය පියවර ගන්නා බව. එවැනි සිදුවීමක් අනෙකුත් වෘත්තිකයන්ගෙන් සිදු නොවීමට අවශ්‍ය පියවර ගන්නා බවත් ඔහු පවසනවා. සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ගේ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා ලබා ගත හැකි අවස්ථා පුළුල් කරමින් වෛද්‍ය සභාව සෞඛ්‍ය අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල, වෘත්තීය කණ්ඩායම් සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ එක් ව විවිධ ඉගෙනුම් ක්‍රම අත්හදා බැලීමට පියවර ගැනීමත් සුවිශේෂත්වයක්. සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ට තමන්ගේ ඉගෙනීම් කිසිදු විටෙක අත්හැර නොදමන, නතර නොකරන හැදියාවක් ප්‍රවර්ධයට වෛද්‍ය සභාව ක්‍රියා කරන බව සඳහන් කරමින් වෛද්‍ය හේරත් පෙන්වා දෙන්නේ එහිදී සෞඛ්‍ය සේවා වෘත්තිකයන් පර්යේෂණ, නායකත්ව වැඩසටහන්, සෞඛ්‍ය ප්‍රතිපත්ති සංවර්ධනය යනාදියට පවා සහභාගි කරවා ගැනීම ඔවුන්ගේ අභිලාෂ වන බව.

## සියවසක අභිමානය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අනුර කුමාර දිසානායක ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සියවස් සැමරුම් උත්සවයට සමගාමී ව



සමරු ඵලකය පිළිගැන්වූ මොහොත



සියවස් සමරු මුද්දරය නිකුත් කරමින්


සැමරුම් උලෙලේ විචිත්‍රත්වය


සමරු පණිවිඩයක් නිකුත් කළා. එහිදී ඔහු සඳහන් කරන්නේ ශ්‍රී ලංකාව නොමිලේ මහජනයාට සපයන සෞඛ්‍ය සේවාව සියලු ම පුරවැසියන්ට ජාතික අභිමානයක් වන බව. ශ්‍රී ලංකා රජය උසස් සහ ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පවත්වා ගැනීම වෙනුවෙන් හා ඒ සඳහා මහජනතාවට ඇති ප්‍රවේශය තහවුරු කිරීමටත් දැඩි ව කැප වී සිටිනවා. එහිදී සියවසක් තිස්සේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් ඉටු වූ කාර්යභාරය අගයන ජනාධිපතිවරයා වෛද්‍ය වෘත්තිය නියාමනයේදී සහ රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී අඛණ්ඩතාව පවත්වා ගැනීමට අවශ්‍ය නායකත්වයක් ඉන් ලැබුණ බවටත්; සභාවේ නොමඳ කැපවීම නිසා ජනතාවගේ සෞඛ්‍ය හා යහපැවැත්ම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබාදෙන දක්ෂ, සදාචාරවත්, හොඳින් පුහුණුව ලත් සෞඛ්‍ය වෘත්තිකභාවයක් සෞඛ්‍ය සේවාවේ තහවුරු වන බවටත් ලබා දුන්නේ ඉහළ සහතිකයක්. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය සිය සමරු පණිවිඩයේ සඳහන් කරන්නේ ශ්‍රී ලංකාවේ වෛද්‍ය ක්ෂේත්‍රය කෙරෙහි බොහෝ දෙනාගේ විශ්වාසය හා සුරක්ෂිත බව තහවුරු කරන්නට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මෙතෙක් තම ගමන්මගේ ලබාගත් ජයග්‍රහණ හේතු වූ බව. අනාගතයේදී අපට වැලඳ ගැනීමට සිදුවන, ශීඝ්‍රයෙන් දියුණු වන වෛද්‍ය ක්ෂේත්‍රයත් සමඟ ඉස්මතු වන නව සෞඛ්‍ය සේවා අභියෝගවලට මුහුණදීමේදී වෛද්‍ය සභාවට තම භූමිකාව තවදුරටත් පුළුල් කිරීමට සිදුවන බවයි ඇයගේ අදහස. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කාර්යභාරය කවරදාටත් වඩා තීරණාත්මක අනාගතයේදී සෞඛ්‍ය සේවා අභියෝගවලට මුහුණදීම සඳහා මෙරට වෛද්‍ය වෘත්තිකයන් හොඳින් සන්නද්ධ කිරීමෙන් සහ සහතික කිරීමෙන් වෛද්‍ය සභාවේ නායකත්වය අඛණ්ඩ ව අපේක්ෂා කරන බව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස ඔහුගේ සමරු පණිවිඩයේ සඳහන් කර තිබෙනවා.

ගෙවුණු සියවසේ ශ්‍රී ලංකාවේ ආරක්ෂිත සහ වෘත්තීය මට්ටමේ සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම සඳහා වෛද්‍ය සභාව වෙතින් සිදු ව තිබෙන්නේ විශාල කාර්යභාරයක්. එයින් නොනැවතී ශ්‍රී ලංකා වෛද්‍ය සභාව එහි දෙවැනි සියවසට පිවිසෙන විට, වේගයෙන් වෙනස් වන ලෝකයක නව අභියෝගවලට මුහුණදීමට සූදානම් වෙමින් සිටිනවා. ඒ, සෞඛ්‍ය සේවා ඉතා වේගයෙන් පරිණාමය වෙමින් පවතින බැවින් මේ වෙනස්කම් සමඟ ඉදිරියට යාමට. ලියාපදිංචි කිරීම් මාර්ගගත ව සිදු කිරීම, පැමිණිලි පිළිබඳ තීරණ ගැනීමේදී වඩාත් විවෘත හා සාධාරණ වීම, ගෝලීය සංවිධාන සමඟ වැඩ කිරීමෙන් ජාත්‍යන්තර ප්‍රමිති සපුරාලීම, අන්තර්ජාලය භාවිතයෙන් මාර්ගගත ව වෘත්තිකයන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම, වෛද්‍යවරුන්ට සහ සෞඛ්‍ය වෘත්තිකයන්ට ඔවුන්ගේ වෘත්තීය ජීවිතය පුරා ඉගෙනීම අඛණ්ඩ ව කරගෙන යාමට උපකාර කිරීම, වසංගත සහ ස්වභාවික විපත් වැනි හදිසි අවස්ථාවලට ප්‍රතිචාර දැක්වීම ඒ අතුරින් කිහිපයක්.

වසර සියයක් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවා නිපුණත්වය ඉහළ නැංවීමට, අඛණ්ඩතාව පවත්වා ගැනීමට, සේවා ආචාරධර්ම සහ වටිනාකම් නිසි ලෙස පවත්වා ගැනීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ලබා දෙන ලද දායකත්වය අතිමහත්. එබැවින් සියවසක් සම්පූර්ණ කිරීම යනු හුදු සැමරුමකට වඩා එහා ගිය ශ්‍රී ලාංකේය ජනතාවගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම සුරක්ෂිත කිරීමේත් ඒ සඳහා අවශ්‍ය දිරි ගැන්වීම, මඟ පෙන්වීම හා පූර්ණ දායකත්වය ලබා දීමේත් වෛද්‍ය සභාව සතු කාර්යභාරයට ප්‍රමුඛත්වය දෙමින් සිය වගකීම නිසි පරිදි ඉටු කිරීමේත් ප්‍රතිඵලයක්.




# සියවසක ගමන්මග විශාල ජයග්‍රහණයක්



විද්‍යාජ්‍යෝති මහාචාර්ය
**වජිර එච්. ඩබ්ලිව්. දිසානායක**
සභාපති
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

ශ්‍රී ලංකා සමාජයේ වෛද්‍ය සභාවක අවශ්‍යතාව ඉස්මතු වීම පිළිබඳ සංවාදය සියවස් කිහිපයක සිට සාකච්ඡා කළ යුත්තක්. මෙරට වෛද්‍ය අධ්‍යාපනය විධිමත් ව ආරම්භ වන්නේ 1838 වසරේදී එංගලන්ත රජය යටතේ මිෂනාරීන් විසින් යාපනයේ මනිපායිවල ප්‍රථම වරට වෛද්‍ය පාසලක් (Medical School) පිහිටවනු ලැබීමෙන්. එහි මුල් 25 වසරක පාලනය පෞද්ගලික හිමිකාරිත්වයකින් සිදු වුණත් පසුකාලීන ව දිවයින ම ආවරණය වන පරිදි වෛද්‍ය අධ්‍යාපන ක්‍රමය ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව වැඩි වශයෙන් දැනෙන්නට වුණා. ඒ අනුව 1870 වසරේදී රජය විසින් කොළඹ වෛද්‍ය පීඨය 'Ceylon Medical School' නමින් පිහිටුවනු ලැබුවා. එය 'Colombo Medical School' නමිනුත් භාවිත කළා.

අන්තර්ජාතික වශයෙන් වෛද්‍යවරුන් නියාමනය පිළිබඳ කතිකාව ඉස්මතු වීමේ ප්‍රතිඵලයක් ලෙස 1858 වසරේදී ලොව පළමු වෛද්‍ය සභාව (General Medical Council - GMC) එංගලන්තයේදී පිහිටුවනවා. 1880 වසරේදී ඒ වන විට කොළඹ වෛද්‍ය

පීඨයෙන් පිරිනැමූ ඩිප්ලෝමා පාඨමාලාවෙන් සමත් වන සිසුන්ට බ්‍රිතාන්‍ය වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමෙන් පසුව වෙනත් සුදුසුකම් පරීක්ෂණයකින් තොර ව බ්‍රිතාන්‍යයේ වෘත්තීමය වශයෙන් ක්‍රියා කිරීමට හැකි වුණා. එහිදී කොළඹ වෛද්‍ය පීඨයෙන් බිහිවන ඩිප්ලෝමාධාරීන් ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාව අනුව 1905 වසරේදී සම්මත කර ගන්නා ලද 'වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ ආඥා පනත' (Medical Registration Ordinance) යටතේ කොළඹ වෛද්‍ය පීඨයේදී ලියාපදිංචිය ඇරඹුණා. එනමුත් පසුව මේ ලියාපදිංචි කිරීම සඳහා වෙනත් ආයතනයක් පැවතීමේ වැදගත්කම පදනම් කරගෙන 1925 වසර වනවිට වෛද්‍ය සභාව 'Ceylon Medical Council' නමින් පිහිටුවූවා. මේ ලියාපදිංචි කිරීමෙන් අපේක්ෂා කරන්නේ යම්කිසි ප්‍රමිතිගත පුහුණුවකින් පසුව සෞඛ්‍ය සේවයට ඇතුළත් වන වෛද්‍යවරුන් රෝගීන්ට නිසි සේවයක් ලබා දීම නියාමනය. එනම් අධ්‍යාපනයෙන් ලබන වෛද්‍ය පුහුණුව නියාමනය වන්නා සේ ම වෛද්‍ය සේවයේ වෘත්තීය චර්යාව නියාමනය මේ වෛද්‍ය ලියාපදිංචියේ අභිප්‍රාය වෙනවා. මුල්කාලීන ව වෛද්‍ය සභාව යටතේ වෛද්‍යවරුන් ලියාපදිංචිය පමණක් සිදු වුණත් පසුව රජයේ ඇපොතෙකරි (Apothecaries), වතු වෛද්‍ය සහායකයන් (Estate Dispensers), වින්නඹු මාතාවන් (Midwives) යනාදී වශයෙන් ලියාපදිංචිය ක්‍රමික ව පුළුල් කෙරුණා.

වෛද්‍ය සභාව ආරම්භ කිරීමට මූලික ව යටත්විජිත සමයේ බ්‍රිතාන්‍ය ආභාසය හේතු වූ නමුත් පශ්චාත් යටත්විජිත සමය එළඹීමත් සමග වෙනස් වූ සමාජ, ආර්ථික, දේශපාලනික සාධකවලට කාලානුරූපී ව අනුගත වෙමින් සියවසක් තිස්සේ වෛද්‍ය සභාවේ ස්ථාවරත්වය පවත්වාගෙන ඒමට හැකි වීම විශාල ජයග්‍රහණයක්. ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම හා නොබැඳි ප්‍රතිපත්තිය අනුගමනය කරමින් ජාත්‍යන්තරය සමග ගනුදෙනු කිරීමේ නවමු මාවතකට එළඹීම, වෛද්‍ය සභාවේ වෛද්‍ය පුහුණුව දියුණු කිරීමේ අපේක්ෂාවෙන් විවිධ සහයෝගිතා අන්තර්ජාතික ව ගොඩනගා ගැනීමට හේතු වුණා. නිදසුනක් ලෙස සෝවියට් රාජ්‍යය සමග ගිවිසුම්ගත ව එරට පුහුණුව ලබන වෛද්‍ය සිසුන්ට මෙරටට පැමිණ වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමේ අවස්ථාව සලස්වා දීම පෙන්වා දෙන්නට පුළුවන්.

International Association of Medical Regulations Agencies (IAMRA) ආයතනයේ සාමාජිකයකු බවට පත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමග යහපත් සම්බන්ධතා පවත්වාගෙන යාමෙන් ප්‍රධාන වශයෙන් අපේක්ෂා කරනවා අන්තර්ජාතික වශයෙන් භාවිත කරන ඉහළ ම නිර්ණායක හා ප්‍රමිති දක්වා මෙරට වෛද්‍ය සේවය ගුණාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීමට. විදෙස් රටවල සිට වෛද්‍ය පුහුණුව ලබා මෙරටට පැමිණෙන වෛද්‍යවරුන් අන්තර්ග්‍රහණය කර ගැනීමට පැවැත්වූ සාම්ප්‍රදායික විභාග ක්‍රමය වෙනුවට 2025 වසරේ සිට ජාත්‍යන්තරික වශයෙන් ප්‍රමිතිගත නව විභාග ක්‍රමයක් අනුගමනය කිරීම එලෙසින් ගත් ක්‍රියාමාර්ගයක්. මෙරට වෛද්‍ය අධ්‍යාපන ක්‍රමයේ

පෞද්ගලික වෛද්‍ය සේවය අන්තර්ග්‍රහණය වන අයුරින් එම සෞඛ්‍ය සේවා වෘත්තිකයන් සේවා නියුක්ත කිරීමටත් විදේශගත වන මෙරට පුහුණුව ලත් වෛද්‍ය වෘත්තිකයන් ඇතුළු ව දේශීය සෞඛ්‍ය සේවා අවශ්‍යතාව ද ආවරණය කිරීමට හැකිවන අයුරින් සෞඛ්‍ය සේවාව සඳහා වෘත්තිකයන් පිරිසක් වෛද්‍ය පීඨවලින් බිහි කිරීමටත් විදේශ රටවල සේවයකොට නැවත පැමිණෙන සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ට නැවත මෙරටට පැමිණ සේවය කිරීමට අවශ්‍ය අවස්ථාව නිර්මාණය කර දීමටත් වුවමනා කරනවා. ඒ සඳහා පුළුල් දැක්මක් සහිත ව ක්‍රියා කිරීම වෛද්‍ය සභාවේ අනාගත අපේක්ෂාවක්.

ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය රෙගුලාසි 2021 අප්‍රේල් මාසයේ සිට බලාත්මක කිරීමෙන් අනතුරු ව වෛද්‍ය සභාව විසින් 'ප්‍රතීතන ඒකකය' (Accreditation Unit) නමින් ස්වාධීන අංශයක් පිහිටුවමින් අන්තර්ජාතික නිර්ණායක හා මෙරටට නීතිමය ප්‍රතිපාදනවලට අනුගත ව මෙරට සියලු වෛද්‍ය පීඨ නියාමනය කිරීමත් සිදු කරනවා. සුදුසුකම් ලත් සදාචාරාත්මක සෞඛ්‍ය සේවා වෘත්තිකයන් බිහි කිරීමයි මෙහි අරමුණ. වෛද්‍ය සභාවේ ප්‍රතීතන අංශය, 2023 වසරේදී වෛද්‍ය අධ්‍යාපන ප්‍රතීතන ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර ආයතනයක් වන වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ අන්තර්ජාතික සම්මේලනය (World Federation for Medical Education - WFME) වෙතින් ඉදිරි වසර 10ක් සඳහා ප්‍රතීතනය ලබා ගැනීමත් සිදු වුණා. ඒ හේතුවෙන් මෙරට සේවය කරන වෛද්‍යවරුන්ට විදේශගත ව සේවය සැපයීමට සිදුවන අවස්ථාවලදී ඔවුන්ගේ සේවය ජාත්‍යන්තරික වශයෙන් පිළිගැනෙන ආකාරයේ ප්‍රමිතිගත කිරීමට ඇති සියලු බාධා ඉවත් කර ගැනීමට වෛද්‍ය සභාවට හැකි වුණා. තාක්ෂණය වැඩි වශයෙන් භාවිත වන ක්ෂේත්‍රයක් වශයෙන් ඊට ගැළපෙන ලෙස වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා නීති රාමුව යාවත්කාලීන වීමත් වැදගත්. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සිටිනවා.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වශයෙන් මෙරට වෛද්‍ය අධ්‍යාපනය හා වෛද්‍ය පුහුණුව නියාමනය හා ආයතනයක් වශයෙන් වෛද්‍ය සභාවේ ක්‍රියාකාරිත්වය අන්තර්ජාතික වශයෙන් පිළිගන්නා තත්ත්වයක් දක්වා ඔසවා තැබීමේ විශාල කාර්යභාරයක් මේ වනවිට අප සම්පූර්ණ කරගෙන තිබෙනවා. ඉදිරියේදී සෞඛ්‍ය සේවයේ පවතින පුරප්පාඩු හඳුනා ගනිමින් ඒ සඳහා අවශ්‍ය සෞඛ්‍ය සේවා වෘත්තිකයන් ගුණාත්මක වෛද්‍ය පුහුණුවක් සහිත ව නිර්මාණය කළ හැකි ආකාරය පිළිබඳ අවධානය යොමු කරනවා. පෞද්ගලික වෛද්‍ය සේවය අන්තර්ග්‍රහණය වන අයුරින් එම සෞඛ්‍ය සේවා වෘත්තිකයන් සේවා නියුක්ත කිරීමටත් විදේශගත වන මෙරට පුහුණුව ලත් වෛද්‍ය වෘත්තිකයන් ඇතුළු ව දේශීය සෞඛ්‍ය සේවා අවශ්‍යතාව ද ආවරණය කිරීමට හැකිවන අයුරින් සෞඛ්‍ය සේවාව සඳහා වෘත්තිකයන් පිරිසක් වෛද්‍ය පීඨවලින් බිහි කිරීමටත් විදේශ රටවල සේවයකොට නැවත පැමිණෙන සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ට නැවත මෙරටට පැමිණ සේවය කිරීමට අවශ්‍ය අවස්ථාව නිර්මාණය කර දීමටත් වුවමනා කරනවා. ඒ සඳහා පුළුල් දැක්මක් සහිත ව ක්‍රියා කිරීම වෛද්‍ය සභාවේ අනාගත අපේක්ෂාවක්.

# විධිමත් නියාමනය ප්‍රමුඛ අරමුණක්



**වෛද්‍ය එච්. ඩී. බී. හේරත්**
ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

රෝගියාටත් වෛද්‍යවරයා තමන්ගේ රෝගයට නියම කරන ලද ප්‍රතිකාර නිසි පරිදි අනෙකුත් සෞඛ්‍ය සේවකයන්ගෙන් ලැබුණේද? යන්න පිළිබඳ විශ්වාසය ගොඩ නැඟීමත් වැදගත්. ඒ වෙනුවෙනුයි වෛද්‍යවරුන්ට අමතර ව සුදුසුකම් ලත් අනෙකුත් සෞඛ්‍ය සේවා වෘත්තියන් නියාමනයට හා ලියාපදිංචියට වෛද්‍ය සභාව ක්‍රියා කරන්නේ. එබැවින් ජනතාවට තමන් සෞඛ්‍ය සේවාව ලබා ගන්නා වෘත්තිකයන් වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී සිටින්නේද? යන්න වෛද්‍ය සභාවේ නිල වෙබ් පිටුව ඔස්සේ සොයා බැලීමටත් අවස්ථාව සලසා දී තිබෙනවා.

ලෝක ව්‍යාප්ත වෛද්‍ය සභා අතුරින් පස්වැනි වෛද්‍ය සභාව ලෙස වසර 100කට පෙරාතුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ආරම්භ වෙනවා. එතෙක් අවිධිමත් ව තිබූ වෛද්‍ය සේවාව සහ වෛද්‍යවරුන් විධිමත් නියාමනයකට යටත් කිරීම ශ්‍රී ලංකාවේ වෛද්‍ය සභාව පිහිටුවීමේ මූලික අරමුණ වුණා. නිසි නියාමනයකින් තොර ව ප්‍රතිකාර කිරීමෙන් රෝගීන්ට සිදු විය හැකි හානිය අවම කරගැනීමට එයින් හැකි වෙනවා. යටත්විජිත යුගයේදී වෛද්‍ය සේවයට සුදුසුකම් ලැබුවේ යම්කිසි ප්‍රභූත්වයක් සහිත ඉහළ පැළැන්තියේ පවුල් පසුබිමක් සහිත පුද්ගලයන්ට. එම නිසා එකල වෛද්‍යවරුන්ට සමාජ, ආර්ථික, දේශපාලනික වශයෙන් ඉහළ පිළිගැනීමක් හා බලයක් පැවතුණා. එම නිසා එකල පැවති යටත්විජිත පාලනය මෙරට සෞඛ්‍ය සේවය සඳහා මැදිහත්වීමක් සිදු නොකර එය වෛද්‍යවරුන්ට ම භාර දෙමින් වෛද්‍යවරුන්ගේ ප්‍රධානත්වයෙන් අනෙකුත් වෘත්තිකයන්ටත් අදාළ වන පරිදි පනතක් සකස් කෙරුණා. එලෙසින් සීමිත වෛද්‍ය වෘත්තිකයන් පිරිසකගේ සහභාගිත්වයකින් ඇරඹුණ 'ශ්‍රී ලංකා වෛද්‍ය සභාව' අද වන විට වෛද්‍ය වෘත්තිකයන් දහස් ගණනකගේ සාමාජිකත්වයක් සහිත ව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සක්‍රිය ව ක්‍රියාත්මක වන ආයතනයක්.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ සිදු වූවා පමණක් නො ව මෙරට වෛද්‍ය සභාවක් පිහිටුවීමේ සංකල්පීය පදනම නිර්මාණය වූයේත් එක්සත් රාජධානියේ වෛද්‍ය සභාව (General Medical Council - GMC) මුල්කරගෙන. එබැවින් එරට වෛද්‍ය සභාවේ අගයන බොහෝ ප්‍රතිපත්ති හා අරමුණු මෙරට වෛද්‍ය සභාවේත් පිළිගැනුම්කාරක වෙනවා.

වෛද්‍ය සේවය කෙරෙහි ජනතාවගේ විශ්වාසය ආරක්ෂා වන අයුරින් වෛද්‍ය සේවාවේ ගුණාත්මකභාවය පවත්වා ගැනීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව කැප වී සිටිනවා. සුදුසුකම් ලත් වෛද්‍යවරුන් සඳහා පමණක් සාමාජිකත්වය ලබා දීම එහිදී වෛද්‍ය සභාව අනුගමනය කරන පියවරක්. මුල්කාලීන ව වෛද්‍ය සභාවේ සාමාජිකත්වය ලබා ගැනීමට මූලික සුදුසුකම වූයේ වෛද්‍ය විද්‍යාව සහ ශල්‍යකර්ම පිළිබඳ ඩිප්ලෝමාව (Licentiate in Medicine and Surgery - L.M.S.) වුවත් වර්තමානය වන විට එය MBBS උපාධි මට්ටම දක්වා ඉහළ නංවා තිබෙනවා. එදා සිට වෛද්‍ය සභාවෙන් සිදු වූ තවත් වැදගත් කාර්යයක් විදිහට වෛද්‍ය පුහුණුව හා වෛද්‍ය සේවාව නිසි පිරිදි නියාමනය හඳුන්වා දීමට පුළුවන්. විදේශ රටවල වෛද්‍ය පුහුණුව ලබා මෙරටට පැමිණෙන වෛද්‍ය අභ්‍යාසලාභීන් නිසි සුදුසුකම් සපුරා ඇත්නම් ඔවුන් නිසි වෛද්‍ය පුහුණුවක් සඳහා අනුයුක්ත කරනවා. මුල්කාලීන ව ඒ සඳහා තෝරා ගැනීම් සම්මුඛ සාකච්ඡා ඔස්සේ සිදු කළා. එය තවදුරටත් ප්‍රමිතිගත කරමින් අද වන විට සායනික පර්යේෂණ (Clinical Examination) ක්‍රියාවලියක් දක්වා ගුණාත්මක හා සාධාරණීයකරණයට ලක්කර තිබෙනවා. මේ සියලු පියවර වෛද්‍ය සභාව විසින් ගනු ලබන්නේ රෝගියකු වෙත ළඟා වෙන වෛද්‍යවරයා සුදුසුකම් ලත් පුද්ගලයකු වීම අවශ්‍ය වන නිසා. ඒ සඳහා ඔහුට හෝ ඇයට හෝ නිසි වෛද්‍ය පුහුණුවක් ලැබී තිබිය යුතුයි. අවශ්‍ය විභාග සමත් වී සිටිය යුතුයි. වෘත්තීය වශයෙන් ක්‍රියා කිරීමට දක්ෂතාව තිබිය යුතුයි.

වෛද්‍ය සභාව යටතේ ලියාපදිංචි කිරීමෙන් සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ට පෞද්ගලික වශයෙන් ඍජු ව ලැබෙන ප්‍රතිලාභයක් හෝ වාසියක් නොමැති තරම්. එහෙත් වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමෙන් අදාළ වෘත්තිකයාට සමාජයේ වෘත්තීමය පිළිගැනීමක් සහ විශ්වාසයක් ඇති වෙනවා. වෛද්‍ය සභාව නිකුත් කරන වෛද්‍ය සහතිකය ඕනෑ ම නඩු කටයුත්තකදී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීමට බාධාවකින් තොර ව ඉදිරිපත් කිරීමටත් පුළුවන්. එසේ ම වෛද්‍ය සභාව අනුමත කරන වෛද්‍යවරයකු විසින් රෝගියකුට විවේකය හෝ නිවාඩු ගැනීම් සඳහා ලබාදෙන අනුමැතිය (Medical) නැවත පරීක්ෂා කිරීමකින් තොර ව පිළිගැනීමට නීතියෙන් අවසර දී තිබෙනවා. වෛද්‍යවරයාට තමන් විසින් සපයන ලද සේවාව වෙනුවෙන් ලැබිය යුතු ගාස්තුව ලබා දීම පැහැර හරින අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් අධිකරණය හමුවේ නීතිමය රැකවරණය ලබා ගැනීමට වෛද්‍ය සභාවේ ලියාපදිංචි සෞඛ්‍ය සේවා වෘත්තිකයකුට හැකියාව පවතිනවා.


වෛද්‍ය ක්ෂේත්‍රයේ මෙන් ම සෞඛ්‍ය සේවය හා සම්බන්ධ අනෙකුත් අංශ ආවරණය වන පරිදි ලියාපදිංචිය වෛද්‍ය සභාවේ සිදු වීමත් තවත් විශේෂ කාරණාවක්. එයට බලපාන හේතුවක් තිබෙනවා. වෛද්‍යවරයකු රෝගයක් විනිශ්චය කර අවශ්‍ය ඖෂධ නියම කිරීමෙන් අනතුරු ව එහි සෙසු වගකීම දරන්නේ සෞඛ්‍ය සේවයේ නියුතු අනෙකුත් අංශවල වෘත්තිකයන්. නිදසුනක් විදිහට රෝගියාට වෛද්‍ය නිර්ණායක අනුව ඖෂධ ලබා

දෙන්නේ ඖෂධවේදීන් (Pharmacists). එහිදී වෛද්‍යවරයාට සහතිකයක් ලැබිය යුතුයි තමන් රෝගියාට නිවැරදි ව ඖෂධ සහ ප්‍රතිකාර ඖෂධවේදියා වෙතින් ලැබෙන බවට. එමෙන් ම රෝගියාටත් වෛද්‍යවරයා තමන්ගේ රෝගයට නියම කරන ලද ප්‍රතිකාර නිසි පරිදි අනෙකුත් සෞඛ්‍ය සේවකයන්ගෙන් ලැබුණේද? යන්න පිළිබඳ විශ්වාසය ගොඩ නැඟීමත් වැදගත්. ඒ වෙනුවෙනුයි වෛද්‍යවරුන්ට අමතර ව සුදුසුකම් ලත් අනෙකුත් සෞඛ්‍ය සේවා වෘත්තියන් නියාමනයට හා ලියාපදිංචියට වෛද්‍ය සභාව ක්‍රියා කරන්නේ. එබැවින් ජනතාවට තමන් සෞඛ්‍ය සේවාව ලබා ගන්නා වෘත්තිකයන් වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී සිටින්නේද? යන්න වෛද්‍ය සභාවේ නිල වෙබ් පිටුව ඔස්සේ සොයා බැලීමටත් අවස්ථාව සලසා දී තිබෙනවා. මේ වන විට හෙද නිලධාරින් වෛද්‍ය සභාවේ ලියාපදිංචි කිරීම සිදු නොකෙරුණත් සුදුසුකම් ලත් හෙද නිලධාරින් පමණක් බඳවා ගැනීමෙන් සහ ඔවුන්ගේ සේවයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමේ නියාමනය ඊට අදාළ ආයතන සිදු කරනවා. වෛද්‍ය සභාවේ ලියාපදිංචියට වුවමනා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෙනත් වෘත්තීය ක්ෂේත්‍ර හඳුනා ගනිමින් සිටිනවා. ඒ අනුව පිළිකා මර්දන විකිරණ ප්‍රතිකාර හා වෛද්‍ය විද්‍යාවේ අනෙකුත් භෞතික විද්‍යා මූලධර්ම තාක්ෂණය කෙරෙහි දැනුමැ'ති වෛද්‍ය භෞතික විශේෂඥවරුන් (Medical Physicists) සහ Perfusionist ඇතුළු නව සෞඛ්‍ය සේවා අංශ කිහිපයක් සඳහා ඉදිරියේදී ලියාපදිංචි කිරීම් විවෘත වනු ඇති.

Body Modification, tattoo වැනි රූපලාවණ්‍ය මට්ටමේ පවතින විවිධ ශල්‍යකර්ම නිසි ප්‍රමිතිකරණයට ලක් කිරීම හා නියාමනයකට අනුගත කිරීමට ගත හැකි පියවර පිළිබඳ විමසා බැලීමටත් බලාපොරොත්තු වෙනවා. වෛද්‍ය සභාවේ අනුමැතිය පවතින වෛද්‍ය අධ්‍යාපනය ආයතනවලින් පමණක් මෙහෙය විය යුතු වෛද්‍ය අධ්‍යාපනයට ඉන් පරිබාහිර ව ටියුෂන් කර්මාන්තය මැදිහත්වීම මේ වනවිට සැලකිය යුතු අභියෝගයක් විදිහටයි අප දකින්නේ. අ.පො.ස. උසස් පෙළ මට්ටමේදී සිසුන් හදාරන වෛද්‍ය අධ්‍යාපනයේ මූලික ඉගැන්වීම් කුමන ප්‍රමිති යටතේ සිදු කරන්නේද? යන්න මෙහිදී සොයා බැලීම අවශ්‍ය වෙනවා. එහිදී සෞඛ්‍ය සේවාව මෙන් ම වෛද්‍ය අධ්‍යාපනය ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ සියලු ඉගැන්වීම් සෑම විටෙක ම නිසි ප්‍රමිතියකට අනුව නියාමනයක් ද සහිත ව විධිමත් ව සිදුවිය යුතු බවයි අපගේ විශ්වාසය.

# සියවසක කැපවීම අගය කළ යුතුයි

මහාචාර්ය
**රනිල් ප්‍රනාන්දු**
සභාපති
සියවස් සැමරුම් කමිටුව
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව



ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිහිටුවා සියවසක් සම්පූර්ණ වීම නිමිත්තෙන් මෙරට සෞඛ්‍ය සේවය ගුණාත්මක කිරීමට මේතාක් වෛද්‍ය සභාව කළ කැපවීම පිළිබඳ සාකච්ඡා කිරීමට අපට වුවමනා වුණා. ඒ අනුවයි 'ආරක්ෂිත සහ ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැමට - සියවසක කැපවීම' (Patient Safety and Quality Healthcare for All - A Century of Dedication) යන තේමාව මුල් කරගෙන විශේෂ සැමරුමක් අප සංවිධානය කළේ. සෞඛ්‍ය සේවයේ රෝගීන්ගේ ආරක්ෂාව තහවුරු වීම අවශ්‍යයි. ජනතාව මේ පිළිබඳ එතරම් දැනුවත් නොවුණත් වෛද්‍ය සභාව විදිහට අප ඒ ගැන බොහෝදුරට සැලකිලිමත් වෙනවා. එනම් රෝගීන්ගේ ආරක්ෂාව සහ ප්‍රමිතිගත වෛද්‍ය සේවාවක් සෑම දෙනාට ම ලැබීම තහවුරු කිරීමයි වෛද්‍ය සභාවේ අරමුණ. එම නිසා සියවස් සැමරුම් තේමාව නිර්මාණය කිරීමේදීත් අප වැඩි වශයෙන් ඒ පිළිබඳ අවධානය යොමු කළා.

> වෛද්‍ය සභාවේ සියවස් සැමරුම් උත්සවය 2025 ජූලි 05 දින කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී උදෑසන අධ්‍යයන සැසිය හා සවස ජාතික සැමරුම් උත්සව ලෙසින් අදියර දෙකකින් පැවැත්වුණා. මීට පෙරාතුව වෛද්‍ය සභාවේ සාංවත්සරික සැමරුම් උත්සව සංවිධානය කිරීමක් සිදු ව තිබුණේ නැහැ.

වෛද්‍ය සභාවේ සියවස් සැමරුම් උත්සවය 2025 ජූලි 05 දින කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී උදෑසන අධ්‍යයන සැසිය හා සවස ජාතික සැමරුම් උත්සව ලෙසින් අදියර දෙකකින් පැවැත්වුණා. මීට පෙරාතුව වෛද්‍ය සභාවේ සාංවත්සරික සැමරුම් උත්සව සංවිධානය කිරීමක් සිදු ව තිබුණේ නැහැ. එම නිසා සියවසක් පුරා වෛද්‍ය සභාවෙන් ඉටු වූ සේවාව හා වෛද්‍ය සභාවේ කැපවීම් සියල්ල ඉස්මතු වන ආකාරයේ උත්සවයක් සංවිධානය කිරීම සැබවින් ම අභියෝගාත්මක වුණා. වෛද්‍ය සභාවට සියවසක් සම්පූර්ණ වීම වෙනුවෙන් උත්සවයක් පැවැත්වීමට පළමුවෙන් අදහසක් ගෙන ආවේ විකලාංග ශල්‍ය විශේෂඥ සුනිල් විජේසිංහ මහතා විසින්. මුලින් ම උත්සවය සංවිධානය කිරීමට සුදුසු කණ්ඩායමක් තෝරා ගත්තා. එම පිරිසට වෙන් වෙන් වූ වගකීම් පැවරුවා. සැමරුමේ සංකල්පීය පදනම කුමන මාතෘකා ඔස්සේ ගොඩ නඟන්නේද? යන්න පිළිබඳ

සාකච්ඡා කිරීම සිදු වුණේ ඉන්පසුව. එහිදී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ඉතිහාසය, සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය, රෝගීන්ගේ ආරක්ෂාව, නීති සහ රෙගුලාසි, සෞඛ්‍ය සේවා වෘත්තිකභාවය, ආචාරධර්ම හා සදාචාරාත්මක ප්‍රමිති, පර්යේෂණාත්මක ක්ෂේත්‍රය දියුණු කරගත හැකි ආකාර, ගෝලීය සෞඛ්‍ය ප්‍රමිතිවලට අනුකූල වීමේ ක්‍රම හා නව තාක්ෂණය සහ විකල්ප ප්‍රතිකාර භාවිත කිරීම් යනාදී වූ සැමරුම හා වඩාත් සමීප යාවත්කාලීන මාතෘකා කිහිපයකට ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළා. උදෑසන පැවති අධ්‍යයන සැසිය මේ කරුණු පිළිබඳ දේශන හා සංවාද සඳහා විවෘත කරමින් පවත්වන ලද්දේ ජාත්‍යන්තර මට්ටමේ ප්‍රවීණ සෞඛ්‍ය නියාමන විශේෂඥයන් ඇතුළු විශේෂඥ සම්පත්දායක මණ්ඩලයක සහභාගිත්වයෙන්.

හරිනි අමරසූරිය අග්‍රාමාත්‍යතුමිය සහ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය නලින්ද ජයතිස්ස මහතාගේ ප්‍රධානත්වයෙන් සමරනු ලැබූ ශත සාංවත්සරික ජාතික උත්සවය සවස් වරුවේදී පැවැත්වුණා. මෙහි මුඛ්‍ය දේශනය පැවැත්වීම සිදු කරන ලද්දේ, Medical Regulatory Authority ජාත්‍යන්තර සංවිධානයේ සභාපති, Joan Simeon මහත්මිය විසින්. විශේෂ ආරාධනය පිළිගෙන පැමිණි එක්සත් රාජධානියේ වෛද්‍ය සභාවේ කමිටු සභාපති මහාචාර්ය Dame Carrie MacEwen මහත්මිය ද හරවත් දේශනයක් සභාව හමුවේ තැබුවා. එහිදී වෛද්‍ය සභාවේ සියවස් සැමරුම වෙනුවෙන් විශේෂ සමරු මුද්දරයක් මුද්දර කාර්යංශය විසින් නිකුත් කිරීමත් මනෝරි ගමගේ මහත්මියගේ ප්‍රධාන සංස්කාරකත්වයෙන් සියවස් සමරු කලාපයක් නිකුත් කිරීමත් සිදු වුණා. විවෘත තරගයක් පවත්වා තෝරා ගන්නා ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිල සියවස් සමරු ලාංඡනය කැලණිය විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය පීඨයේ උදානි පරණගම අතින් නිර්මාණය වූවක්. විශේෂ සියවස් සමරු මුද්දරය සහ සමරු කවරය නිර්මාණය කරන ලද්දේ පසිඳු අකලංක ධර්මප්‍රිය (SLMC පාර්ශ්වය) හා පුලස්ති එදිරිවීර (මුද්දර කාර්යාංශය) විසින්. උත්සවයේ සංවිධානය සිදු කෙරුණේ සීමා සහිත AV Productions ආයතනය වෙතින්. අපගේ උත්සාහය වූයේ මේ සැමරුම් උත්සවය සඳහා වෛද්‍යවරුන්ගේ සහ අනෙකුත් සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ගේ සහභාගිත්වය හැකි උපරිමයෙන් ලබා ගැනීමට.

සියවසක් සම්පූර්ණ වීමේ මේ සැමරුමත් සමඟ අප නැවත හැරී බලමින් මෙතෙක් කාලයක් සිදු කළ වැඩ කොටස ප්‍රමාණවත්ද? අපගේ අරමුණුවලට ළඟා වීමට පියවර ගෙන තිබෙනවාද? ඉදිරියට ක්‍රියා කළ යුත්තේ කෙසේද? යන්න පිළිබඳ තවදුරටත් සිතීම වැදගත්. එහිදී ලොව ඉහළ ම ගුණාත්මක බවින් යුතු සෞඛ්‍ය සේවාවක් මෙරට මහජනයා වෙත ලබා දීමට මෙතෙක් වෛද්‍ය සභාව විසින් සිදු කරනු ලැබූ කැපවීම සැබවින් ම අගය කළ යුත්තක්. එසේ ම සියවසක් සම්පූර්ණ කරමින් එළඹෙන අනාගතයේදී වෛද්‍ය සේවය සඳහා නව නීති පද්ධතියක් හඳුන්වාදීම, වෛද්‍ය අධ්‍යාපනය ගුණාත්මක කිරීම වැනි සැලසුම් ඔස්සේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කාර්යයභාරය තවදුරටත් පුළුල් කිරීමටත් අපේක්ෂා කරනවා.

වෛද්‍ය නියාමන ආයතනයක් වශයෙන් වෛද්‍ය සභාවේ කාර්යභාරය වඩාත් ඵලදායී කර ගැනීමට වෛද්‍ය සභාව පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම මේ උත්සව සංවිධානය කිරීමේ තවත් අභිලාෂයක්. ඒ අනුව සෞඛ්‍ය සේවාවක් ලබා ගැනීමේදී මහජනතාව වෙනුවෙන් පවතින අයිතිවාසිකම් මොනවාද? එම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වෛද්‍ය සභාව මැදිහත් වන්නේ කෙසේද? ජනතාව ඒ සඳහා නිවැරදි ව දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරන්නේ කෙසේද? යනාදිය පිළිබඳ ජනතාව තුළ සවිඥානිකත්වයක් ඇති කිරීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සියවස් සැමරුමට සමගාමී ව සිදු වුණා. ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ සංගමය (Sri Lanka Medical Association) විසින් ප්‍රකාශයට පත් කරනු ලබන මාසික සඟරාවේ ජූලි කලාපය වෛද්‍ය සභාවේ සියවස් සැමරුම වෙනුවෙන් විශේෂකොට උත්සව දින උදෑසන අධ්‍යයන සැසිය අවසානයේදී වෛද්‍ය සභාවේ සභාපතිතුමා වෙත වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපතිතුමා විසින් පිළිගන්වනු ලැබුවා. ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් ප්‍රකාශයට පත් කරන 'සුවය' මාසික සඟරාවේ විශේෂ කලාපයක් සාංවත්සරික සැමරුම වෙනුවෙන් වෙන් කෙරුණා.

මාස පහකට ආසන්න කාලයක් මිඩංගු කරමින් සිදු කළ ඉතාමත් දුෂ්කර ව්‍යායාමයක ප්‍රතිඵලයක් විදිහටයි වෛද්‍ය සභාවේ සියවස් සැමරුම උත්සවය මල්ඵල ගැන්වූයේ. එහිදී නිරන්තරයෙන් ම මෙහි සංවිධානය පිළිබඳ ව සොයා බලමින් අවශ්‍ය සහයෝගය උපරිමයෙන් ලබා දීමට වෛද්‍ය සභාවේ සාමාජිකයන් ඇතුළු බොහෝදෙනා නොපැකිළ ව ඉදිරිපත් වුණා. සියලු දෙනාගේ ම අදහස් සලකා බලමින්, අවශ්‍ය වෙනස්කම් සඳහා යළි යළිත් කරුණු විමසා බලමින් වඩාත් සාර්ථක උත්සවයක් වසර සියයක් සම්පූර්ණ වීම මුල්කරගෙන අප පැවැත්වූවා. සියවසක් සම්පූර්ණ වීමේ මේ සැමරුමත් සමඟ අප නැවත හැරී බලමින් මෙතෙක් කාලයක් සිදු කළ වැඩ කොටස ප්‍රමාණවත්ද? අපගේ අරමුණුවලට ළඟා වීමට පියවර ගෙන තිබෙනවාද? ඉදිරියට ක්‍රියා කළ යුත්තේ කෙසේද? යන්න පිළිබඳ තවදුරටත් සිතීම වැදගත්. එහිදී ලොව ඉහළ ම ගුණාත්මක බවින් යුතු සෞඛ්‍ය සේවාවක් මෙරට මහජනයා වෙත ලබා දීමට මෙතෙක් වෛද්‍ය සභාව විසින් සිදු කරනු ලැබූ කැපවීම සැබවින් ම අගය කළ යුත්තක්. එසේ ම සියවසක් සම්පූර්ණ කරමින් එළඹෙන අනාගතයේදී වෛද්‍ය සේවය සඳහා නව නීති පද්ධතියක් හඳුන්වාදීම, වෛද්‍ය අධ්‍යාපනය ගුණාත්මක කිරීම වැනි සැලසුම් ඔස්සේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කාර්යයභාරය තවදුරටත් පුළුල් කිරීමටත් අපේක්ෂා කරනවා.



# ලෝකයේ මතකයට ගිය අපේ උරුම

නිශාන්ත පීරිස්


යුනෙස්කෝ සංවිධානයේ ලෝකයේ මතක පිළිබඳ ජාත්‍යන්තර ලැයිස්තුවට ගාල්ලේ ත්‍රිභාෂා සෙල් ලිපිය හා පාණදුරාවාදයට සම්බන්ධ ලිපි ලේඛන ඇතුළත් කිරීමෙන් අපේ උරුමය හා ශ්‍රී ලංකාවේ ඓතිහාසිකත්වය යළි ලෝකය ඉදිරියේ පිළිගෙන තිබීම ආඩම්බරයක්.

යම් ලේඛනයක් ලෝකයේ මතකයට ඉතා වැදගත් වන තරමටයි ඒවා යුනෙස්කෝ ලයිස්තුවට ඇතුළත් වන්නේ. රටක ඉතිහාසය, උරුමය හා සංස්කෘතිය කෙතරම් ශක්ති ජනනයක් සිදු කරන්නේද යන්න වටහා ගැනීම වැදගත්. ශ්‍රී ලංකාවේ ඓතිහාසිකත්වය වසර දෙදහස් ගණනකටත් එහා දිව යන්නක්. පැරැන්නන් අපට දායාද කළ සෙල්ලිපි ලේඛන මෙන් ම අස්පර්ශනීය දැනුම් සංචිතය ද අපේ පෞරාණික ශ්‍රී විභූතිය ඉහළ නංවන්නක්. ගාල්ලේ ත්‍රිභාෂා අභිලේඛනයට මෙන් ම පාණදුරාවාදයේ ලේඛනවලටත් ජාත්‍යන්තරයේ ඇති වී තිබෙන පිළිගැනීම ඒ ගැන සනාථ කරවන බවයි සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවිගේ අදහස.

යුනෙස්කෝ සංවිධානය ලෝකයේ සංස්කෘතික උරුම ආරක්ෂා කිරීමේ



කොළඹ කෞතුකාගාරයේ පිහිටුවා ඇති ත්‍රිභාෂා සෙල්ලිපිය



පාණදුරාවාදයේ ලේඛන

විශේෂ වැඩසටහන් ක්‍රියාවට නංවනවා. මේ අනුව ඔවුන් පවත්වාගෙන යන්නේ ලොව ජීවත්වන විවිධ මානව ප්‍රජාවගේ සංස්කෘතික උරුම ලැයිස්තු 03ක්. ඒ, යුනෙස්කෝ ලෝක උරුම ලැයිස්තුව, අස්පර්ශනීය සංස්කෘතික උරුම ලැයිස්තුව හා ලෝකයේ මතක පිළිබඳ ජාත්‍යන්තර ලැයිස්තුව ආදී ලෙස.

රටේ ඉතිහාසය හා සංස්කෘතිය සම්බන්ධ පෞරාණික ලේඛන, සෙල්ලිපි යනාදියයි ලෝකයේ මතකය පිළිබඳ ජාත්‍යන්තර ලැයිස්තුවට ඇතුළත් කළ හැක්කේ. 2025 වසරේදී නවතම ලාංකික උරුම ලේඛන ද්විත්වය ඊට ඇතුළත් කිරීමේ කාර්යය ඉතා සුවිශේෂ වූයේ ශ්‍රී ලංකාව මීට පෙර සිට යුනෙස්කෝ ලෝකයේ මතක පිළිබඳ



යුනෙස්කෝ ලෝකයේ මතකය පිළිබඳ ජාතික කමිටුව ක්‍රියාකාරී වෙමින්

ජාත්‍යන්තර ලැයිස්තුවට සම්බන්ධ වූ නිසා. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය උදය කබ්රාල් පවසන අකාරයට 2008 වසරේදී ඕලන්ද නැගෙනහිර ඉන්දියා වෙළෙඳ සමාගමේ ලේඛන, 2017 වසරේදී සුනාමි ව්‍යසනය හා සම්බන්ධ ලේඛන සහ 2021 වසරේදී මහාවංශය එම ලැයිස්තුවට ඇතුළත් ව තිබෙනවා.

මේ කාර්යයට සම්බන්ධ වුණේ ආචාර්ය සරෝජා වෙත්තසිංහ හා මහාචාර්ය බී. ඩී. නන්ද දේවගේ ප්‍රධානත්වයෙන් පත් කළ ජාතික කමිටු දෙකක්. ජගත් සුමතිපාල ප්‍රමුඛ බෞද්ධාලෝක පදනමේ මූල්‍ය සම්පාදන ශක්තිය ද ඊට බෙහෙවින් ඉවහල් වුණා. ශ්‍රී ලංකාවේ අභිමානවත් උරුම මෙලෙස ජාත්‍යන්තරයට ගෙන යාම සංස්කෘතික අභිවෘද්ධියක් බවයි ආචාර්ය උදය කබ්රාල්ගේ විග්‍රහය.

ලෝකයේ මතක පිළිබඳ ජාත්‍යන්තර ලැයිස්තුවට එක් වූ මෙරට එක ම අභිලේඛනය වූයේ ගාල්ලේ ත්‍රිභාෂා සෙල්ලිපිය. චීන-පර්සියන් හා දෙමළ යන භාෂාත්‍රයෙන් ඉදිරිපත් වී ඇති එය ඒ වර්ගයේ ලොව එක ම සෙල්ලිපිය ද වනවා. ගම්පොළ රාජධානියේ අවසාන භාගයේදීයි එය මෙහි ස්ථාපිත වන්නේ. මේ පිළිබඳ අදහස් දක්වන කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය චන්දිම බෝගහවත්ත; ''චීනය හා ශ්‍රී ලංකාව අතර පැවති අතීත සම්බන්ධතා පිළිබඳ මේ සෙල්ලිපිය කදිම පූර්වාදර්ශයක්. චීනයේ මින් අධිරාජයාගේ සමයේදී එනම් ඔහුගේ හත්වැනි රාජ්‍ය වර්ෂයටයි මෙය අදාළ වන්නේ. 1409 පෙබරවාරි 15 දින මින් අධිරාජයා ප්‍රධාන නාවික නිලධාරින්ට ශ්‍රී ලංකාවේ ආගමික ස්ථාන වෙත අධිරාජයාගේ පුද පඬුරු පිරිනමන ලෙස වගකීම පැවරුවා. එලෙසින් ම චීනයේ නන්ජින්හිදී මේ සෙල්ලිපිය නිර්මාණය කිරීමෙන් පසු සෙන්පති චෙං හෝ ඇතුළු නාවික කණ්ඩායමක් 1409 දෙසැම්බර් මාසයේ ලංකාව වෙත පිටත් වුණා. ඒ අනුවයි එම සෙල්ලිපිය අපට උරුම වන්නේ.”

1911 වසරේදී සංවර්ධන කටයුත්තකදී මේ ලිපිය ගාල්ල ප්‍රදේශයෙන් හමු වූයේ ප්‍රාදේශීය ඉංජිනේරු එස්.එච්. තොම්ලින්ට. එය දෙවිනුවර විෂ්ණු දේවාලයට ගෙන ආවක් බව ගවේෂණවලින් සනාථ වනවා. චෙං හෝ සමග පැමිණි මා හෝවන් නම් ලේඛකයා ද චීනයෙන් ලංකාවට කළ පුද පූජා ගැන වාර්තා කර තිබෙනවා. පෘතුගීසී ලේඛක ක්වේරෝස් ද තහවුරු කරන්නේ ඒ බව. එකල දෙවිනුවර ද ප්‍රධාන වරායක් ලෙස පැවති බවයි මහාචාර්ය බෝගහවත්ත පෙන්වා දෙන්නේ.

15 වැනි සියවසට අයත් ත්‍රිභාෂා සෙල්ලිපියෙන් මතු වන කරුණු ඉතා වැදගත්. එහි ඇතුළත් වන්නේ එවක චීනයේ පාලක මින් අධිරාජයා තම නාවිකයන්ගේ ආරක්ෂාව, ආගමික සංහිඳියාව මෙන් ම ශ්‍රී ලංකාව වැනි රටවල් සමග සබඳතා පැවැත්වීමට දැරූ උත්සාහය.

මේ පිළිබඳ පැහැදිලි කරන මහාචාර්ය බෝගහවත්ත; ''මෙහි අවධාරණය කෙරෙන්නේ ආගමික විශ්වාස තුනක්. එනම් ශ්‍රීපාදස්ථානයට බුදුන් වහන්සේ වෙත කරන පුද පූජා, විෂ්ණු දෙවියන් නැතහොත් තේනවරයි (උපුල්වන්) දෙවියන් වෙත කරන පූජා හා අල්ලාහ් දෙවියන් වෙත කරන පුද පූජා ද ඊට ඇතුළත්. මෙහි අන්තර්ගත ව ඇත්තේ ආගමික භාෂා නිසයි සිංහල භාෂාව ඇතුළත් නොවන්නේ. බුදුන් වහන්සේ පිළිබඳ ව චීන භාෂාවෙන් ද විෂ්ණු දෙවියන් ගැන ද්‍රවිඩ භාෂාවෙන් ද අල්ලාහ් දෙවියන් පිළිබඳ ව පර්සියන් භාෂාවෙන් ද මෙහි වදන් පෙළ ගස්වා තිබෙනවා. ශ්‍රී පාදයට රන්, රිදී, සිල්ක් කොඩි ධජ පතාක සේ ම රන්කම්, ලියකම්, මල්කම් ආදි නිර්මාණ, විවිධ පූජනීය භාණ්ඩ ගෞරවයෙන් පිරිනමා තිබෙනවා.” අතීතයේ ලංකාව සමීපයෙන් ගමන් කරන බොහෝ යාත්‍රාවලට ශ්‍රී පාද කන්දේ



පාණඳුරේ රන්කොත් විහාරය

සුන්දරත්වය හා තේජාන්විත දර්ශනය පැහැදිලි ව පෙනෙනු බව සඳහන් වනවා. බොහෝ යාත්‍රාකරුවන් ශ්‍රී ලංකාවේ සලකුණ ලෙස හඳුන්වා ඇත්තේ මේ ශ්‍රී පාදස්ථානය.

ලෝකයේ මතක පිළිබඳ ජාත්‍යන්තර ලැයිස්තුවට සංගෘහිත වූ මීළඟ වැදගත් එකතුව වූයේ පාණඳුරාවාදය හා සම්බන්ධ ලේඛන. 19 වැනි සියවස වන විට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය උත්සන්න වීමත් සමග රට පුරා බ්‍රිතාන්‍ය මිෂනාරී ව්‍යාපාරය බලවත් සේ නැගී ඒම මෙරට ජාතික හා ආගමික පදනමට එල්ල කළේ දැඩි පීඩනයක්. සිංහල බෞද්ධ සමාජයට විජාතික බලපෑම පළමු ව ඉස්මතු වූයේ 1505දී පෘතුගීසි ආගමනයෙන් හා ඉන්පසු 1658 සිට ඇරඹි ලන්දේසි පාලනයෙන්. වර්ෂ 1796 සිට ඇරඹි බ්‍රිතාන්‍ය පාලනය අන්

සියලු යුරෝපා බලව්‍යාප්තිකාරකයන්ට වඩා බලවත් බව පසක් කළා. ඒ, මෙවැනි මිෂනාරී ව්‍යාපාරවල කුප්‍රකටත්වය ඉතා ප්‍රබල ලෙස බෞද්ධ සිංහල සමාජයට එරෙහි ව නැගීමෙන්. ඓතිහාසික පාණදුරාවාදයට මඟ පාදන්නේ ඒ පසුබිම.


මෙරට අධ්‍යාපනයේ මූලගත පිරිවෙන් අධ්‍යාපනයට හා බෞද්ධ පාසල්වලට මිෂනාරි බලපෑම ඉතා දැඩි ව දැනුණා. මේ අවදියේ ලන්ඩන්, බැප්ටිස්ට්, වෙස්ලියන්, ඇමරිකානු, චර්ච් වැනි සමාගම් තරගකාරී ව හැසිරුණේ බුදු දහම වළකා කිතු දහම පැතිරවීමට. ක්‍රිස්තියානිවරු බෞද්ධයන් ව ස්වකීය ලබ්ධි වෙත හරවා ගැනීමට විවිධ උපායමාර්ග භාවිත කළා. බෞද්ධයන් වැඩිපුර ගැවසෙන තැන්, විහාරස්ථාන ආදිය ආශ්‍රිත ව ඔවුන් දේශන පැවත්වූවා. ක්‍රිස්තියානි පූජකවරුන් තැන නොබලා කරන ලද දේශනා ප්‍රසිද්ධ වාද බවට පෙරළුණේ ඒ අනුව. බද්දේගමවාදය (1865) වරාගොඩවාදය(1865) උදන්විටවාදය(1866) ගම්පොළවාදය (1871) පාණදුරාවාදය(1873) යන පංච මහා වාද ඇතුළත් වාද සමූහයක් බොහෝ තැන්වල ඇති වුණා.





චීනයේ මින් අධිරාජයා

මෙරට උරුම, ලෝකයේ මතක පිළිබඳ ජාත්‍යන්තර ලැයිස්තුවට ඇතුළත් කිරීම සඳහා වූ ජාතික කමිටුවේ ප්‍රධානී මහාචාර්ය බී. ඩී. නන්දදේව; "පාණදුරාවාදයට මූල බීජය වැපිරෙන්නේ 1873 දාවිත් සිල්වා පාදිලිතුමා බුදු දහමට නිගරු වන ලෙස කළ ප්‍රකාශයක්. පසුව එයට පිළිතුරු දේශනාවක් ද පාණදුර ගල් කන්දේ විහාරස්ථානයේදී (වත්මන් රන්කොත් විහාරස්ථානයේ) පැවැත්වුණා. මේ අවස්ථා පදනම් කරගෙනයි දෙපාර්ශ්වය ම මුහුණට මුහුණලා වාදයක් පැවැත්වීම ගැන ක්‍රිස්තියානිවරු ඉල්ලීමක් කරන්නේ. ක්‍රිස්තියානි පක්ෂයෙන් කරන ලද, එම වාද ආරාධනා පත්‍රය මේ ලෝකයේ මතක පිළිබඳ ජාත්‍යන්තර ලැයිස්තුවට ඇතුළත් වුණා. එය ක්‍රිස්තියානි නායකයන් වන පීටර් ඩැනියෙල් හා මැතිව්ස් සුවාරිස් ගුණවර්ධන යන අය 1873 ජූනි මස ජෙරමියස් දියෙස් හා කොරලිස් පෙරේරා කරුණාරත්න යන බෞද්ධ නායකයන් වෙත ලියූවක්. එම ඇරයුම පරිදි ක්‍රිස්තියානි පක්ෂය වෙත යැවූ බෞද්ධ පිළිතුරු ලිපිය ද පාණදුර රන්කොත් විහාරස්ථාන ලේඛන සංරක්ෂණ භාරයේ පවතිනවා."



මිගෙට්ටුවත්තේ ගුණානන්ද
හිමි පිළිරුව


පාණදුරාවාදය 1873 අගෝස්තු 26 හා 28 දෙදිනයි පැවැත්වුණේ. වාදයේදී බෞද්ධ පක්ෂය වෙනුවෙන් පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද නාහිමියන් කතා කළ අතර ක්‍රිස්තියානි පක්ෂය වෙනුවෙන් දාවිත් සිල්වා සහ එෆ්. එස්. සිරිමාන්න යන පූජකයන් කතා කළා. මෙහිදී ගුණානන්ද නාහිමියන් බයිබල් පාඨ ගෙනහැර දක්වමින් කළ වියත් දෙසුම් හා තර්ක බිඳීම් ඒ ඉදිරිපිට සිටි දහස් සංඛ්‍යාත පිරිසකගේ ප්‍රීතියට හේතු වුණා. පාණදුරාවාදයේ කතා ඒ මොහොතේ ම එම ස්ථානයේදී ම පිටපත් කිරීම සුවිශේෂයි. අතින් පිටපත් කළ එම ලේඛන ද ලෝක මතක ලැයිස්තුවට අන්තර්ගත කළ බව මහාචාර්ය නන්දදේව පෙන්වා දුන්නා.

පාණදුරාවාදය නිම වීමෙන් පසු ඒ පිළිබඳ විස්තර වාර්තා හා ග්‍රන්ථ කිහිපයක් ම පළ වී තිබෙනවා. වාදයේ කතා එඩ්වඩ් පෙරේරා විසින් ඉංග්‍රීසි බසින් පිටපත් කළ අතර ගාල්ලේ ජේ. එම්. පීබල්ස්ගේ සංස්කරණයෙන් නිකුත් වූ The grate debate Buddhism and Christianity face to face නම් පාණදුරාවාද කෘතිය බොහෝ රටවල ප්‍රචලිත වුණා. විශේෂයෙන් එංගලන්තය, ඇමරිකාව වැනි රටවල. හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා ලංකාවට පැමිණෙන්නේ ද එම පාණදුරාවාද පිටපතක් ඇමරිකාවේදී කියවීමට ලැබීමෙන්. පාණදුරාවාදය සම්බන්ධ තවත් කෘති ද උගත් බුද්ධිමත් බොහෝ අයගේ අවධානයට ලක් වූයේ ආගම් භේදයකින් තොර ව.

ලෝකයේ මතකය පිළිබඳ ජාත්‍යන්තර ලැයිස්තුවේ යළි ශ්‍රීලංකාවේ නාමය සනිටුහන්වීම අපේ මුතුන්මිත්තන් සේ ම ප්‍රෞඪ ඉතිහාසය අභිමානවත් කළ සංසිද්ධියක්. එය රටේ අනාගතය වෙත කෙසේ ප්‍රක්ෂේපණය කර ගන්නේ ද යන්නයි රාජ්‍යයේ වගකීම.

# පලස්තීන සිනමාව

කථිකාචාර්ය
**මනීෂ දුක්ගන්නාරාළ**







හනි ජව්හාරියේෂ්, සලහා මෙර්සල්, මුස්තාපා අබු අලි ඇතුළු නිර්මාණකරුවන් පිරිසකගේ ප්‍රයත්නයක් මත පාඨා ව්‍යාපාරය (නිල පලස්තීන ජාතික විමුක්ති ව්‍යාපාරය, පලස්තීන ජාතිකවාදී සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂය) පලස්තීන චිත්‍රපට ඒකකය පිහිටුවීමත් සමඟ විප්ලවීය පලස්තීන චිත්‍රපට නිෂ්පාදනය ආරම්භ වී තිබෙනවා. 1973දී තනි චිත්‍රපටයක් නිෂ්පාදනය කළ පලස්තින විමුක්ති සංවිධානයේ (PLO) පර්යේෂණ මධ්‍යස්ථානයට සම්බන්ධ වූ පලස්තීන චිත්‍රපට සමූහය පිහිටුවීමට මේ ඒකකය උපකාරි වුණා.

එම නිර්මාණය ගාසා තීරයේ වෙඩි තබා ගැනීමේ දර්ශන, ගාසා තීරයේ නගර, ගම් සහ කඳවුරුවල කටුක යථාර්ථ පිළිබඳ පලස්තීන චිත්‍රපට අධ්‍යක්ෂ මුස්තාපා අබු අලි විසින් කරනු ලැබූ වාර්තා චිත්‍රපටයක්. 1971 ගිම්හානයේදී පලස්තීන හමුදා ජෝර්දානයෙන් පිට ව ගිය පසු මුස්තාපා අබු අලි 'ආත්මය සහ රුධිරය සමඟ' නැමැති චිත්‍රපටය නිෂ්පාදනය කළේ 1970 සැප්තැම්බර් මාසයේ ලේ වැගිරුණු සිදුවීම් සජීවී වාර්තාමය දර්ශන ඔස්සේ සහ ඇතැම් දර්ශන නිර්මාණාත්මක ව රූගත කරමින්.

පලස්තීන චිත්‍රපට සමූහය විසින් පසුව එහි නම පලස්තීන චිත්‍රපටය ලෙස වෙනස් කරනු ලැබුවා. පලස්තීන සිනමා ආයතනය PLOහි ඒකාබද්ධ තොරතුරු කාර්යාලයේ කොටසක් ලෙස එයට දායක වූ සිනමාකරුවන් අතර මුස්තාපා අබු අලි, සමීර් නිමේර්, කසීම් හවාල් සහ රශ්මි අබු අලි සුවිශේෂ වුණා. අනෙකුත් සිනමා කණ්ඩායම් මතු වුණේ පලස්තීන විමුක්තිය සඳහා වූ ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ තොරතුරු දෙපාර්තමේන්තුවේ කලා කමිටුවේ කොටසක් ලෙස. ඒ සඳහා රෆීක් හජ්ජර් විසින් 1973දී දෙපාර්තමේන්තුවේ පළමු චිත්‍රපටය අධ්‍යක්ෂණය කළා. පලස්තීන විමුක්තිය සඳහා වූ ජනප්‍රිය පෙරමුණේ කලාත්මක කමිටුවඃ කාසිංහවාල් එහි පළමු චිත්‍රපටය අධ්‍යක්ෂණය කළේ 1972දී. අධ්‍යක්ෂ ජිබ්‍රිල් අවාඩ් ද ඒ සඳහා දායක වුණා. 1972දී PLOහි සංස්කෘතික හා තොරතුරු දෙපාර්තමේන්තුවේ කුයිස් අල් සුබාහිඩ් චිත්‍රපටයක් නිර්මාණය කරමින් දේශපාලනික දෘෂ්ටිවාදය ඉදිරියට ගෙන ගියා. 1980දී 'කටුකම්බි ඉඩම' 1984දී පලස්තීනයඃ මිනිසුන්ගේ වාර්තාව වැනි චිත්‍රපට නිර්මාණය කර තිබෙනවා.

1970 ගණන්වල පලස්තීන චිත්‍රපට නිෂ්පාදන අංශය ගොඩනැගීමේ පළමු අදියරේදී විවිධ පලස්තීන ප්‍රතිරෝධ කණ්ඩායම් සහ PLOහි සංස්කෘතික හා තොරතුරු දෙපාර්තමේන්තුව අතර ඇතිවූ මත ගැටුම් හේතුවෙන් චිත්‍රපට නිෂ්පාදනය ඛණ්ඩනය වුණා. එම දශකයේ නිෂ්පාදනය කරන ලද මුළු චිත්‍රපට සංඛ්‍යාව විවිධ මාතෘකා යටතේ බිහි වූ වාර්තා චිත්‍රපට 50කින් පමණ සමන්විත වුණා. ගාසාන් කණෆානි (Ghassan Kanafani) විසින් රචිත නවකතාවක් පදනම් කරගෙන කසීම් හවාල් ( Qasim Hawal) විසින් නිර්මාණය කරන ලද 'හයිෆා වෙත නැවත යන්න' (Return to Haifa) නැමැති එක ම වෘත්තාන්ත චිත්‍රපටය නිර්මාණය කළේ 1982දී. එසේ ම පලස්තීන සිනමා සඟරාවේ කලාප කිහිපයක් ද පළ වුණා. මේ ඛණ්ඩනය නිසා චිත්‍රපට සඳහා යෙදු වූ පිරිවැය සොච්චම් වූ අතර නිර්මාණාත්මක ගුණය උසස් තත්ත්වයේ පැවතියේ නැහැ. එසේ වුවත් මේ චිත්‍රපටවලින් සමහරකට ලයිප්සිග් උලෙළ සහ මොස්කව් සිනමා උලෙළ වැනි ජාත්‍යන්තර උත්සව නියෝජනය කිරීමට හැකි වුණා.

> චිත්‍රපට නිෂ්පාදනයේ දෙවැනි අදියරේදී නිෂ්පාදනය කරන ලද බොහෝ පලස්තීන වෘතාන්ත චිත්‍රපට සිනමා උලෙළහි සාර්ථක වූ අතර බොහෝ රටවල වාණිජ සිනමාහල්වල ද ප්‍රදර්ශනය වුණා. පළමු අදියරේදී මෙන් නොව බොහෝ ආයතන චිත්‍රපට නිෂ්පාදනය කිරීම ධනාත්මක සාධකයක් වූයේ එය පලස්තීන කතානාද චිත්‍රපට බිහිවීමට සහ ඒවායේ සාර්ථකත්වයට දායක වූ බැවින්.

නිෂ්පාදන උත්සාහය ඒකාබද්ධ කිරීම සඳහා PLOහි සංස්කෘතික හා තොරතුරු දෙපාර්තමේන්තුව සිනමා ඇකඩමියක










ස්වරූපය ගන්නා පලස්තීන චිත්‍රපට නිෂ්පාදනය සඳහා පොදු ආයතනයක් පිහිටුවීමට යෝජනා කළා. ඉන් බලාපොරොත්තු වූයේ PLOහි සියලු ම පලස්තීන කණ්ඩායම්වල දෙපාර්තමේන්තු න්‍යෂ්ටියකට කේන්ද්‍රගත කිරීමත් ස්වාධීන නීතිමය හැකියාවක් සහිත ව සහ යම් නිශ්චිත පිරිවැයක් සිනමා කර්මාන්තයට යෙදවීමෙන් දෘෂ්ටිවාදාත්මක ව ඔවුන්ගේ පරිකල්පනීය ලෝකය අත්පත් කර ගැනීමට උත්සාහ කිරීමත්. සංස්කෘතික හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අබ්දුල්ලා හුරාණි එම යෝජනාව ඉතා උද්‍යෝගයෙන් සම්මත කළ අතර ආයතනයට අතුරු ව්‍යවස්ථා සැකසීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කෙරුණා. PLOහි විධායක කමිටුව වෙත මේ යෝජනාව ඉදිරිපත් කෙරුණේ එහි අතුරු ව්‍යවස්ථා සහ අයවැය අනුමත කිරීම සඳහා. එහෙත් විධායක කමිටුව ඊශ්‍රායලය විසින් ලෙබනනය ආක්‍රමණය කරනු ලැබීම තෙක් යෝජනාව පිළිබඳ සාකච්ඡාව කල් දැමුවා. එහි ප්‍රතිඵලයක් ලෙස PLO සහ පලස්තීන කණ්ඩායම් ලෙබනනයෙන් ඉවත් වුණා.

චිත්‍රපට නිෂ්පාදනයේ දෙවැනි අදියරේදී නිෂ්පාදනය කරන ලද බොහෝ පලස්තීන වෘතාන්ත චිත්‍රපට සිනමා උලෙළහි සාර්ථක වූ අතර බොහෝ රටවල වාණිජ සිනමාහල්වල ද ප්‍රදර්ශනය වුණා. පළමු අදියරේදී මෙන් නොව බොහෝ ආයතන චිත්‍රපට නිෂ්පාදනය කිරීම ධනාත්මක සාධකයක් වූයේ එය පලස්තීන කතානාද චිත්‍රපට බිහිවීමට සහ ඒවායේ සාර්ථකත්වයට දායක වූ බැවින්. එම චිත්‍රපටවලින් පලස්තීන අනන්‍යතාව පිළිබඳ ගැටලුව ලෝකයට ගෙන යාමට අධ්‍යක්ෂවරුන් ක්‍රියා කිරීම මුල්වරට සිදු වුණා. ඒ අතර ප්‍රධාන වුණේ මයිකල් ක්ලේයිෆි, එලියා සුලෙමන්, රහිඩ් මෂාරවි සහ හනි අබු අසාද්.


මයිකල් ක්ලේයිෆි නසාරදෙහි ජීවත් වූ, බෙල්ජියමේ අධ්‍යාපනය ලැබූ පලස්තීන ජාතිකයෙක්. ඔහු බෙල්ජියම් අධ්‍යක්ෂවරයකු වූ අන්ද්‍රේ දාටෙවෙල්ලෙ සමග එක් ව බෙල්ජියම් රූපවාහිනිය විසින් නිෂ්පාදනය කරන ලද චිත්‍රපට හතරක් අධ්‍යක්ෂණය කිරීමෙන් ඔහුගේ කලා ජීවිතය ආරම්භ කළා. 1987දී ඔහු විසින් අධ්‍යක්ෂණය කරන ලද 'ගලිලියේ විවාහ මංගල්‍යය' (Wedding in Galilee) නම් චිත්‍රපටය ඊශ්‍රායල හමුදා ආණ්ඩුකාරවරයා සහ ඔහුගේ නිලධාරීන් සහභාගි වූ පලස්තීන ගම් ප්‍රධානියකුගේ පුතකුගේ විවාහ මංගල්ල උත්සවය පිළිබඳ වූ කතාවක්. පලස්තීන, බෙල්ජියම්, ජර්මානු, ප්‍රංශ, බ්‍රිතාන්‍ය, ඒකාබද්ධ නිෂ්පාදනයක් වූ මේ චිත්‍රපටය ත්‍යාග කිහිපයක් දිනා ගත් අතර ඒවායින් වඩාත් වැදගත් වන්නේ 1987 - කෑන්ස් උලෙළේ දිනාගත් ජාත්‍යන්තර විචාරක සම්මානය. එම චිත්‍රපටය එම වසරේ ම සෙබස්තියෙන් ජාත්‍යන්තර චිත්‍රපට උලෙළේ ගෝල්ඩන් ෂෙල් සම්මානයත් 1988 - කා තේජ් චිත්‍රපට උලෙළේ ටැනිට් ඩියෝ සම්මානයක් දිනා ගත්තා.

එලියා සුලෙයිමාන් ඇමරිකානු ජාතිකත්වයක් සහිත පලස්තීනයේ නාසරත්හි ජීවත් වන පලස්තිනයකු වන අතර ඔහු සිය චිත්‍රපට දිවිය ආරම්භ කළේ ජූසි සැලෝම් විසින් සම අධ්‍යක්ෂණය කරන ලද 'Introduction to the End of an Argument' නම් කෙටි චිත්‍රපටයෙන්. ඔහුගේ කථානාද චිත්‍රපටය වූ 'අතුරුදහන්වීමේ වංශකථාව' වස්තු විෂය කර ගත්තේ ඊශ්‍රායල පුරවැසියන් වන පලස්තීන අරාබිවරුන්ගේ අනන්‍යතා ගැටලු ආමන්ත්‍රණය කිරීමට. එම චිත්‍රපටය වැනීසියේ චිත්‍රපට උලෙළේදී හොඳ ම පළමු චිත්‍රපටයට හිමි ත්‍යාගය ඇතුළු සම්මාන කිහිපයක් දිනාගත්තා. 2002 වසරේදී ඔහු 'දිව්‍යමය මැදිහත්වීම' නම් චිත්‍රපටය නිර්මාණය කරමින් කෑන්ස් චිත්‍රපට උලෙළේදී ජූරියේ විශේෂ සම්මානය දිනාගත්තා. එසේ ම ඔහුගේ තුන් වැනි නිර්මාණය වූයේ 2009 වසරේදී නිෂ්පාදනය කළ The Time that Remains නැමැති චිත්‍රපටය. විචාරකයන් අතර ඇති එකඟතාවනම් මේ චිත්‍රපට තුන ඔස්සේ සුලෙයිමාන් අරාබි චිත්‍රපට නිෂ්පාදනයේ ආඛ්‍යාන තාක්ෂණය සහ සිනමා ශෛලියේ මෙන් ම සිනමා භාෂාවේ ගුණාත්මක පිම්මක් පැන ඇති බව. එයින් පලස්තීන අනන්‍යතාව පිළිබඳ විස්තර හෙළි කර එහි ගමන් මග අනුගමනය කිරීමට ලෝකයට ම මං හෙළි කර ඇති බව ද සඳහන්. එසේ ම ඔවුන් වැඩිදුරටත් සඳහන් කරන්නේ 1970 ගණන්වල පලස්තීන සිනමාකරුවන් විසින් තමන්ගේ නිර්මාණවල යොදා ගන්නා ලද විප්ලවවාදී වාචාල කතාවලට වඩා පොහොසත් සිනමා භාෂාවක් එලියා සුලෙයිමාන් නිර්මාණය කළ බව.




# අපේ 10ක් ඔක්ස්ෆර්ඩ්

**නුවන් කුමාර කටුගම්පල**




ශ්‍රී ලංකාවේ සිංහල සහ දෙමළ ඇතුළු අනෙකුත් ප්‍රාදේශීය භාෂාවලින් බිඳී විත්, එනම් ශ්‍රී ලාංකික සම්භවය සහිත දැනට භාවිතයේ පවත්නා වචන අතරින් 10ක් නොබෝදා මහා බ්‍රිතාන්‍යයේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය ප්‍රකාශයට පත් කරන ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂයට (OED) ඇතුළත් කෙරුණා. ඒවා හඳුන්වන්නේ 'ශ්‍රී ලාංකික ඉංග්‍රීසි (SLE)' නමින්. මෙසේ ඇතුළත් කර ඇත්තේ ශ්‍රී ලංකා දූපත් රාජ්‍යයේ වාසය කරන ඒ ඒ ප්‍රජාව විවිධ සංසිද්ධි හඳුන්වමින් ගොතා ඇති භාෂාමය වදන්වලින් ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට ඇතුළත් කිරීමට සැලකිල්ලට භාජනය කිරීම සඳහා යොමු කර තිබූ වදන් අතුරින් තෝරා ගත් 10ක්. මෙය ශ්‍රී ලංකාවේ දේශීය යථාර්ථය පිළිබිඹු කරමින් ගෝලීය භාෂාවක් නියෝජනය කිරීමට මෙරටට ලැබුණු මහඟු අවස්ථාවක්.

ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ ප්‍රමුඛ විශේෂත්වය වන්නේ බොහෝ ශබ්දකෝෂවල මෙන් වසර ගණන් යාවත්කාලීන නොවී පවතින්නේ නැති ව වරින්වර නව වදන්වලින් යාවත්කාලීන වීම සහ එහි අන්තර්ගත වදන් නිරතුරු නැවත නැවත සලකා බැලීම. නිතර මාරු වීම, මිශ්‍ර වීම, වෙනස් වීම, අනුවර්තනය වීම, වෙනත් භාෂාවලින් අහුලා ගැනීම සහ ඉබේ එකතු වීම වැනි වූ අනෙකුත් භාෂාමය ලක්ෂණවල සහ විශේෂයෙන් වදන්වල ස්වභාවය නිසා නැවත සංස්කරණයේ වටිනාකම ප්‍රබල වනවා.

විවිධ රටවල, විවිධ මූලාශ්‍ර ඔස්සේ ඕනෑ ම ආකාරයකින් ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ නිරීක්ෂණ ලැයිස්තුවට, එනම් එහි දත්ත පද්ධතියට වදන් ඇතුළත් කෙරෙනවා. ඒ, එම වදන් මූලික සහ උසස් පියවර කිහිපයක් ඔස්සේ සංස්කාරක මණ්ඩල ගණනාවක අවධානයට ලක්වෙමින් දීර්ඝ සහ සංකීර්ණ ක්‍රියාවලියක් ඔස්සේ අනුමත වීමෙන් පසු. මෙසේ වරින් වර ලෝක ඉංග්‍රීසි යාවත්කාලීන කිරීම ඔක්ස්ෆර්ඩ් සම්ප්‍රදායක්. මෙහිදී සිදු කෙරෙන්නේ අදාළ රට විසින් යෝජනා කරනු ලබන වදනක් ශබ්දකෝෂයට ඇතුළත් කර අර්ථදැක්වීම වැනි සරල කාරණාවක් නොව එකී වදනට අදාළ සම්පූර්ණ ජීවිත කතාව පර්යේෂණාත්මක ව සහ විශ්ලේෂණාත්මක ව සොයාගෙන විස්තරාත්මක අර්ථ දැක්වීමක්. එහිදී දැනට භාෂාව භාවිත කරන ආකාරය වාර්තා කිරීමක් සිදු කෙරෙන අතර එය වදනේ නිවැරදිභාවය පිළිබඳ ලබාදෙන ජාත්‍යන්තර තක්සේරුවක් හෝ ඇගයීමක් වන්නේ නැහැ.

ලොව ප්‍රධානතම අන්තර්ජාතික භාෂාව වන්නේ ඉංග්‍රීසි. යටත්විජිතවාදීන්ගේ ග්‍රහණයේ පසුවූ කල පටන් මේ දක්වා ඉතිහාසමය, භාෂාමය සහ දේශපාලනමය බලපෑම්වල ප්‍රතිඵල ලෙස වර්ධනය වූ මෙරට භාෂා භාවිතයේ පශ්චාත් යටත්විජිත අනන්‍යතාවක ලක්ෂණ පෙන්වනවා. මේ භාෂා ඉටු කරන්නේ රටේ

අන්තර් පුද්ගල සන්නිවේදනයේ සැලකිය යුතු කාර්යභාරයක්. ඒ ඒ ජනවර්ගවල අනන්‍යතාවේ සලකුණු ද එහි වනවා. ශ්‍රී ලාංකික බර්ගර් වැනි ජාතිකයන් සිය මව් බස ලෙස ඉංග්‍රීසි සැලකූවත් ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂාව හඳුන්වන්නේ 'සන්ධාන භාෂාව' යනුවෙන්. සිංහල භාෂාව සිංහල ජනයාගේ මව් භාෂාව ලෙස සලකන අතර දෙමළ භාෂාව දෙමළ සහ මුස්ලිම් ජනතාවගේ මව් භාෂාව ලෙස සලකනවා.


2025 ජූනි මාසයේදී ශබ්දකෝෂය යාවත්කාලීන කරන විටයි, අප අද අවධානයට යොමුකරන වදන් ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂයට එක් ව තිබෙන්නේ. මෙය ශ්‍රී ලාංකික ඉංග්‍රීසි භාෂාවේ ආරම්භය හා පරිණාමය විමර්ශනාත්මක ව අගය කරමින් අපේ රට සම්බන්ධයෙන් අන්තර්ජාතික ව කළ සැලකිය යුතු පිළිගැනීමක්.

මෑතකදී ඊට ඇතුළත් කළ පළමු ලාංකික ඉංග්‍රීසි වචනය ලෙස සැලකෙන්නේ (Asweddumize (අස්වෙද්දුමයිස්)'. එහි අර්ථය ලෙස දක්වා ඇත්තේ වී වගාව සඳහා ඉඩම් සකස් කිරීම (To prepare (fallow or disused land) for cultivation, esp. for the growing of rice.) යන්න. මෙය ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කතිකාවේ දිගු කලක් භාවිත වූ වදනක්. එය ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට ඇතුළත් කළ ශ්‍රී ලාංකික ඉංග්‍රීසි පද අතර එක ම ක්‍රියාපදය ද වනවා.

නව එකතු කිරීම්වල කැපී පෙනෙන වදනක් වන්නේ 'Kottu roti (කොත්තු රොටි)' යන්න. කුඩා කොටස්වලට කැඩුණු රොටි, මස්, එළවළු සහ කුළුබඩුවලින් සමන්විත ජනප්‍රිය වීදි ආහාරයක් ලෙස පිළිගැනෙන එය උණුසුම් ව පිළියෙල කිරීම, රස සහ සුවඳ, රිද්මයානුකූල ව සුවිශේෂ තලයකින් කපමින් නිකුත් කරන ශබ්දය නිසා වඩාත් ප්‍රසිද්ධ වූ ආහාරයක්. (A Sri Lankan dish consisting of pieces of roti, meat and vegetables, mixed with spices and curry sauce and chopped by cleavers as they are cooked on a griddle. This dish is typically associated with the distinctive sound of the cleavers hitting the griddle as it is prepared by roadside vendors.)


සිංහල සම්භවයක් සහිත පොල් සහ කුළුබඩු මිශ්‍ර කර සැහැල්ලුවෙන් පිසින ලද කැඩුණු හරිත ආහාරයක් (Lightly cooked shredded (often leafy green) vegetables mixed with fresh grated coconut, chilli and other spices, served as a side dish, salad or condiment as part of a typical Sri Lankan meal.) යනුවෙන් අරුත් ගැන්වෙන 'Mallung (මැල්ලුන්)' යන්න ද සිංහල සහ හින්දු අලුත් අවුරුදු සමයේදී සාම්ප්‍රදායික ව නැකතට අනුභව කරන, එළකිරි හෝ පොල් කිරි යොදා පිසින බත් (A Sri Lankan dish made with rice cooked in coconut milk and formed into a block, typically sliced into diamond-shaped pieces and traditionally eaten at the Sinhala and Tamil New Year and at ceremonial or other special occasions. Kiribath is often served with various types of onion relish or alternatively, sweetened with jaggery.) යනුවෙන් තේරුම දෙන 'Kiribath (කිරිබත්)' යන්න ද OEDහි අලුතින් ඇතුළත් කළ වදන්.


සාම්ප්‍රදායික ආහාර, චාරිත්‍ර වාරිත්‍ර සහ ක්‍රීඩාවලින් සමන්විත ව අප්‍රේල් මාසයේදී උත්සවශ්‍රීයෙන් සමරන ශ්‍රී ලාංකික සංස්කෘතියේ ප්‍රමුඛතම ජාතික සැමරුම් මංගල්‍යය වන සිංහල සහ දෙමළ අලුත් අවුරුද්ද (The first day of the Sinhala and Hindu New Year, occurring on the spring equinox. Also (a period of celebration marking the start of the Sinhala and Hindu New Year, typically lasting for seven to ten days. The date of the festival is determined by the solar calendar and usually falls around 14 April.) යනුවෙන් හඳුන්වන 'Avurudu (අවුරුදු)' යන වදන ද එහි යොදා තිබෙනවා.



'Watalappam (වටලප්පම්)' යන්න ද OEDහි ඇතුළත් කළ තවත් වදනක්. මෙය එහි අරුත් ගන්වන්නේ පොල් කිරි, හකුරු සහ කුළුබඩුවලින් සාදන මුස්ලිම් ජාතිකයන් විසින් හඳුන්වාදෙන ලද ප්‍රධාන අතුරුපසක් (In Sri Lankan cookery (a custard made from coconut milk (or sometimes condensed milk), cashew nuts, eggs, and spices such as cardamom and cloves, sweetened with jaggery and traditionally eaten by Sri Lankan Muslims during celebrations marking the end of Ramadan.) යනුවෙන්.

පෘතුගීසි ආභාසය සහිත ව පැවතෙන ප්‍රචලිත වේග රිද්ම සංගීත ප්‍රභේදයක් (An uptempo style of popular music originating in Sri Lanka and combining infliences from both Africa and Europe, typically played in 6-8 time, with a syncopated rhythm and often associated with weddings and other celebrations. Also (a style of dance performed to this music. Types of baila music are also popular in Goa and in the city of Mangaluru, on Indiazs west coast.) ලෙස සඳහන් වන 'Baila (බයිලා), ක්‍රිකට් තරග, ප්‍රාසංගික අවස්ථා යනාදියේදී බොහෝ විට සජීවී ව වැයෙන පිත්තල ලෝහය පාදක සංගීත භාණ්ඩවලට මුල්තැන දෙන සංගීත ශෛලියක් (A genre of Sri Lankan music usually played at cricket and other sports matches, characterized by lively rhythms and typically featuring instrumentation of trumpet, saxophone, trombone and snare and bass drums. Often (and earliest) as a modifier, esp. in papare band, papare music.) යන අරුතින් ඇතුළත් කළ 'Papare (පපරේ)' යන ශ්‍රී ලාංකික වදන් ද දැන් OEDහි අන්තර්ගතයි.






ශ්‍රී ලංකාවේ වතු ප්‍රදේශවල ප්‍රධාන නිවස්නය වන, සාමාන්‍ය නිවසකට වඩා සුඛෝපභෝගී නිමාවක් සහිත මන්දිරයක් (A mansion or manor house¦ the principal house of an estate.) ලෙස හැඳින්වෙන 'Walawwa (වලව්ව)', සිංහල කාන්තාවන් අඳින සාම්ප්‍රදායික සාරි වර්ගයක් ද සුවිශේෂ අලංකාර සහිත ඇඳුම් විලාසිතාවක් (A type of sari traditionally associated with Sinhalese women of Sri Lanka, draped by wrapping around the waist, creating a distinctive frill around the midriff, and pinning the end over the left shoulder. Also known as the Kandyan sari.) ද වන 'Osari (ඔසරි)' යන වදන් ද ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂයට ඇතුළත්කර තිබෙනවා.

මීට අමතර ව OEDහි පොරොත්තු ලේඛනයේ තවත් ශ්‍රී ලාංකික වදන් කිහිපයක් ඇතුළත් ව තිබීම ද ඒවා සමීක්ෂණය වෙමින් පැවතීම ද ශ්‍රී ලාංකිකයාට සතුටු විය හැකි කාරණා.

—

සුන්දර විවේකයකට

# ඔරිගමි කලාව

කථිකාචාර්ය
**එරෝමි ආරියරත්න**

ගරි හතරැස් කඩදාසි කොළයක් විවිධ අතට නැමීමෙන් පමණක් ම අපූරු ද්විමාන හා ත්‍රිමාන හැඩතල නිර්මාණය කිරීම හා රසවිඳීම 'ඔරිගමි කලාව' ලෙස හැඳින්වෙනවා. ජපන් ජාතිකයන් කලාවක් ලෙස වැඩිදියුණු කළ මේ කඩදාසි නැවීමේ කලාව එහි ඇති අපූර්වත්වය හා විශ්මයජනක ප්‍රතිලාභ නිසා වර්තමානය වන විට ලොව ඉතා ජනප්‍රිය විනෝදාංශයක් බවට පත් ව අවසන්.

සාමාන්‍ය කඩදාසි කලාවෙන් වෙනස් වන සාම්ප්‍රදායික ඔරිගමි කලාවේ නිර්මාණ





කිරීම සඳහා කතුරු, ගම් හෝ ටේප් වැනි කිසිදු උපකරණයක් භාවිත කරන්නේ නැහ. හතරැස් කඩදාසියක් පියවර දෙකකින් නැවීමෙන් වුවත් සරල ඔරිගමි

**නැවීමේ පියවර මතක තබා ගැනීමට දරුවා නිරායාසයෙන් උත්සාහ කරන බැවින් ඔවුන්ගේ මානසික ඒකාග්‍රතාව රඳවා ගත හැකි, මතක ශක්තිය වර්ධනය කරන උපක්‍රමයක් ලෙසත් ඔරිගමි කලාව යොදා ගත හැකියි. විශේෂයෙන් පෙර පාසල් දරුවන් මේ කලාවට යොමු කිරීමෙන් විශේෂ ප්‍රතිඵල රාශියක් ලබා ගැනීමට හැකියාව ලැබෙනවා.**



නිර්මාණයක් කළ හැකියි. පියවර ගණන වැඩිවන තරමට පරිසරයේ ඇති ඕනෑ ම හැඩතලයක ස්වාභාවික ස්වරූපය ඒ ආකාරයෙන් ම ප්‍රතිනිර්මාණ කළ හැකි වීම මෙහි විශේෂත්වයක්. නමන පියවර කල්පනාකාරී ව ක්‍රමවත් ව නැමීමෙන් නිර්මාණය ගොඩනැගෙන බැවින් මේ මොහොතේ මනස රඳවා තබාගෙන ඵලදායී ලෙස සිතීමත් අභ්‍යාස කරවීමට නූතනයේ විවිධ රටවල ඔරිගමි කලාව ප්‍රචලිතව යොදා ගැනෙනවා.

ඔරිගමි යනු ජාමිතියයි. ජාමිතික හැඩතල පිළිබඳ පැහැදිලි අවබෝධයක් හා මනා ප්‍රායෝගික පුහුණුවක් ද මෙයින් දරුවන්ට ලැබෙනවා. කොළය නැමීමේදී ඇඟිලි තුඩු තෙරපීමට භාජනය වන නිසා මොළයට







ඔක්සිජන් සැපයීම ක්‍රමවත් වී, මොළයේ සෛල උත්තේජනය වීමෙන් දරුවාගේ බුද්ධි වර්ධනය දියුණු කරන අභ්‍යාස ලෙස ද ඔරිගමි හඳුන්වන්නට පුළුවන්.

නැවීමේ පියවර මතක තබා ගැනීමට දරුවා නිරායාසයෙන් උත්සාහ කරන බැවින් ඔවුන්ගේ මානසික ඒකාග්‍රතාව රඳවා ගත හැකි, මතක ශක්තිය වර්ධනය කරන උපක්‍රමයක් ලෙසත් ඔරිගමි කලාව යොදා ගත හැකියි. විශේෂයෙන් පෙර පාසල් දරුවන් මේ කලාවට යොමු කිරීමෙන් විශේෂ ප්‍රතිඵල රාශියක් ලබා ගැනීමට හැකියාව ලැබෙනවා.

නූතන සමාජය ඩිජිටල් තිරය හා සමාජ මාධ්‍ය අධිභාවිතය හේතුකොටගෙන තවදුරටත් සංකීර්ණ වෙමින් පවතින බව කවුරුත් දන්නා කරුණක්. විශේෂයෙන් දරුවන්ගේ මනසට මෙයින් එල්ලවන විඩාව හා අහිතකර බලපෑම් සුළුපටු නැහැ. අනෙක් කලා මෙන් ඔරිගමි කලාවට ද බොහෝ අමුද්‍රව්‍ය අවශ්‍ය නැහැ. හරි හතරැස් කඩදාසියක් ඇත්නම් ඕනෑ ම මොහොතක, ඕනෑ ම තැනක හිඳ යම් නිර්මාණයක් සාදා රස විඳිය හැකියි.

ඩිජිටල් තිරය වෙතින් මදක් ඈත්කොට, දරුවාගේ නිර්මාණාත්මක කුසලතා වර්ධනය කිරීමට මේ සුන්දර කලාව අගනා ආදේශකයක් ලෙස යොදාගත හැකිනම් දරුවන්ගේ ලෝකය තවත් බොහෝ සුන්දර වනු ඇති.

# රාජ්‍ය සේවා තරග විභාග අත්වැල

# නිවාඩු ගැන ටිකක් - 03




ඉදිරිපත් කිරීම

**නාලක දිසානායක**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු) මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය හා අධ්‍යක්ෂ (පාලන) වැ.බ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව


රාජ්‍ය සේවයේ රාජකාරි ඉටු කිරීමේදී මෙන් ම මේ දිනවල අයදුම්පත් කැඳවා ඇති කළමනාකරණ සේවා නිලධාරීන්ගේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය ආදි විභාග සඳහාත් උපකාරී වන ‘දෙසතිය’ විභාග අතවැලෙන් පසුගිය කලාපවල දිගුවක් ලෙස ‘නිවාඩු’ සම්බන්ධ ව තවත් කරුණු ටිකක් මෙවරත් සාකච්ඡා කිරීමට අදහස් කෙරේ.

**1. කුලවද්දාගත් දරුවකු හදා වඩා ගැනීම වෙනුවෙන් රාජ්‍ය නිලධරයකුට නිවාඩු ලබා දීම කෙසේ සිදු කරයිද?**

ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයට මෑතකාලීන ව එකතු වූ සංශෝධනයක් වන මෙය 2023.05.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2023 මගින් මේ හා සම්බන්ධ විධිවිධාන ආයතන සංග්‍රහයේ 18 වගන්තියට ඇතුළත් කර ඇත. ඒ අනුව මාස 10ට අඩු වයසැති දරුවකු කුලවද්දාගැනීම වෙනුවෙන්, අදාළ දරුවා කුලවද්දා ගත් දින සිට මාස 03ක් ඇතුළත කුලවද්දාගත් දරුවකු හදා වඩා ගැනීම වෙනුවෙන් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරියකුට දින තුන (03)ක පීතෘත්ව නිවාඩු ලබා ගත හැකි ය. ඒ සඳහා දරුවාගේ උප්පැන්න සහතිකය හා දරුවා කුලවද්දාගැනීමට පවත්වන ලද නඩුවෙහි තීන්දු ඉදිරිපත් කළ යුතු ය. මෙම ආකාරයෙන් ලබාදෙන නිවාඩුව විශේෂ නිවාඩුවක් ලෙස හැඳින්වේ. දරුවකු කුලවද්දාගැනීම වෙනුවෙන් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරිනියකට උපරිම මාස හතර (04)ක විශේෂ නිවාඩුවක් අඛණ්ඩ ව ලබා ගැනීමට පුළුවන. ඒ සඳහා ද කුලවද්දාගන්නා දරුවා මාස 10ට වඩා අඩු වයසැති දරුවකු විය යුතු අතර පෙර පරිදි ම දරුවාගේ උප්පැන්න සහතිකයේ සත්‍ය පිටපත් හා දරුවා නීත්‍යානුකූල ව ලබා ගැනීමට අදාළ කටයුතු ඉටු කර තිබීම හෝ ඒ සම්බන්ධ අධීක්ෂණ ක්‍රියාමාර්ගවලට හෝ එළඹ තිබිය යුතු ය.

ඉහත පරිදි නිලධාරිනියකට ලබා ගත හැකි අඛණ්ඩ මාස හතර (04)ක නිවාඩුව රාජ්‍ය සේවයේ නිලධාරිනියගේ සේවා තත්ත්වය අනුව පහත පරිදි වේ.

සාමාන්‍ය රාජ්‍ය නිලධාරිනියකට ඉහත මාස හතර (04)ක නිවාඩුව ආයතන සංග්‍රහයේ පරිදි හිමි අනියම් නිවාඩු හා විවේක/අසනීප නිවාඩු, ඉකුත් නිවාඩු, අඩ වැටුප් නිවාඩු හා ආයතන සංග්‍රහය පරිදි හිමි වැටුප් රහිත නිවාඩු යන නිවාඩු වර්ගවලින් අනුපිළිවෙළට එම මාස හතර (04)ක කාලය ආවරණය කර ගත හැකි ය. ආයතන සංග්‍රහයේ ගුරුවරියකට ලබා ගත හැකි නිවාඩු සම්බන්ධ ව දක්වා ඇති විධිවිධාන පරිදි ගුරුවරියකට මෙම නිවාඩු ආවරණය කර ගත හැකි අතර පොලිස් සැරයන්වරියකට හෝ කොස්තාපල්වරියකට හිමි විවේක නිවාඩු, ඉකුත් නිවාඩු, අඩ වැටුප් නිවාඩු හා වැටුප් රහිත නිවාඩු යන නිවාඩුවල අනුපිළිවෙළින් එම නිවාඩු ආවරණය කර ගත හැකි ය. මේ හා සම්බන්ධ ව වැඩිදුර විස්තර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2023 අධ්‍යයනය කිරීමෙන් ලබා ගැනීමට හැකියාව ඇත.

**2. රජයේ විභාග සඳහා පෙනී සිටීමට ලබාදෙන නිවාඩු හා සම්බන්ධ විධිවිධාන මොනවාද?**

තමා රාජ්‍ය සේවයට ඇතුළත් වූ පසු ඔහු හෝ ඇය පෙනී සිටින සෑම විභාගයකට ම ඒ ආකාරයෙන් විශේෂ නිවාඩු ලබා දීමක් සිදු කරන්නේ නැත. උදාහරණයක් ලෙස යම් රාජ්‍ය නිලධරයකු සිය වෘත්තීය ඉදිරි ගමන වෙනුවෙන් ලියන තරග විභාග ආදී සෑම විභාගයක් වෙනුවෙන් ම විශේෂ නිවාඩු ලබා දීමක් සිදු නොවේ. එහෙත් රාජකාරීමය අවශ්‍යතාව මත, එසේ නැතහොත් සේවා ව්‍යවස්ථා, බඳවාගැනීමේ පටිපාටි ආදියෙහි සඳහන් විධිවිධාන පරිදි සම්පූර්ණ කළ යුතු යම් සුදුසුකමක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් එම විභාගයට පළමු වතාවට පෙනී සිටීමේදී පමණක් රාජකාරි නිවාඩු ලබා දීමට ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 19 වගන්තිය පරිදි විධිවිධාන ඇත. උදාහරණ ලෙස කාර්යක්ෂමතා කඩඉම් විභාග, දෙවන භාෂා අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා වන විභාග ආදිය මෙහිදී පෙන්වා දිය හැකි ය. මෙහිදී මතක තබා ගත යුතු කරුණ වන්නේ මේ වෙනුවෙන් ගමන් වියදම් හෝ සංග්‍රහ වියදම් ලබා දීමක් සිදු නොවන බවයි. කාර්යක්ෂමතා කඩඉම් විභාග හා දෙපාර්තමේන්තු පරීක්ෂණ යනු එකක් නොව දෙකක් බව ද අවබෝධ කර ගැනීම වැදගත් වේ.

ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයට මෑතකාලීන ව එකතු වූ සංශෝධනයක් වන මෙය 2023.05.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2023 මගින් මේ හා සම්බන්ධ විධිවිධාන ආයතන සංග්‍රහයේ 18 වගන්තියට ඇතුළත් කර ඇත. ඒ අනුව මාස 10ට අඩු වයසැති දරුවකු කුලවද්දාගැනීම වෙනුවෙන්, අදාළ දරුවා කුලවද්දා ගත් දින සිට මාස 03ක් ඇතුළත කුලවද්දාගත් දරුවකු හදා වඩා ගැනීම වෙනුවෙන් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරියකුට දින තුන (03)ක පීතෘත්ව නිවාඩු ලබා ගත හැකි ය. ඒ සඳහා දරුවාගේ උප්පැන්න සහතිකය හා දරුවා කුලවද්දාගැනීමට පවත්වන ලද නඩුවෙහි තීන්දු ඉදිරිපත් කළ යුතු ය. මෙම ආකාරයෙන් ලබාදෙන නිවාඩුව විශේෂ නිවාඩුවක් ලෙස හැඳින්වේ.

**3. යම් නිලධරයෙකු 'අනිවාර්ය නිවාඩු යැවීම' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?**

කිසියම් රාජ්‍ය නිලධරයකු තමන්ගේ නිල සේවයේ/තනතුරේ රාජකාරි කටයුතු ඉටු කරගෙන යාම පොදු යහපත පිණිස හේතු නොවේයැයි වෛද්‍ය නිර්දේශය මත හෝ වෙනත් විශේෂ හේතුවක් මත සලකා බලන අවස්ථාවකදී නිලධරයා අනිවාර්ය නිවාඩු යැවීමට පත් කිරීම් බලධරයාට හැකියාව ඇත. ඒ සම්බන්ධ ව ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 20 වැනි වගන්තියෙහි විධිවිධාන දැක්වේ. මේ ආකාරයෙන් අනිවාර්යෙන් නිවාඩු යැවීමේදී යම් නිලධරයකු එසේ අනිවාර්ය නිවාඩු යැවුණු දා සිට පළමු ව නිලධරයාගේ ඉතිරි නිවාඩුවලින්, ඉන්පසුව ඔහු හෝ ඇය සම්බන්ධ ව අවසන් තීරණය ගන්නා තුරු ඉතිරි කාලය සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලෙසත් සැලකීම සිදු වේ.

**4. රාජ්‍ය නිලධරයකුට අඩ වැටුප් නිවාඩු කොපමණ ලබා ගත හැකිද?**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2022හි සංශෝධිත ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 21 වැනි වගන්තියෙහි විධිවිධාන ද සැලකිල්ලට ගත් කල නිලධරයකුට ඔහුගේ හෝ සිය කලත්‍රයාගේ හෝ දරුවකුගේ අසනීපයක් වෙනුවෙන් තමන්ගේ සාමාන්‍ය නිවාඩු අවසන් වූ විටෙක අඩ වැටුප් නිවාඩු ලබා ගත හැකි ය. එහිදී කනිෂ්ඨ හෙවත් වර්තමානයේ ප්‍රාථමික ශ්‍රේණියෙහිලා සැලකෙන නිලධරයකු හැර සාමාන්‍ය රාජ්‍ය නිලධරයකුට සිය සේවා කාලයෙන් 1/6ක අඩ වැටුප් හිමිකම පවතින අතර එහිදී එක් වරකට උපරිම මාස 12ක් දක්වා අඩ වැටුප් ලබා ගත හැකි ය. පෙර කී කනිෂ්ඨ සේවකයන් වසර පහ (05)ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විටෙක ඉහත පරිදි අඩ වැටුප් නිවාඩු අවසන් වන්නේනම් වසරකදී එක් මාසයක් අඩ වැටුප් ලබා දීමට හැකි ය. තව ද අඩ වැටුප් කාලයෙන් අඩක් සේවා කාලයකට ගණන් ගැනෙන අතර සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දින යම් නිලධරයකුගේ අඩ වැටුප් කාලයට අයත් වන්නේනම්, එකී දින ද අඩ වැටුප් බවට පත් වේ.

**5. රජයේ නිලධරයකු ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙළෙන විටෙක විශේෂ නිවාඩු ලබා දෙයි. එම ලෙඩ වර්ග හා ලබාදෙන නිවාඩු කාල සීමාව කෙසේ වේ ද?**

රාජ්‍ය නිලධරයකුට ආයතන සංග්‍රහයේ xiii පරිච්ඡේදයේ විධිවිධාන සපුරාලන විටෙක ක්ෂය රෝගය, ලාදුරු හා පිළිකා රෝග වෙනුවෙන් විශේෂ නිවාඩු ලබා ගැනීමට හැකියාව ඇත. එහිදී ක්ෂය රෝගය වෙනුවෙන් විශේෂ නිවාඩු ලබ ගත හැක්කේ මාස 04 බැගින් කඩින් කඩ දෙවරකි. මුල් වරට වැටුප් සහිත මාස 04ක් හා ඉන්පසුව වසර 04ක සේවා කාලයකට පසුව තවත් මාස 04ක වැටුප් සහිත විශේෂ නිවාඩුවක් ද ලාදුරු රෝගය වෙනුවෙන් මාස 22ක විශේෂ නිවාඩුවක් ද පිළිකා රෝගය වෙනුවෙන් මාස 6ක් හා පසුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2019 මගින් සිදු කළ සංශෝධනය පරිදි තවත් මාස 03ක් ද ලෙස මාස 09ක කාල සීමාවක් විශේෂ නිවාඩු ලබා දිය හැකි වේ.

ඉහත රෝග හා සමාන යැයි වෛද්‍ය මණ්ඩලය සලකන වෙනත් ඕනෑ ම රෝගයකටත් වෛද්‍ය නිර්දේශය මත සිදු කරන සැත්කමකින් පසු අවශ්‍ය රැක බලා ගැනීම සඳහාත් මාස 06ක විශේෂ වැටුප් සහිත නිවාඩු අනුමත කිරීමට ද අමාත්‍යාංශ ලේකම්වරයාට හැකියාව ඇත.

**'නිවාඩු' යනු පුළුල් මාතෘකාවකි. ආයතන සංග්‍රහයේ පෙර කී පරිච්ඡේද ආශ්‍රිත ව සඳහන් කළ විවිධ නිවාඩු අතරින් බිඳක් දෙසතිය කලාප තුනකින් අපි ඔබ වෙත ගෙන ආවෙමු. ප්‍රායෝගික ව රාජකාරි සිදු කරනවිට නිවාඩු ආශ්‍රිත ව ද විවිධ ප්‍රශ්න පැන නැගේ. එවැනි විටෙකදී හා විභාග ආදියට සූදානම් වන අය ඉහත ආයතන සංග්‍රහයේ පරිච්ඡේද, යාවත්කාලීන චක්‍රලේඛ විධිවිධාන, ලබා දී ඇති විවිධ පූර්වාදර්ශ අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වනු ඇත.**



# උණුසුමේ උණුසුම

**වර්නන් ගුණසේකර**

ගෝලීය පාපන්දු ක්‍රීඩකයන්ගේ වෘත්තීය සමිතිය වන FIFPRO, පාපන්දු සමාජ ලෝක කුසලාන තරග ආරම්භ කරන වේලාව පසුවට කල් තබන ලෙසට තරගාවලියට පෙර එම සම්මේලනයට උපදෙස් ලබා දී තිබුණ ද ලෝක පාපන්දුවේ බලධාරීන් එය ගණන් ගත්තේ නැහැ. ලබන වසරේ ලෝක කුසලාන තරග පැවැත්වීමට නියමිත නගර 16න් හයක ම අධික උෂ්ණත්වයේ අවදානම තිබෙන බවට FIFPRO අනතුරු අඟවා තිබෙනවා.

ඇමරිකාවේ මෑතකදී අවසන් වූ පාපන්දු සමාජ ලෝක කුසලාන තරගාවලියේදී (FIFA Club World Cup) පාපන්දු ක්‍රීඩාවට උෂ්ණත්වයෙන් එල්ල වුණේ දැඩි පීඩාවක්. මෙය ඇමරිකාව ලබන වසරේ ග්‍රීෂ්ම සෘතුවේ මෙක්සිකෝව හා කැනඩාවේ ද සම සත්කාරකත්වයෙන් පවත්වන ලෝක කුසලාන පාපන්දු තරගාවලියේදී ක්‍රීඩකයන් හා ක්‍රීඩාලෝලීන්ට මුහුණදීමට සිදුවිය හැකි දරන්න බැරි තරම් උණුසුමක පෙර දැක්මක්.

ලෝකයට ම බලපාන පරිදි උෂ්ණත්වය වැඩිවෙමින් තිබියදී, පාපන්දු ලෝක කුසලානය හා වෙනත් පාපන්දු තරගාවලි උතුරු අර්ධ ගෝලයේ ග්‍රීෂ්ම සෘතු කාලයේ පැවැත්වීමෙන් ක්‍රීඩකයන් හා ක්‍රීඩාලෝලීන් යන දෙපාර්ශ්වය ට ම බලපාන අනතුර ඉහළ යමින් තිබෙන බවට විද්‍යාඥයන් අනතුරු අඟවා තිබෙනවා. උෂ්ණය සම්බන්ධ රෝග අවදානම අවම කිරීමට යෝග්‍ය පරිදි පාපන්දු කැලැන්ඩරය ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය සකස් කළ යුතු ව තිබෙන බවයි බොහෝ දෙනාගේ මතය වී තිබෙන්නේ.

"දශකයේ තවත් ගැඹුරට අපි යද්දී, ශීත සෘතු මාසවල සහ සිසිල් අක්ෂාංශවල ක්‍රීඩා කිරීම වැනි වඩාත් පෙරළිකාර ක්‍රමවේද කෙරෙහි අවධානය යොමු නොකිරීමෙන් සිදුවන්නේ වඩාත් අනතුරුදායක අවදානමක් ඇති වීමයි" එංගලන්තයේ ලීඩ්ස් නුවර පිහිටි දේශගුණික අනාගතය පිළිබඳ Priestley මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මහාචාර්ය Piers Forster ප්‍රකාශ කරනවා.

"සිදුවිය හැකි ක්‍රීඩා බේදවාචකයක සිට අපි ඉන්නේ අධික තාපයෙන් යුත් කාලයෙන් එකකට පමණක් එහායින් නිසා මගේ කනස්සල්ල වැඩිවෙමින් තිබෙනවා. රටවල් පාලනය කරන අය දේශගුණය හා සෞඛ්‍ය විද්‍යාව ගැන අවධානය යොමු කරනු දැකීමට මම කැමතියි" ඔහු කියනවා.

පාපන්දු තරගාවලි ජූනි සහ ජූලි මාසවල පැවැත්වීමේ සම්ප්‍රදාය පළමු ලෝක කුසලාන පාපන්දු තරගාවලිය පැවැත්වූ 1930 වසර දක්වා ඈතට දිව යනවා. එතැන් පටන් ජූනි, ජූලි හා අගෝස්තු යන තෙමස් කාල වකවානුව ගෝලීය වශයෙන් සෙල්සියස් අංශක 1.05කින් (ෆැරන්හයිට් අංශක 1.89) උණුසුම් වී ඇතැයි ඇමරිකාවේ ජාතික සාගර හා වායුගෝලීය පරිපාලනය සඳහන් කර තිබෙනවා. මේ අතර යුරෝපීය ගිම්හානයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 1.81කින් වැඩි වී තිබෙනවා. ලෝකය උණුසුම් වීමේ වේගය වැඩිවී තිබෙන්නේ 1990 දශකයේ සිට.

මේ සාධකය කෙරෙහි පාපන්දු වැනි ඉහළ තීව්‍රතාවක එළිමහනේ ක්‍රීඩා කරද්දී විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය බව දේශගුණික විද්‍යාඥයන් පවසනවා.

"දිනකට පැය 10ක් පාපන්දු ක්‍රීඩා කරන්න අවශ්‍යනම්, එය දවසේ උදය වරුවේ මුල් පැය කිහිපය හෝ සැඳෑ කාලයේ පසුභාගයේ පැය කිහිපය විය යුතුයි" ලන්ඩනයේ Imperial විද්‍යාලයේ දේශගුණ විද්‍යාඥ Friederike Otto පවසනවා. "තාප ආඝාතයකින් ක්‍රීඩකයන් සහ ක්‍රීඩාලෝලීන් මිය යාම හෝ ඌෂ්ම අවසාදයෙන් බරපතළ ලෙස රෝගාතුර වීම දකින්න අවශ්‍ය නැත්නම් මේ වෙනසට යා යුතුයි."

කණ්ඩායම් වැඩි සංඛ්‍යාවකට ව්‍යාප්ත වෙමින් ජූනි 14 සිට ජූලි 13 දක්වා ඇමරිකාවේ නගර 11ක පැවති පාපන්දු සමාජ ලෝක කුසලාන තරගාවලියට අධික උෂ්ණත්වය මෙන් ම ගිගුරුම් සහිත කුණාටුවෙන් ද බලපෑමක් සිදු වුණා. තරගවලට අමතර විරාම, පිටිය පැත්තකින් සිට වතුර සැපයීම වැඩියෙන් සිදුකිරීම, විදුලි පංකා සහ හෙවණ වැඩියෙන් ලබා දීම මගින් ක්‍රීඩකයන්ගේ බංකු සිසිල් කරමින් ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය මේ අධික උෂ්ණාධික තත්ත්වයට හැඩගැසුණා.

එසේ තිබියදීත් චෙල්සී කණ්ඩායමේ මැද පෙළ ක්‍රීඩක එන්සෝ ෆර්නැන්ඩස්, අධික උණුසුම නිසා තරගය පැවැත්වෙද්දී තමාට කරකැවිල්ල හටගත් බව කියමින් ලබන වසරේ පැවැත්වෙන ලෝක කුසලාන තරගාවලියේදී පස්වරුවේ තරග ආරම්භ කිරීමෙන් වැළකී සිටින ලෙසට ජාත්‍යන්තර පාපන්දු සම්මේලනයෙන් ඉල්ලා සිටියා.

ඇමරිකාවේ පැවති පාපන්දු සමාජ ලෝක කුසලාන (Club World Cup) තරගාවලිය අරබයා දැඩි උෂ්ණත්වයේ අවධානය මෙසේ ඉස්මතු ව තිබියදී ලබන වසරේ එම රටේ ම පැවැත්වීමට නියමිත ලෝක කුසලාන පාපන්දු තරගාවලිය (2026 World Cup) සඳහා ආවරණය කෙරුණු ක්‍රීඩාංගණ යොදා ගන්නා බවට ජාත්‍යන්තර පාපන්දු සම්මේලනයේ සභාපති ජියානි ඉන්ෆන්ටීනෝ පවසනවා.

"අපට එල්ල වන සෑම විවේචනයක් ම අප මීළඟට කළ යුතු දේ අධ්‍යයනය කිරීමට සහ විශ්ලේෂණය කිරීම පිණිස අපට ලැබෙන මාර්ගයක්" යනුවෙන් ගෝලීය පාපන්දුවේ ප්‍රධානියා කියනවා. "තරගය අතරතුර ක්‍රීඩකයන් සිසිල් කරවන විරාමයන් ලබා දීම ඉතා වැදගත්. අපි මේ ගැන අපට කරන්න පුළුවන් මොනවාද කියා සොයා බලනවා. නමුත් අපට වහලයක් තිබෙන ක්‍රීඩාංගණ තිබෙනවා. අපි ස්ථිර ව ම ඒ ක්‍රීඩාංගණ ලබන වසරේ තරග වෙනුවෙන් පාවිච්චි කරනවා" යැයි ඉන්ෆන්ටීනෝ ප්‍රකාශ කරනවා.

මේ තීරණයට පැමිණියේ ප්‍රංශයේ පැරිස් සැන්-ජර්මැන් සහ එංගලන්තයේ චෙල්සී කණ්ඩායම් අතර ජූලි 13 දින නිව් ජර්සිහි මෙට්ලයිෆ් ක්‍රීඩාංගණයේ පැවති පාපන්දු සමාජ ලෝක කුසලාන අවසාන මහා තරගයට පෙර. උෂ්ණත්වය ෆැරන්හයිට් අංශක 83ක් ව තිබියදීයි එම තරගය ආරම්භ වුණේ. නමුත් ආර්ද්‍රතාව නිසා ෆැරන්හයිට් අංශක 91ක උෂ්ණත්වයක් පස්වරු 3.00ට තරගය ආරම්භ වන විට දැනෙමින් තිබුණා.

ක්‍රීඩා කරන විට දරාගත අපහසු මේ උණුසුම පිළිබඳ බොහෝ ක්‍රීඩකයන් ඔවුන්ගේ කනස්සල්ල පළකර තිබුණා. " ඇත්තම කියනවානම් මේ උෂ්ණය ඇදහිය නොහැකියි. එක් තරගයක් ක්‍රීඩා කරමින් සිටියදී මට කරකැවිල්ල හැදුණා. මාව ඇත්තට ම කරකැවෙනවා වගේ දැනුණු නිසා මට ක්‍රීඩා පිටියේ වැතිරී ඉන්න සිද්ධ වුණා. මෙවැනි උෂ්ණත්වයක ක්‍රීඩා කිරීම ඉතාම භයානකයි" ෆර්නැන්ඩස් මාධ්‍ය හමුවකදී කියා සිටියා.

ගෝලීය පාපන්දු ක්‍රීඩකයන්ගේ වෘත්තීය සමිතිය වන FIFPRO, පාපන්දු සමාජ ලෝක කුසලාන තරග ආරම්භ කරන වේලාව පසුවට කල් තබන ලෙසට තරගාවලියට පෙර එම සම්මේලනයට උපදෙස් ලබා දී තිබුණ ද ලෝක පාපන්දුවේ බලධාරීන් එය ගණන් ගත්තේ නැහැ. ලබන වසරේ ලෝක කුසලාන තරග පැවැත්වීමට නියමිත නගර 16න් හයක ම අධික උෂ්ණත්වයේ අවදානම තිබෙන බවට FIFPRO අනතුරු අඟවා තිබෙනවා. පාපන්දු සමාජ ලෝක කුසලාන තරගාවලියේදී ෆැරන්හයිට් අංශක 90ට (සෙල්සියස් අංශක 32ට) වැඩි උෂ්ණත්ව යටතේ ක්‍රීඩා කිරීමට ක්‍රීඩකයන්ට බල කෙරුණා.

ක්‍රීඩාලෝලීන්ට ද මේ තත්ත්වයෙන් පහසුවක් ගෙන දුන්නේ නැහැ. තරග නැරඹීමට පැමිණි ඔවුන්ගේ හිසට සෙවණක් ලබා දීමට වහලයක් තිබුණේ නැහැ






රංගිකා අබේසේකර

'Big 7 Travel' ගෝලීය සංචාරක වෙබ් අඩවිය 2025 වසර සඳහා 'ලොව වඩාත් ම සුන්දර දූපත' ලෙස ශ්‍රී ලංකාව නම් කර තිබෙනවා. ඒ, ඔවුන් විසින් වාර්ෂික ව නිකුත් කරනු ලබන ලොව සුන්දරතම දූපත් 50ට අදාළ නවතම වාර්තාවකට අනුව. ශ්‍රී ලංකාව, ප්‍රංශ පොලිනීසියාවේ Mo'orea, යේමනයේ Socotra, පෘතුගාලයේ Madeira, ඉක්වදෝරයේ The Galapagos, බහමාස්හි Great Exuma Bahamas, Seychelles, අයර්ලන්තයේ Achill Island, තායිලන්තයේ Koh Lipe, ග්‍රීසියේ Milos මේ වසරේ ශ්‍රේණිගත කිරීම්වල ඉහළින් ම සිටින දූපත් 10 වනවා.

ලෝකයේ සංචාරක ගමනාන්ත ඇතුළත් මේ ලැයිස්තුවෙන් 2025 වසරේදී ගවේෂණය කිරීමට ඇති සුවිශේෂ දූපත් අත්දැකීම් සහ ආකර්ෂණීය ස්ථාන ඇගයීමට ලක් කරනවා. එම ශ්‍රේණිගත කිරීම්වලට අනුව නව ප්‍රවණතා සහිත ගමනාන්ත, දුරස්ථ නිවාඩු නිකේතන සහ ජනප්‍රිය ස්ථාන රැසක එකතුවක් මේ වෙබ් අඩවියෙන් පෙන්වා දෙනවා. පෙර මාධ්‍ය ප්‍රතිඵල, Big 7 Travel කතෘ මණ්ඩල කණ්ඩායමේ දායකත්වය, සමාජ මාධ්‍යවල ජනප්‍රියතාව, ලෝකයේ සංචාරක ගමනාන්තවල ජනප්‍රියත්වය මත පදනම් වූ ලකුණු එකතුවකට අනුවයි මේ තෝරාගැනීම් ලැයිස්තුව සකස් කර ඇත්තේ. මෙහිදී ශ්‍රී ලංකාවේ වෙරළ තීරය, කඳුකරය, ඓතිහාසික උරුම ඇතුළු සුවිශේෂ කරුණු මත පදනම් වෙමින් ශ්‍රී ලංකාව ලොව සුන්දරතම දිවයින ලෙස තෝරාගත් බවයි Big 7 Travel වෙබ් අඩවිය වාර්තා කරන්නේ.




දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත
Department of Government Information
news.lk
GFU Sri Lanka
Rs. 100/-